ගරු කථානායකතුමනි, 1969-70 ආදායම් වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අයවැය ලේඛනය සාකච්ඡාවට භාජන වෙමින් පවතින මේ අවස්ථාවේ, නොකඩවා දිගටම අයවැය ලේඛන පහක් ඉදිරිපත් කරන්නට අවකාශ ලැබීම ගැන ගරු මුදල් ඇමතිතුමාට කාගේත් ප්‍රීතිය පළ කරන්නට යෙදුණා. මේ අවස්ථාවේ ඒ කාරණය සම්බන්ධයෙන් මගේත් ප්‍රීතිය ප්‍රකාශ කිරීම මගේ යුතුකමකැයි මා කල්පනා කරනවා. ඒ අතරම තවත් එක් කාරණයක් සඳහන් කරන්නට ඕනෑ. අක්මීමන ගරු මන්ත්‍රීතුමා මට පෙර කථා කරමින් එක් පාර්ලිමේන්තු වාරයක් තුළ අයවැය ලේඛන පහක් ඉදිරිපත් කළ එකම ආණ්ඩුව වර්තමාන ආණ්ඩුව බව ප්‍රකාශ කළා. ඒ ප්‍රකාශය වැරදියි. 1960 දී බලයට පැමිණි සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ ආණ්ඩුව අයවැය ලේඛන පහක් මේ ගරු සභාවට ඉදිරිපත් කළා. ඒ පහ මේ ගරු සභාවේදී සම්මත වුණා. හැබැයි ඒ අයවැය ලේඛන පහම ඉදිරිපත් කරන ලද්දේ එකම මුදල් ඇමතිවරයකු විසින් නොවෙයි. වෙනස ඒකයි. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ ආණ්ඩුව අයවැය ලේඛන පහක් මේ ගරු සභාවට ඉදිරිපත් කළා. ඒවා මේ ගරු සභාවේදී සම්මත වුණා. මේ ආණ්ඩුවත් ඒ වාගේම අයවැය ලේඛන පහක් ඉදිරිපත් කළා. දැන් සාකච්ඡා කරගෙන යන්නේ පස්වැනි අයවැය ලේඛනයයි. වෙනසකට තිබෙන්නේ ඒ ආණ්ඩුවේ අයවැය ලේඛන පහ එකම මුදල් ඇමතිවරයකු විසින් ඉදිරිපත් කරනු නොලැබීමත්, මේ ආණ්ඩුව ඉදිරිපත් කළ අයවැය ලේඛන පහම එකම මුදල් ඇමතිවරයකු විසින් ඉදිරිපත් කරනු ලැබීමත් බව කියන්නට ඕනෑ. වෙනස එපමණයි. ඒ නිසා ඒ ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙහි දෙවැනි කොටස වැරදි හැඟීමකින් කරන ලද ප්‍රකාශයක් බව මා කියනවා. එය පෙන්වාදීම මගේ යුතුකමකැයි මා කල්පනා කරනවා.

1969-70 අයවැය ලේඛනය සලකා බලන මේ අවස්ථාවේ පළමුවෙන්ම එම අයවැය ලේඛනය ඉදිරිපත් කරන්නට හේතු වූ පසුබිම කුමක්දැයි කල්පනා කළ යුතුව තිබෙනවා. මොහොතකට පෙර අක්මීමන ගරු මන්ත්‍රීතුමාත් ප්‍රකාශ කළා වාගේ ගරු මුදල් ඇමතිතුමාත්, ගරු අග්‍රාමාත්‍යතුමාත්, ඒ දෙපොළම ඇතුළත් කැබිනට් මණ්ඩලයත් මේ රටේ ජනතාව අද වාසය කරන්නේ බොහොම සැපසේ ජීවත් වන යුගයකැයි තීරණයකට බැස සිටිතැයි මට හිතෙනවා. අපේ රටේ පොදු ජනතාව මීට පෙර කවදාවත් අද තරම් සැපෙන් ජීවත් වුණේ නැතැයි ගරු අගමැතිතුමා මෙදා රාජාසන කථා විවාදයේ අවසාන දවසේ කථා කරමින් ප්‍රකාශ කළා. මිනිසුන්ට අද ඕනෑ තරම් මිල මුදල් තිබෙනවාය; ඒ නිසා බඩු මිල ඉහළ ගියාට කමක් නැහැ, ආදි වශයෙන් එතුමා එදා ප්‍රකාශ කළා. අද මේ රටේ ජනතාව ඒ නිසාම මුදල් ඉතිරි කරන බවත් ගරු අගමැතිතුමා කියා සිටියා. මේ තරම් හොඳට කන, බොන, අඳින, පළඳින, සැපසේ ජීවත් වන, මුදල් ඉතිරි කරන යුගයක් අපේ රටේ කවදාවත් තිබුණේ නැතැයි එතුමා තව දුරටත් ප්‍රකාශ කළා. අපේ අධ්‍යාපනය හා සාංස්කෘතික කටයුතු භාර ගරු ඇමතිතුමාත් මේ ප්‍රකාශයම ලංකාවේ හුඟක් තැන්වලදී කර තිබෙනවා. ඒ අනුව අපට පැහැදිලි ලෙස පෙනී යන්නේ ගරු ඇමතිතුමාගේ මේ අයවැය ලේඛනය සකස් කිරීමේදී ඊට පසුබිම වී තිබෙන්නේ ගරු අගමැතිතුමා ඇතුළු ආණ්ඩුවේ මැති ඇමතිවරුන් පෙන්වා දෙන, මා ඉහත විස්තර කළ පසුබිම බවයි. මේ රට සංවර්ධනය කරනවාය කියමින් ඊට බෙහෙවින් උපකාරී වූ ගොවීන්ට ස්තුතියක් පමණක් කර, මඟ හැර ගියේ ඒ නිසයි. උන්නැහේලා කල්පනා කරගෙන සිටින්නේ ගරු ඇමතිවරුන් වැනි උදවිය ජීවත් වන්නා වාගේ යස ඉසුරින් මේ රටේ සෙසු ජනතාවත් ජීවත් වෙනවාය කියලයි. එහෙම හිතාගෙනයි මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අයවැය ලේඛනය සකස් කර තිබෙන්නේ. බැංකුවල ඉතිරි කර තිබෙනවාය කියනා මුදල් ගැන කල්පනා කරන විට පමණක් එහි තත්ත්වය පැහැදිලි වෙනවා.

ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තාව ටිකක් කියවා බලමු. මේ ආණ්ඩුවේ තමුන්නාන්සේලා වැඩියෙන්ම සංවර්ධනය වුණාය කියන්නේ 1968 අවුරුද්දේ නොවැ. ඒ අවුරුද්ද සම්බන්ධයෙන් බැංකු වාර්තාවේ ඇති කරුණු මොනවාද? මම එක් වගන්තියක් පමණක් කියවන්නම්. ඒ ගැනත් වැඩි විස්තරයක් කරන්නට වුවමනා කරන්නේ නැහැ. එයින්ම තත්ත්වය ඉතා හොඳින් පැහැදිලි වෙනවා. 1968 වර්ෂය සඳහා නිකුත් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවේ 3 වැනි පිටුවේ මෙසේ තිබෙනවා :

"1968 දී ලංකාව ඇගේ ආදායම් ඉක්මවා වියදම් කර තිබේ."

මම අක්මීමන ගරු මන්ත්‍රීතුමාගේ දැන ගැනීම සඳහා ඒ කොටස තවත් වරක් කියවන්නම්.

"1968 දී ලංකාව ඇගේ ආදායම් ඉක්මවා වියදම් කර තිබේ. පාරිභෝජනය හා ආයෝජනය වෙනුවෙන් කරන ලද මුළු වියදම, නිෂ්පාදනය කළ භාණ්ඩ හා සේවාවල අගය සියයට 3.6 ඉක්ම විය. මෙම හිඟය පියවා ගනු ලැබුයේ, විදේශීය ණයගැති භාවය වැඩිකර ගැනීමෙන් හා විදේශාධාර වලිනි."

ඒ සාරාංශයෙන් පේනවා, මොකක්ද මේ රටේ සංවර්ධනය, මොකක්ද මේ රටේ මුදල් තත්ත්වය, මොකක්ද මේ රටේ ආර්ථික තත්ත්වය කියා. මිල මුදල් වැඩි වී තිබෙන වලු; සංවර්ධනය කර තිබෙනවලු. පසුගිය ආණ්ඩුව භාණ්ඩාගාරයේ මුදල් ඉතුරු කෙළේ නැතිලු. එසේ චෝදනාද කරමින් නොයෙකුත් බැංකු උපදෙස් ලබාගෙන අපේ දක්ෂ මුදල් ඇමතිවරයෙක් මහජනයාට කියන්නෙ මොකක්ද? මේ රටේ මුදල් තත්ත්වය, ආර්ථික තත්ත්වය දැන් නැඟ තිබෙනවා කියායි. එහෙත් මේ බැංකු වාර්තාව කියවන විට පෙනී යනවා, 1968 ආදායමට වඩා වියදම වැඩියි කියා. යම්තම් ණයගැති බවින් බේරී තිබෙන්නේ විදේශ ආධාර සහ විදේශ ණයවලින් බවයි එහි කෙළින්ම කියා තිබෙන්නෙ.

ඒ කාරණය අපට දැන්මම පැහැදිලි වෙනවා. ඒ මොකද? දැන් මේ ගරු සභාවේ අයවැය ලේඛනය සාකච්ඡා කරන අවස්ථාව වන තුරුත් ගරු මුදල් ඇමතිතුමා විදේශ විනිමය අයවැය ලේඛනයක් ඉදිරිපත් කර නොතිබීමයි. එය ඉදිරිපත් කළ විට මුදල් අමැතිතුමා අපට නොපෙන් වන රහස්, වසා තිබෙන රහස් එළි වන නිසයි. විදේශ විනිමය අයවැය ලේඛනය ඉදිරිපත් කළ විට මේ රටේ ණයගැති භාවය කොපමණද, මොන අන්දමින් මේ රට අධිරාජ්‍යවාදී රටවලට බැඳී විකිණී තිබෙන වාද කියා හෙළිදරව් වන නිසා එය මේ ගරු සභාවට ඉදිරිපත් කිරීමට ගරු මුදල් ඇමතිතුමා උත්සාහයක් දරා නැහැ. [බාධාකිරීම්] මොකටද මුදල් ඇමතිතුමනි, මේ අයවැය විවාදයෙන් පසුව ඉදිරිපත් කිරීමේ ඇති ඵලය? එය ඉදිරිපත් කළ යුත්තේ මෙම විවාදය පටන්ගන්න පෙරයි. පසුව ඉදිරිපත් කිරීමෙන් ප්‍රයෝජනයක් නැහැ. අපට ඒ ගැන කල්පනා කරන්න, එය විවේචනය කරන්න, ඉඩක් දෙන්න ඕනැ. තමුන්නාන්සේලා ප්‍රජාතන්ත්‍රවාදීය කියා ගන්නාට මදි. ඒ ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වෙන්න ඕනැ. විදේශ විනිමය අයවැය ලේඛනය පසුව ගේනවාය කීමෙන් ඇති වැඩක් නැහැ. එය මේ ගරු සභාවට කරන නින්දාවක් හැටියටයි හඳුන්වන්නට සිද්ධ වී තිබෙන්නෙ.

මහ බැංකු වාර්තාවෙන් තවත් වගන්තියක් මම කියවන්නම්. 23 වෙනි පිටුවේ මෙසේ සඳහන්ව තිබෙනවා:

"කෙසේ වෙතත් ගෙවුම් ශේෂ තත්ත්වය රුපියල් අනුව බලන කල 1968 දී 1967 දී තරම් වාසි සහගත නොවුණත් ඩොලර් අනුව බලන කල දියුණුවක් පෙනුණි."

රුපියල් අනුව බලන කල පාඩුයි. ලාබ ලැබී තිබෙන්නේ ඩොලර් අනුවයි. ඒ කියන්නේ ඇමෙරිකාව කල්පනා කරන හැටියට නම් මේ රටේ ලාබයක් තිබෙනවා. මුදල් ඇමතිතුමා කල්පනා කරන්නේත් ඇමෙරිකාව කල්පනා කරන්නා වාගෙයි. ඩොලර් අනුව බලන කල ලාබයි. රුපියල් අනුව බලන කල පාඩුයි, ණයයි. ඒකයි තත්ත්වය. ඒ නිසා ඒ ගැන වැඩියෙන් මා කරුණු දක්වන්න ඕනැ නැහැ. ඒ පිළිබඳ කරුණු රාශියක් සවිස්තරව කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (පී. බී. ඉලංගරත්න මයා.) විසින් මේ ගරු සභාවට ඉදිරිපත් කළා. එහෙත් අප දැනගත යුතු එක් කරුණක් තිබෙනවා. රටට ඉසිලිය හැකි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

තත්ත්වයකිනුයි ණය විය යුත්තෙ. ඉසිලීමට බැරි ප්‍රමාණයට ණය වුණොත් කවදා හෝ විපාක විඳින්න සිදු වෙනවා. එක ආණ්ඩුවක් අවුරුදු 5 ක් තිබේවි. ඊට පසු තව ආණ්ඩුවක් බලයට ඒවි. ඒකත් ගියාට පසු තවත් ආණ්ඩුවක් ඒවි. එහෙත් රට දිගටම පැවතගෙන යා යුතුයි. අපේ ජීවිතය ඒ තරම් දිග එකක් නොවෙයි. මිනිසුන් උපදිනවා, මැරෙනවා. ඒක ස්වභාව ධර්මයයි. නමුත් රට දිගටම පැවතගෙන යනවා. එනිසා රට පැවතගෙන යන්න ඕනෑ නම්, රටේ අනාගතයට ඔරොත්තු දෙන ප්‍රමාණයටයි අප ණය විය යුත්තේ.

අපි උදාහරණයක් වශයෙන් ගත්තොත්, කුඹුරක් කොටන්න කෙනෙක් ණය වුණාට කමක් නැහැ. එයින් වී ලැබෙනවා, ආදායමක් ලැබෙනවා. එයින් ණය ගෙවන හැකියි. එහෙත් නිකම් සිටින මිනිහෙක් කෑම කන්න, කරවල කන්න, ණය වෙනවා නම් ඒ ණය වීමෙන් සංවර්ධනය වන්නේ වැසිකිළිය මිසක් රට නොවෙයි. දැන් මුදල් ඇමතිතුමා වැඩි හරියක් ණය වී තිබෙන්නේ වාහනවලට, කෑම බීම යන දේවලට, පිටි වැනි ආහාර ද්‍රව්‍ය වලට. ඒවායින් රටක් සංවර්ධනය වෙන්නෙ නැහැ. රටට ආදායමක් උපදින්නෙ නැහැ. එයින් සිදු වන්නේ ජාතිය අමාරුවේ වැටීමයි. කර්මාන්ත ඇමතිතුමා කර්මාන්ත සංවර්ධනය සඳහා යන්ත්‍ර සූත්‍ර ගෙන්වන්නට ණය වෙනවා නම් ඒ ගැන වරදක් කියන්න අපට බැහැ. ඒ මක් නිසාද? ඒ කර්මාන්තයෙන් යම් කිසි දෙයක් උපද්දවන නිසයි; යම් කිසි ආදායමකුත් ලබාගෙන රට ඉදිරියට යන නිසයි. ඒවායින් කවදා හෝ ආදායමක් ලැබෙන නිසා ඒ ආදායමෙන් ණය ගෙවන හැකියි. එහෙත් මේ ණය ලබාගෙන තිබෙන්නේ ආදායම් උපද්දවන දෙයක් සඳහා නොවෙයි: වැසිකිළි තර කිරීම සඳහායි. ජාතියකට මේ වගේ බරක් උසුලන්න පුළුවන් වෙයිද? තමුන්නාන්සේලා සංවර්ධනය ගැන ලොකුවට කථා කරනවා. පසු ගිය අවුරුදු 4 කුත් මාස ගණන ඇතුළත තමුන්නාන්සේලා සංවර්ධන ව්‍යාපාර කීයක් ඇති කර තිබෙනවාද? අපේ රජය තිබුණු කාලයේ අපි සංවර්ධන ව්‍යාපාර රාශියක් ආරම්භ කළා. හැබැයි ඒවා ආරම්භ කළ අවස්ථාවේදී ඒවායින් ලාභ ඉපදුණේ නැති බව ඇත්තයි. කොයි ආයතනයද පටන් ගත් හැටියේම ලාභ උපදවන ආයතනය? ක්‍රම ක්‍රමයෙන් ආයතන දියුණු වන්ට ඕනෑ ඒවායින් ආදායම් ලැබෙන්න. ඒ කර්මාන්ත ආරම්භ කිරීමට රජය ලබා ගත් යම් ණයක් ඇත්නම් ඒවා අද උපදින ලාභවලින්, ඉතිරිවන විදේශ විනිමයෙන් ගෙවන්න පුළුවන්කම තිබෙනවා. එහෙත් එදිනෙදා වියදමට ණය මුදල් යෙදවීමෙන් ප්‍රයෝජනයක් නැහැ.

අපේ රජය මගින් ඇති කරන ලද ස. තො. ස., රක්ෂණ සංස්ථාව වැනි ආයතනවලින් අයවැය හිඟය පියවා ගන්න ණය ලබා ගන්නට අද තමුන්නාන්සේලාට සිදු වී තිබෙනවා. ඒක වැරදි යයි අපි කියන්නෙ නැහැ. රජය කොයි පැත්තෙන් හෝ රටේ මුදල් ඉතිරිවන සංස්ථා ඇති කර, ඒ ඉතිරි කර ගන්නා මුදල්වලින් ආණ්ඩුව ගෙන යාමේ කිසි වරදක් නැහැ. එහෙත් ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරුන් විරුද්ධ පාර්ශ්වයේ සිටි කාලයේදී එහෙම කිව්වෙ නැහැ. අපි සංස්ථා පිහිටුවා රජයේ මුදල් විනාශ කරනවාය, හැම එකක්ම රාජ්‍ය අංශයට ගන්නට එපාය, කියායි, තමුන්නාන්සේලා අපට එදා උපදෙස් දුන්නේ. එහෙත් අද තමුන්නාන්සේලා වැටෙන්නට යන වෙලාවේ බේරී සිටින්නේ ඒවායේ එල්ලීමෙනුයි. එක්තරා කටයුත්තක් සඳහා රුපියල් දෙකෝටියක් ස. තො. ස. ආයතනයෙන් ලබා ගැනීමට මුදල් ඇමතිතුමා තීරණය කර තිබෙනවා. ගරු කථානායකතුමනි, ස. තො. ස. ආයතනයේ මුදල් වෙනත් කටයුතු සඳහා යෙදවීමේදී ඒ පිළිබඳ ගැසට් නිවේදනයක් පළ කර, ඒ නිවේදනය මේ ගරු සභාවට ඉදිරිපත් කර, මේ සභාවේ අනුමැතිය ඇතිව එය කළ යුතු බව රජය මේ ගරු සභාවට ඉදිරිපත් කළ සමුපකාර තොග වෙළඳායතන සංශෝධන පනතේ සඳහන් වී තිබුණා. ඒ විධියේ කටයුත්තක් මීට පෙර කළා. ඒ සඵසලෙහි ස. තො. ස. මුදල් යෙදවීමයි. දැන් මම මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නට කැමතියි, ගැසට් නිවේදනයක් නිකුත් නොකර, මේ ගරු සභාවේ අනුමැතිය නොලබා ස. තො. ස. ආයතනයේ මුදල් වලින් රුපියල් ලක්ෂ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

360 ක් හෝටලයක් ඉදි කිරීම සඳහා යොද වන්නට කැබිනට් මණ්ඩලය තීරණය කර තිබෙන බව. ඒ අනුව මේ රුපියල් ලක්ෂ 360 හෝටලයක් ඉදි කිරීම සඳහා වැය කරන්නට ඊස්ට් ඉන්දියා නමැති සමාගම සමග සාකච්ඡා කරන ලෙස රාජ්‍ය ඇමතිතුමා ස. තො. ස. ට නියෝග කර තිබෙනවා. කෝ, හැසට් නිවේදන? කෝ, මේ ගරු සභාවේ අවසරය? පනතේ තිබෙන්නේ එහෙමයි. කැබිනට් මණ්ඩලය මේ නීති විරෝධී ඉල්ලීම අනුමත කර තිබෙනවා. වහාම ඊස්ට් ඉන්දියා සමාගම සමග සාකච්ඡා කර වැඩ පටන් ගන්නා ලෙස රාජ්‍ය ඇමතිතුමා නියෝග කර තිබෙනවා.

ආණ්ඩුවේ ඉලක්කම් නම් බොහොම ලස්සණයි. මෝස්තරවලට අනුව ලස්සණට හදනවා. මිනිසුන්ට වුවමනා කරන්නේ මේ ඉලක්කම් මෝස්තර නොවෙයි. මුදල් ඇමතිතුමා ගිය අවුරුද්දට වැඩිය හොඳ ඉලක්කම් මෝස්තරයක් මේ අවුරුද්දෙ හදනවා. අවුරුදු පතා මෝස්තර අළුත් කර නවා. එහෙත් මෝස්තර හැදීමෙන් රටේ ආර්ථික ප්‍රශ්න විසඳෙන්නෙ නැහැ. ලස්සණ කාන්තාවකට වුණත් දිනපතා සාරි මාරු කිරීමෙන් හැමදාම තමන්ගේ වයෝ වෘද්ධ භාවය වහ ගන්නට පුළුවන් වෙන්නෙ නැහැ. ඒ වගේ මේ ආණ්ඩුවේ බංකොලොත් භාවය මේ ඉලක්කම් මෝස්තරවලින් වහගන්ට පුළුවන් වෙන්නෙ නැහැ. —[බාධාකිරීමක්] කලින් යාර 6 ක් මදිය කියා කතිර ගැසූ අයට දැන් ලැබෙන්නෙ යාර 2 යි. යාර 2 න් මිනි ගවුම් ඇර වෙන ජාතියක් අඳින්නට බැරි බව ඇත්තයි.

ගරු කථානායකතුමනි, ගරු අගමැතිතුමාගේත්, ඇමතිවරුන්ගේත් කථා ඇත්තද කියා මා අහනවා. ජීවන වියදම කොච්චර නැග්ගත් කමක් නැතිලු; රටේ මිනිසුන්ට සල්ලි තිබෙනවලු. මේ කථා ඇත්තද? සල්ලි තියෙන්නෙ කාටද කියන එකයි ප්‍රශ්නය. ආණ්ඩු පක්ෂය පසුගිය මැතිවරණයට ආවෙ ජීවන වියදම බස්වන බවට රටට පොරොන්දුවක් දීලයි. අපි ඒවා මේ ගරු සභාවේ කොයි තරම් මතක් කළත් කිසි වැඩක් නැහැ. ඒවා ගැන තමුන්නාන්සේලා කල්පනා කරන්නෙ නැහැ. තමුන්නාන්සේලා දුන් පොරොන්දු තමුන්නාන්සේලාම දැන් අමතක කර තිබෙනවා. දීර්ඝ හා කෙටි කාලීන ක්‍රමවලින් ජීවන වියදම අඩු කරන බව තමුන්නාන්සේලා කිව්වා. මොකක්ද ඔය කෙටි කාලීන ක්‍රමය? ප්‍රථමයෙන්ම රුපියලේ මිළ සියයට 20 කින් අඩු කළා. එහි ප්‍රතිඵලය වශයෙන් බඩුවල මිළ සියයට 25 කින් නැංගා. රුපියලේ මිළ සියයට 20 කින් අඩු කරනවා යයි කියන්නේ ඉස්සර ශත 80 ට ගත් බඩුවට දැන් රුපියලක් ගෙවන්නට සිදු වීමයි. එහි තේරුම බඩු මිළ සියයට 25 කින් ඉස්සීමයි. ඔන්න රුපියලේ අගය සියයට 20 කින් අඩු කිරීමෙන් සිදු වූ ප්‍රතිඵලය. රුපියලේ අගය අඩු කිරීමෙන් තේ රබර් සහ පොල් මිළ වැඩි වන බවත්, ලෝක වෙළෙඳ පොළෙන් අපේ බඩුවලට වැඩි මිළක් ලැබෙන බවත් ගරු මුදල් ඇමතිතුමාත් අනෙකුත් ඇමතිවරුනුත් ලොකු උනන්දුවකින් ප්‍රකාශ කළා. රුපියලේ අගය අඩු නොකළහොත් ලංකාව කපෝති වන බවත්, අපේ විදේශ විනිමය රැක ගන්නට ක්‍රමයක් නැති වන බවත් තව දුරටත් ප්‍රකාශ කළා. ඉතින් අද තේ මිළ, රබර් මිළ, පොල් මිළ වැඩි වෙලාද? නැහැ, ඒවායේ මිළ තව තවත් බැහැලා. ඒවාගේම ඒ ද්‍රව්‍යවලට ලැබෙන්නේ පරණ රුපියල් නොවෙයි. අගය අඩු වූ රුපියල් තමයි, ඒවාට ලැබෙන්නේ. තේ මිළ ඉතාමත්ම නරක තත්ත්වයට පත් වෙලා. කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) කීවාක් මෙන් අරාබි රටවල් සමග ද්‍රව්‍ය හුවමාරු ක්‍රමයක් ඇති කළා නම් අපේ තේ මිල ස්ථාවර තත්ත්වයක පවත්වාගෙන යන්නට පුළුවන්කම තිබුණා. එහෙත් මේ ආණ්ඩුව ඒක කෙළේ නැහැ. මේ ආණ්ඩුවට ඒක කරන්නට බැහැ. ද්‍රව්‍ය හුවමාරු ක්‍රමයක් ඇති කළා නම් කොමිස් ලබෙන්නේ නැහැ. කොමිස් ලැබෙන්නේ කොන්ත්‍රාත් ක්‍රමයෙනුයි. මිනිසකු තව කෙනකුගෙන් රුපියල් 25 ක්, 30 ක් ගත්තොත් ඒක පගාවක් යයි කියනවා. එහෙත් කොමිස් ගැනීම පගාවක් නොවෙයිලු. ඒක සාධාරණ අයිතියක්ලු. ඒක වෙළෙඳ ව්‍යාපාරයක සිරිතක්ලු. කොමිස් ගන්න එක බිස්නස් කාරයන්ගේ සිරිතලු. ඉතින් කොමිස් ගන්නට පුළුවන් නම් රටට මොනවා වුනත් කමක් නැහැ. කොමිස් ගන්නට පුළුවන් නම් තේ මිළ බහිරව ලෝකයට ගියත් කමක් නැහැ. කොමිස්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වි. බී. එම්. හේරත් මයා.]

ලැබෙනවා නම් කොන්ත්‍රාත්තුව අත්සන් කිරීමට පෙළඹෙනවා. ඇත්තෙන්ම මේ කොමිස් ක්‍රමයට විරුද්ධව ව්‍යාපාරයක් ගෙන යන්නට අපට සිදු වී තිබෙනවා. ලැබෙන කොමිස් මුදල රජයේ භාණ්ඩාගාරයට යනවා නම් කමක් නැහැ. එහෙත් ඒ කොමිස් මුදල රජයට ලැබෙන්නේ නැහැ. දුම්රිය එන්ජින් වලින් කොමිස් ලැබෙනවා නම් එය රජයේ භාණ්ඩාගාරයට යන්නට ඕනැ. දුම්රිය එන්ජින් සඳහා කොමිස් ලැබුණාලු. එහෙත් ඒ කොමිස් මුදල් භාණ්ඩාගාරයට ලැබුණු බවක් දැන ගන්නට නැහැ. ඒ කොමිස් මුදල ලැබෙන්නේ වෙන කාටවත්. ඒක වෙනත් කාගේදෝ සාක්කුවට යනවා. ඒ බව උසාවියේදී හෙළි වී තිබෙනවා. තෙල් ගැනීම වෙනුවෙන් ලැබෙන කොමිස් මුදල් තෙල් සංස්ථාවට ලැබෙනවා නම් ඒකට කමක් නැහැ. එහෙත් ඒක වෙනත් කාගේදෝ සාක්කුවට යනවා. වෙනත් උදවියගේ සාක්කුවලට කොමිස් මුදල් යැම අගේ කොට සලකන ආණ්ඩුවකින් රටේ සංවර්ධනයක් බලාපොරොත්තු වන්නට බැහැ. රට සංවර්ධනය කරන්නට එවැනි ආණ්ඩුවකට පුළුවන්කමක් නැහැ.

රුපියලේ අගය සියයට 20 කින් අඩු කළා. ජීවන වියදම සියයට 25 කින් ඉහළ ගියා. මේ අතර ගරු මුදල් ඇමතිතුමා විසින් විදේශ විනිමය හිමිකම් සහතික ක්‍රමයක් ඇති කළා. දැන් රුපියල් 100 ක විදේශ විනිමය ලබා ගන්නට රුපියල් 155 ක් වියදම් කරන්නට ඕනැ. මේ අතර, "බඩු මිල වැඩි කළොත් බලාගෙනයි" යනුවෙන් තර්ජනත් කරනවා. ඉතින් රුපියල් 100 ක විදේශ විනිමය ලබා ගන්නට රුපියල් 155 ක් වියදම් කරන්නට සිදු වෙනවා නම් බඩු මිලෙහි අඩු වීමක් සිදු වේද? රුපියල් 100 ක විදේශ විනිමය දීම සඳහා ගරු මුදල් ඇමතිතුමා කෙළින්ම රුපියල් 55 ක් කඩා ගන්නවා. ඉතින් ඒ විදේශ විනිමය පාවිච්චි කර බඩු ගෙන්වන තැනැත්තා, අතින් පාඩු කරගෙන බඩු විකුණනවැයි සිතන්නට පුළුවන්ද? අඩු ගණනේ ඔහුට වියදම් වූ රුපියල් 155 වත් බේරා ගැනීම පිණිස ඔහු බඩුවල මිළ නියම කරනවා ඇති. රුපියල් 155 ට බඩු මිල නියම කිරීමෙන් සියයට 55 ක් ලාභයි. කවුද ඒ ලාභය ලබන්නේ? රජයයි. ඒ අනුව බලන විට ලොකුම කළුකඩකාරයා මේ ආණ්ඩුවයි. මේ ගරු මුදල් ඇමතිතුමා තමයි, ලොකුම කළුකඩකාරයා. රජය ලබා ගන්නා මේ ලාභයේ බර දරන්නට සිදු වන්නේ පාරිභෝගිකයාටයි; දුප්පත් මිනිහාටයි. මේ බර පාරිභෝගිකයා පිට පට වන්නට ඉඩ දෙන්නේ නැතැයි ගරු රාජ්‍ය ඇමතිතුමා කීවා.

හොඳයි, අලුත් අයවැය ලේඛනයේ පිරිවැටුම් බදු සංශෝධනය නිසා සිදු වුණේ මොකක්ද? "ෆෝ ඒසස්" සිගරට් නිෂ්පාදකයාට සියයට 5 ක පිරිවැටුම් බද්දක් දැම්මා. වෙළෙන්දාට සියයට 1 පිරිවැටුම් බද්දක් දැම්මා. එතකොට ඒ දෙපොළේ එකතුව 6 යි. කලින් ශත 10 ට විකුණූ "ෆෝ ඒසස්" සිගරැට්ටුවක් දැන් ශත 11 යි. එතකොට කෙළින්ම සියයට 10 ක වැඩි වීමක් නේද? ඉතින් මේ බර පැටවී තිබෙන්නේ පාරිභෝගිකයා පිට නොවෙයිද? මේ සම්බන්ධයෙන් කෙළින්ම පාරිභෝගිකයාගෙන් බද්දක් නොගන්නා බව ඇත්තයි. පිරිවැටුම් බද්ද අය කරන්නේ නිෂ්පාදකයාගෙන් සහ වෙළෙන්දාගෙන් බව ඇත්තයි. මුදල් ගෙවන්න ඕනෑ පාරිභෝගිකයායි. නමුත් අසුවල් බඩු අසුවල් ගණනට වඩා වැඩියෙන් විකුණන්න බැරිය, විකිණිය යුත්තේ මෙපමණ ගණනකටය කියා ගැසට් නිවේදනයක් නිකුත් කරන්න තරම් තමුන්නාන්සේට එඩිතරකමක් තිබුණා නම් මෙසේ මිල වැඩි වීම නතර කරන්න තිබුණා. තමුන්නාන්සේලා පාරිභෝගිකයාගෙන් බදු අය කරන්නේ නැතැයි කියනවා. ඔව්, අප පිළිගන්නවා. නමුත් රුපියල් විස්සට විකුණූ සපත්තු කුට්ටමක් සඳහා කර්මාන්ත ශාලා හිමියාගෙන් සියයට පහළොවක් අය කළාම මිළ රුපියල් විසි තුනක් වෙනවා. වෙළෙන්දාගෙන් සියයට පහක් අය කළාම එය විකුණන්නේ රුපියල් විසි හතරටයි. එතකොට සපත්තු කුට්ටමක් සඳහා රුපියල් විසි හතරක් ගෙවන්න වෙනවා. කලින් එම සපත්තු කුට්ටම මිළදී ගත්තේ රුපියල් විස්සටයි. එහෙම නම්, සපත්තු කුට්ටමක් සඳහා වැඩි මිලක් ගෙවූයේ කර්මාන්ත ශාලා හිමියාවත්, වෙළෙන්දාවත් නොවෙයි, පාරිභෝගිකයා බව අමතක කරන්න නරකයි. මෙහිදී ඉස්සර කථාවක් මට මතක් වෙනවා. "ඉබ්බත් නොකං, ඉබි මාලු කං; අතින් නොකං, පොල් කුරෙන් කං" කියන කියමනක් තමුන්නාන්සේලාගේ බදු අය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කිරීමත් එක වාගෙයි. ඉබ්බං කන්නෙ නැහැ ඉබි මාලුයි කන්නෙ. අතින් කන්නෙ නැහැ, පොල් කුරෙනුයි කන්නෙ. මහජනතාවගෙන් බදු ගන්නේ නැහැ; බදු ගන්නෙ කර්මාන්තශාලා හිමියන්ගෙනුත්, වෙළෙඳුන්ගෙනුත් පමණයි. නමුත් ඇත්ත වශයෙන් කාටද මේ බදු ගෙවන්න සිදු වී තිබෙන්නෙ? බදු ගෙවන්න සිදු වී තිබෙන්නෙ පාරිභෝගිකයන්ට බව අමුතුවෙන් පැහැදිලි කර දෙන්න වුවමනා නැහැ. නමුත් ගරු ඇමතිතුමා කියන්නෙ මොකක්ද? පාර්ලිමේන්තුව තුළදීත් කියනවා, ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙනුත් කියනවා, බඩු මිල වැඩි කරන්න දෙන්නෙ නැහැ, එසේ වැඩි කළොත් බලාගෙනයි කියා. මේවා කියන්නේ බොරුවට. දැනටම එය සිද්ධ වී අවසානයි. එතැනින්, මා පෙන්නා දුන් අන්දමට සියයට 55 ක් ඉහළ නැග්ගා. රුපියලේ අගය අඩු කිරීමෙන් සියයට විසි පහක් වැඩි වුණා. ඒ අනුව දළ වශයෙන් සියයට අසූවක් වැඩි වී තිබෙනවා. ඒ දෙකෙන් පමණක්.

ගරු කථානායකතුමනි, තමුන්නාන්සේගේ කොට්ඨාශයේ එක් පුද්ගලයකුට—එම්. අයි. ලූකස් පෙරේරා, කොරයා ඇවනිව්, හලාවත—විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර ක්‍රමය නිසා මුහුණ පාන්න සිදු වුන දෙයක් ගැනයි මා සඳහන් කරන්න යන්නෙ. ලූකස් කියන මේ මහත්මයා, ධීවර දෙපාර්තමේන්තුවෙන් තමන්ගේ යාත්‍රාවට එන්ජින් යන්ත්‍රයක් ඉල්ලුම් කළා. ගරු කර්මාන්ත ඇමතිතුමා මේ කාරණය ගැන ටිකක් සැලකිලිමත් වන ලෙස මතක් කරන්න කැමතියි. ඒ සඳහා රුපියල් 6,240 ක් ගෙවන ලෙස දැන්වීමෙන් පසුව ඒ මහතා එම මුදල ගෙව්වා ඒ අන්දමට මුදල් ගෙවා යන්ත්‍රය ලැබෙනතුරු බලාගෙන සිටින අතරතුරේදී ගරු මුදල් ඇමතිතුමාගේ විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර ක්‍රමය ක්‍රියාත්මක කරන්න පටන් ගත්තා. ඊළඟට, මෙම දුප්පත් පුද්ගලයාට, මුදල් ගෙවා මාස හයක් පමණ කාලයක් බලාගෙන සිටියාටත් පස්සෙ, එම යන්ත්‍රය ලබා දීමට නම් රුපියල් 10,103 ක් ගෙවන්නටය කියා දන්වා තිබෙනවා. කොහොමද මේ දුප්පත් පුද්ගලයා එපමණ විශාල මුදලක් ගෙවන්නෙ? යන්ත්‍රය නැතුව බෝට්ටුව පදවන්නටත් බැහැ; මාළු අල්ලන්න විධියකුත් නැහැ. තිබුණු බෝට්ටුව අබලන් වෙලා. තිබුණු ඉඩකඩම් ටික විකුණා හෝ උකස් කර, ඊට අමතර වශයෙන් ණයට මුදල් ගෙන රුපියල් 6,240 ක් ගෙවා මාස ගණනකට පස්සෙ විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර ක්‍රමය ක්‍රියාවට යෙදීමෙන් පසුව රුපියල් 10,103 ක් ගෙවන්නට යයි නියම කිරීම සාධාරණද? මේ ගැන දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් ප්‍රශ්න කළාම, දැනට සන්දේශයක් යවා තිබෙනවාය, කලින් මුදල් ගෙවූ අයට විදේශ විනිමය හිමිකම් සහතික පත්‍ර ක්‍රමය යටතේ ගෙවන්නට වන අතිරේක මුදල අයකර ගන්නේ නැතුව එන්ජින් යන්ත්‍ර ලබා දෙන්නටය කියා කැබිනට් මණ්ඩලයෙන් කියනවා නම් අප එසේ කරන්නම් කියා ඒ අය කියනවා. එන්ජින් යන්ත්‍ර ලැබී තිබුණත් කැබිනට් නියමය අනුව ක්‍රියා කරන්න ඕනෑ. මෙයින් සිදුවී තිබෙන්නෙ අර දුප්පතාට එන්ජින් යන්ත්‍රයක් නොලැබී යාමයි. ගරු ඇමතිතුමා කියන්නෙ වෙළඳුන්ටවත්, ගොවියන්ටවත්, කර්මාන්තකරුවන්ටවත්, ධීවරයන්ටත් කිසිවක් සිදු වී නැති බවයි. නමුත් ඇති වී තිබෙන තත්ත්වය ඔන්න ඔහොමයි. ගරු කථානායකතුමනි, සමහර විට 'කොරයා ඇවනිව්' කියන්නේ තමුන්නාන්සේ පදිංචි පාරට වෙන්න ඇති.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා හිතනවාද, දන්නවාද?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
මා දන්නෙ නැහැ; හිතනවා.

අක්මීමන ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා, මල නොතලා බඹරුන් රොන් ගන්නවා වාගේ ගරු මුදල් ඇමතිතුමා අය බදු අයකර තිබෙනවාය කියා. මොන මල්ද පරිස්සම් කර තිබෙන්නෙ? ධනපති මල් පමණයි පරිස්සම් කර තිබෙන්නෙ. ඒ මල්වල සිටි කුඹින් ආදී සතුන් අරගෙන ඉවතට දැම්මා. මේ අයවැය ලේඛනයෙනුත් ඒ සුවඳ මල්, ඒ ධනපති මල් ආරක්ෂා කර තිබෙනවා. ඇමතිතුමා මේ වයසෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඊ. බී. එම්. හේරත් මයා.]

දීත් මල්වලට මෙතරම් සැලකිල්ලක් දක්වන්න ඕනෑ ද ? එතුමා පරවේගෙන යන මල් නැවතත් ප්‍රකෘතිමත් කරන්න මහන්සි ගන්නවා. කැකුළු මල්වලට තැනක් දුන්නාට නම් තව කමක් නැහැ. එය ස්වභාව ධර්මයෙන් ලැබෙනවා, කවුරුත් වළක්වන්නට ගියත්. මේ එහෙම නොවෙයි, පරවුණු මල්.

පළමුවෙන්ම කළේ මොකක්ද ? ආදායම් බදු සහන දුන්නා ; බැංකු හර බද්දෙන් සහන දුන්නා ; ඉඩම් බද්දෙන් සහන දුන්නා ; සතොස වසා, සමුපකාර සංගම් වසා. වෙළඳ දායාද දුන්නා. මගේ කොට්ඨාශ යේ සමුපකාර සංගමය වසා තොග වෙළඳාම පෞද්ගලික වෙළෙන්දකුට දුන්නා. සමුප කාරය නමට පමණක්, බෝඩ් ලෑල්ලට පම ණක්, සීමා වී තියෙනවා. රාගල සමුපකාර සංගමය වසා තොග වෙළඳාම ජී. සී. එස්. ද සිල්වාට දුන්නා. උඩපුස්සැල්ලාව සමුප කාර සංගමය වසා තොග වෙළඳාම ගිල්බට් සිල්වාට දුන්නා. නිල්දණ්ඩාහින්නෙ තොග වෙළඳාම තවත් කෙනකුට දුන්නා. ධනපති පුද්ගලයන්ගේ ධනය තව තවත් තර කිරීම තමයි, තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය. ධනවතාගේ ධන නිධාන තව තවත් තර කර ඔවුන්ට රටේ උසස් තැනක් දෙනවා. ඒ සමගම නැති මිනිහා ක්‍රමක්‍රමයෙන් පාගා මිරිකා දමා ඔහු වහල් තත්ත්වයට ගෙන ඒමේ ප්‍රතිපත්තිය තමුන්නාන්සේලා බොහොම පරිස්සමින් අකුරටම ක්‍රියාවේ යොදවනවා. අක්මීමන ගරු මන්ත්‍රීතුමාට (සුගතදාස අරඹවල මයා.) මේ කාරණය නොතේරීමයි, මගේ කණගාටුව. උන්නැහේගේ පන්තිය පහළ වන්නට ඇති. ඒ ගැන කණගාටු වන්න ට වුවමනා නැහැ. ධනපති පන්තියක් යම් කිසි රටක ආරක්ෂා වුණා නම් ආරක්ෂා වුණේ ඒ ධනපති පන්තියේ කකුල් ලෙව කන උදවිය නිසා බව මුළු ලෝකයම දන්න වා. ඒ වගේ පිරිසක් නැත්නම් ධනපති පන්තිය කවදාවත් තර වන්නේ නැහැ. ඒ ධනපති පන්තියේ උදව්කාර පිරිසකුත් පිටිපස්සෙන් ඉන්නට ඕනෑ. ඒ නිසා ඒ වගේ පිරිස් ඇති වීම ගැන අප පුදුම වන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, හාල්වලින් පමණක් මිනිසුන්ට සිදු වුණු පාඩුව බලමු. මිනිසුන්ට කන බොන දේ, අඳින පළඳින දේ ඕනෑ තරම් තියෙනවාය කියා ගරු අගමැතිතුමා කියනවා. මේ තරම් හොඳ සාරවත් යුගයක් ඇති වුණෙත් නැත, ඇති වන්නෙත් නැත කියා අධ්‍යාපන ඇමතිතුමා කියනවා. මේ වෙස්සන්තර සේරුව නිසා සිදු වුණු දේ බලමු. තමුන් නාන්සේලා හැම තැනම කයිවාරු ගහන වා, මේ යුගය වෙස්සන්තර යුගයක්ය, වෙස්සන්තර සේරුව දෙනවාය කියා. වෙස්සන්තර රජ්ජුරුවන් දන් දුන්නේ අනුන්ගේ දේ නොවෙයි, තමන්ගේම දේයි. තමන්ගේ ධනය දුන්නා ; තමන්ගේ භාර්යාව දුන්නා ; තමන්ගේ දරුවන් දුන්නා. එහෙත් ඩඩ්ලි සේනානායක අග මැතිතුමා වෙස්සන්තර සේරුව දෙනවාය කියා හාල් සේරුවක් නිකම් දෙන්නේ රුපියලේ වටිනාකම සියයට විස්සකින් අඩු කරලයි ; විදේශ විනිමය සහතික පත්‍ර ක්‍රමය මගින් සියයට 55 ක් වැඩිපුර අර ගෙනයි ; පිටි රාත්තලටත් ශත 5 ක් වැඩි කරලයි. හැම පත්තෙන්ම මහජනයා තළා පෙළා භාණ්ඩාගාරයට මුදල් ලබා ගෙන ඒ මුදල් නැවත මහජනයාට දෙන වා. මහජනයාගේම දේ මහජනයාටම දෙනවා. මේක කොහොමද වෙස්සන්තර දීමනාවක් වෙන්නෙ ?

වෙස්සන්තර සේරුවේ විපාකය මොකක්ද කියා බලමු. අපේ කාලයේදී අපි සේරුව ශත 60 ගණනේ රු. 1.20 ට සේරු දෙකක් අරගෙන, සේරුව ශත 25 ගණනේ ශත 50 කට සේරු දෙකක් දුන්නා. ඒ අනුව ශත 70 ක් පාඩු වුණා. දැන් සේරුව ශත 60 ගණනේ අරගෙන සේරුව නිකම්, දෙවැනි සේරුව රු. 1.50යි. පාඩුව ශත 60 යි. අනික් පැත්තෙන්—මහ ජනයාගේ පැත්තෙන්—තත්ත්වය මො කක්ද කියා බලමු. අපේ කාලයේදී පළමු වැනි සේරුව ශත 25 යි, දෙවැනි සේරුවත් ශත 25 යි ; සේරු දෙකම ශත 50 යි. තමුන් නාන්සේලාගේ කාලයේදී පළමු වැනි සේරුව නිකම්, දෙවැනි සේරුව රු. 1.50 යි. එක එක තැන්වල ඒ ගණනේ පොඩි පොඩි වෙනස්කම් ඇති. මගේ කොට්ඨාශ යේ—වතුකරයේ—ගණනයි, මා කීවේ. දෙ වැනි සේරුව රු. 1.50 ක් දී ගත්තම දැන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සේරු දෙකම 1.50 ක් වෙනවා. අපේ කාල යේදි සේරු දෙකම ශත 50 යි. හොඳට කන බොන මිනිහකුට දැන් සුමානයකට රුපි යලක් පාඩුයි, හාල්වලින් පමණක්. අවුරුද්දකට සුමාන 52ක් නිසා එක මිනිහකුට අවුරුද්දකට රු. 52 ක් පාඩුයි. අවුරුදු 5 ට සුමාන 260 යි. එක් කෙනකුට අවුරුදු 5 ට රු. 260 ක් පාඩුයි. 10 දෙනකු සිටින පවුලකට හාල්වලින් පමණක් මේ අවුරුදු 5 ට රුපියල් 2,600 ක් පාඩුයි. 5 දෙනකු සිටින පවුලකට නම් රුපියල් 1,300 ක් පාඩුයි. සාක්කුවේ තිබුණු සල්ලියි ගියේ. මේ සල්ලි එන්න තැනක් තිබුනෙ නැහැ. ඒ මල් තැලුනට කමක් නැහැ. ඒවා වහල් වැඩ ගන්නට තිබෙන මල්, තව්තිසා දිව්‍ය ලෝකයේ තිබෙන මල් වැනි පූජනීය මල්, මුදල් ඇමතිතුමා පවා තවමත් දණගසා වඳින මල් තැලුවෙ නැහැ.

ගරු කථානායකතුමනි, හාල්වලින් පමණයි, මේ පාඩුව. මිරිස්, සූදුරු, කොත්ත මල්ලි, රෙදිපිළි ආදි වෙනත් බඩුවලින් මහජනයාට සිදු වී තිබෙන අසහනය කො පමණද කියා අවංකව පපුවට තට්ටු කර කල්පනා කර බලන්න. මහජනයාට මේ කියන තරම් සුගතියක් දිව්‍ය ලෝකයක් මැවිලාද? නැහැ. මෙය රට මුළා කරන්න කරන අසත්‍ය ප්‍රකාශයක්—[බාධාකිරීමක්]

ගරු මුදල් ඇමතිතුමා මේ අයවැය ලේඛනයෙන් දුම්කොළවලින් විශේෂ බද්දක් අරගෙන තිබෙනවා. මෙපමණ කලක් ගත්තේ දුම්කොළවලින්; මෙවර ගන්නේ සිගරට්වලින්. දුම්කොළවලින් ගත්තත්, සිගරට්වලින් ගත්තත්, කොයිකෙන් ගත්තත්, එකයි. තමුන්නාන්සේලා දුම් කොළවලින් රුපියල් කෝටි 24 ක ආදායමක් ලබනවා. එහෙත් මේ රටේ දුම් කොළ වවන්නාගේ තත්ත්වය කුමක්ද? වලපනේ සිගරට් දුම්කොළ හිමියන්ගේ සංගමයෙන් සන්දේශයක් මා තමුන්නාන් සේලාට ඉදිරිපත් කරනවා. මා හිතනවා දැනටමත් තමුන්නාන්සේලා සමහරෙකුට එය ලැබී ඇත කියා. කුමක්ද සිදු වී තිබෙන් නේ? කෝටි 24 ක ආදායමක් රජයට ලබා දෙන මේ දුම්කොළ ගොවියා අද අමාරු වේ වැටී සිටිනවා. ඔවුන්ට ලැබෙන මුදල ගරු ආහාර ඇමතිතුමා දන්නවා ඇති. ඔවුන්ට රාත්තලකට ලැබෙන්නේ රුපියල් 2.50 යි. එහෙත් ආණ්ඩුව රුපියල් 33.50 ක බද්දක් ගන්නවා. අනික් පැත්තෙන් සිගරට් එකකිනුත් සත 6 ක් ගන්නවා. ඔක්කොම රාත් තලකට රුපියල් 40ක් පමණ ගන්නවා. එහෙත් එය වවන ගොවියාට වේලන මිනිහාට හැම කටයුත්තක් සඳහාම තිබෙන්නේ රුපියල් 2.50 යි. ඒ මුදලින් ඔහු කොපමණ දේවල් කරන්නට ඕනෑද? කුලීකරුවන්ගේ පඩි වැඩි වී තිබෙනවා. දර මිල වැඩියි. වුවමනා කරන බට ආදිය තැනීමට ගන්නා බෙලෙක් තහඩු ගණන් ගිහින්. ඉඩම් බද්ද වැඩි වෙලා. තමුන් නාන්සේගේ පිරිවැටුම් බද්දෙන් මේ කර්මාන්තයට වුවමනා කරන පඩංගු නූල් ආදියත් ගණන් ගිහින්. පෝර මිල වැඩි වෙලා. බැංකුවෙන් මුදල් ගැනීමේදීත් කලින්ට වඩා පොළිය වැඩියි. ඔය අන්දමට හැම පැත්තෙන්ම දුම්කොළ ගොවියාට පහර වැදී තිබෙනවා. එසේ තිබියදී බදු වැඩි කරනවා. දුම්කොළ නිපදවන්නාට ආධාර යක් කිරීමට තමුන්නාන්සේලාගේ කිසිම උත්සාහයක් නැහැ.

කලින් දුම්කොළ සමාගම් දෙකක් තිබුණා. ඒ කාලයේ අඩු වශයෙන් තරගකාරී ස්වභාවයක්වත් තිබුණා. ඒ නිසා ගොවීන්ට යම් යම් සුළු වාසි ලැබුණා. එහෙත් මේ රජය කළේ කුමක්ද? ලංකා දුම්කොළ කර්මාන්ත ආයතනයේ අයිතිකාරයා වන සතාර් මහත්මයාගේ තාවකාලික බලපත්‍රය දීර්ඝ නොකර ඔහුට යන්නට සැලැස්සුවා. ඒ නිසා ඒ ආයතනය වහන්නට සිදු වුණා. එහෙත් ලංකා දුම්කොළ සමාගමේ සිටින එංගලන්තයේ සුදු මහත්වරුන්ට අත තබන්න තමුන්නාන්සේලා බයයි. ඒ අයට ඉන්න දුන්නා. ඒ අයගේ බලපත්‍ර අවලංගු කරන්න මේ ආණ්ඩුවේ බලය යෙදුවේ නැහැ. සතාර් මහත්මයාගේ බල පත්‍රය නම් අවලංගු කර ඒ ආයතනය වහන්නට සැලැස්සුවා. ඒ ආයතනයත් ලංකා දුම්කොළ සමාගම මගින් මිලයට ගත්තා. එයින් අර තරගකාරී ස්වභාවත් ඉවර වුණා. ඒ නිසා පසුගිය කන්නයේදී කෙලින්ම හිතුවක්කාරකම් කළා. වර්ග කිරීමේදීත් මිල ගෙවීමේදීත් නොයෙක් විධි යේ හිතුවක්කාරකම් කළා. එක සමාගමක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. එම්. හේරත් මයා.]

පමණක් තිබෙන නිසා ඒවා කරන්න පුළුවන්. එක අතකින් ලංකා දුම්කොළ සමාගම කෝටි දෙසිය ගණනක ලාභයක් ගන්නවා. අනික් පැත්තෙන් ආණ්ඩුව කෝටි 24 ක් ගන්නවා. එහෙත් දුම්කොළ වවන ගොවියාට කිසිම සහයෝගයක් නැහැ. තමුන්නාන්සේලා මේ පත්‍රිකාවේ නම් ලියා තිබෙනවා පසුගිය අවුරුද්දේ දුම්කොළ පිටරටත් යැව්වාය කියා. එය ඇත්ත. විදේශ විනිමය ආදායමක් ලබා ගත්තා.

"1967-68 දී රුපියල් 50,90,000 ක් වටිනා දුම්කොළ රාත්තල් 13,40,000ක් අපනයනය කරන ලදී."

රුපියල් 50 ලක්ෂයක විදේශ විනිම යක් ලබාගත්තා. එවැනි විදේශ විනිම යක් ලබා දුන් දුම්කොළ ගොවියාට නැත් නම් දුම්බාන් හිමියාට කිසිම විධියක සහ නයක් දෙන්නට මේ රජය ලැහැස්ති නැහැ. කරුණා කර ඒ අයට සාධාරණ මිලක් ගෙවන්න. අද හේන් ගොවිතැ නත් මීට වඩා ලාභයි. මෙහෙම ගියොත් දුම්කොළ ගොවිතැන අත්හරීවි. කුලීකරු වන්ගේ පඩි වැඩි නම්, ජීවන වියදම හැම පැත්තෙන්ම වැඩි වී තිබෙනවා නම්, කොළවලට සාධාරණ මිලක් නොලැබෙන වා නම්, වර්ග කිරීම හරියාකාර ක්‍රියාත් මක වන්නේ නැත්නම් දුම්කොළ ගොවි යාට ලැබෙන සහනය කුමක්ද කියා මා අහනවා. මේ ප්‍රශ්නය දුම්කොළ සමාගම ලවා හරියාකාරව විසඳා ගන්න බැරි නම්, දුම්කොළ සමාගම රජයට පවරාගෙන එය සංස්ථාවක් කරන්න. එසේ කොට ලාභ ඉපදවීම සඳහා මහජනතාවට එය භාර දෙන්න. විදේශ විනිමය නැතැයි මුදල් ඇමතිතුමා කොතෙකුත් බෙරිහන් දෙන වා. එහෙත් රුපියල් කෝටි 250ක් එංග ලන්තයට අරගෙන යන්න අර කොම් පැණිකාරයන්ට ඉඩ දෙන්න පුළුවනි. උන්නැහෙලා තමුන්නාන්සේලාගේ බාප් පලා නොවැ. ඉලක්කම්වලින් මෝස්තර පෙන්නා මහජනතාව රවටන්නට තමුන් නාන්සේලාට පුළුවන්කම තිබෙතත්, ඒ විධියට කටයුතු කිරීමෙන් නම් අපේ ආර්ථික ප්‍රශ්න විසඳෙන්නේ නැති බව ගරු මුදල් ඇමතිතුමාට කණගාටුවෙන් මතක් කරනවා.

මුදල් ඇමතිතුමා සිය අයවැය කථා වෙන් කියනවා, මේ රටේ මිනිසුන් ඉස් සරට වඩා දැන් බැංකුවල සල්ලි ඉතිරි කරනවාය කියා. එක්තරා කාලයකදී මේ රටේ සාමාන්‍ය පොදු ජනතාව ලංකා බැං කුව වැනි බැංකුවලට එන්නට පවා බිය වුණු බව තමුන්නාන්සේලාට අමතකද? මා හිතන හැටියට මහජන බැංකු ක්‍රමය යෝජනා කළේ වර්තමාන කර්මාන්ත හා ධීවර ඇමතිතුමායි. එය ක්‍රියාවට පරිවර්ත නය කළේ කොළොන්නාවේ ගරු මන්ත්‍රී තුමායි. එසේ මහජන බැංකු ඇති කළා යින් පසුවයි, ගමේ ගොඩේ බැංකු ඇති වුණේ. දැන් නම් රාගල, හඟුරන්කෙත වැනි තැන්වල පවා බැංකු තිබෙනවා. එහෙත් ඉස්සර නම් බැංකු ගිණුමක් විවෘත කිරීම සඳහා නුවරට, නුවරඑළියට නැත්නම් කොළඹට එන්න ඕනෑ. එසේ මහජන බැංකු ඇති කිරීම නිසා සාමාන්‍ය ගොවි ජනතාව පවා, දුම්කොළ වගා කරන්නන් පවා බැංකු ගිණුම් විවෘත කළා. එම නිසා දැන් බැංකුවල සල්ලි තිබෙන බව ඇත්ත. එහෙත් ඒ සල්ලි ඉස්සර තිබුණේ පෙට්ටිවලයි. වෙනස එපමණයි. ඒ මිස ඉස්සර ඔවුන් ළඟ සල්ලි නොතිබුණා නොවෙයි. එහෙත් තමුන්නාන්සේගේ ප්‍රගති වාර්තාවෙන් කියන්නේ දැන් ගම්බද මිනිසුන් බැංකු වල රුපියල් කෝටි 147 ක් ඉතිරි කර තිබෙනවාය කියායි. මිනිස්සු එසේ බැංකු වල සල්ලි තැන්පත් කර තිබෙන්නේ, ඒවාට කරන්න දෙයක් නැති නිසාලු.

පසුගිය අවුරුදු 4½ කාලය තුළ මේ රජ යේ ඇමතිවරුන් කොපමණ ඉතිරි කර තිබෙනවාද? කරුණාකර ලැයිස්තුවක් ගෙන බලන්න. අවුරුදුපතා මන්ත්‍රීවරුන් ගේ වත්කම් හෙළි කරන බවට පසුගිය මහා මැතිවරණ කාලයේදී තමුන්නාන් සේලා මහජනතාවට පොරොන්දුවක් දුන්නා. ඒ සඳහා පනතක් ගෙනෙන බවත් කීවා. එහෙත් ගෙනා පනතකුත් නැහැ, වත්කම් හෙළි කිරීමකුත් නැහැ. ඒ ඇයි? වත්කම් හෙළි කළොත් සමහර අයට වරදිනවා නොවැ. එම නිසා ඇමති තුමාට මා අභියෝග කරනවා, මේ පස් වැනි අවුරුද්දේදීවත් වත්කම් හෙළි කරන පනතක් ගෙනෙන්නය, වත්කම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හෙළි කරන්නය කියා. තමුන්නාන්සේලා මහජනතාවට දුන් පොරොන්දු ඉටු නොකරන්නේ ඇයි?

**ඩී. පී. අතපත්තු මයා. (රාජ්‍ය ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. டீ. பீ. அத்தபத்து—இராஜாங்க அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. D. P. Atapattu—Parliamentary Secretary to the Minister of State)

අවුරුදුපතා දැනුත් වත්කම් හෙළි කරනවා නොවෙන්නම්.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ගෙනෙනවාය කියූ පනත කෝ? මැතිවරණ කාලයට විතරද, ඒවා? ඒවා වේදිකාවට පමණක් සීමා නොකර ක්‍රියාවට පරිවර්තනය කරන්න.

වගා ව්‍යාපාරය ගැන බොහොම ලොකුවට වර්ණනා කරනවා. මීට මොහොතකට කලින් අක්මීමන ගරු මන්ත්‍රීතුමත් (සුගතදාස අරඹවල මයා.) ඒ ගැන වර්ණනා කළා. මේ රටේ ගොවියන් වර්ග දෙකකට බෙදෙනවා. මේ රජය විසින් අක්කර 1,04,000 ක් බේදා දුන් ඉහළ පෙළේ ගොවියන් එක කොටසක්. අනෙක් කොටස සාමාන්‍ය දුප්පත් ගොවියන්. මේ රජය ලංකා දුම්කොළ සමාගමට අක්කර දාහකුත්, මොරටුවේ ගරු මන්ත්‍රීතුමාට (එම්. රස්කින් ප්‍රනාන්දු මයා.) අක්කර තුන්දහකුත්, ජැපර්ජීලාට අක්කර දාහක් හා උම්බිච්චිලාට අක්කර දාහකුත් යනාදි වශයෙන් රජයේ කැලෑ ඉඩම් අක්කර 1,04,000 ක් අර ඉහළ පෙළේ ගොවියන් අතර බෙදා දුන්නා. ඔවුන්, පරම්පරා ගණනක් තිස්සේ තිබුණු ඒ කළුවර, බුරුත, පළු, වීර, හල්මිල්ල කැලෑ අක්කර පන්සීය දාහ එළි කොට, ඒ අගනා ලී කඳන් ලොරිවල පටවා කොළඹට ගෙනැවිත් විකුණා දැම්මා. ලංකා දුම්කොළ සමාගමට මහියංගනයෙන් දුන් ඉඩම්වල ලීවලින් පමණක් විශාල ආදායමක් ලැබී තිබෙනවාය කියා මට ආරංචියි. අක්කරයක ලීවලින් රුපියල් 75,000 ක් ලැබී තිබෙනවාලු. එතකොට අක්කර දහට රුපියල් හැත්තෑපන් දහසේ ඒවා දහසයි. රුපියල් හත් කෝටි පනස් ලක්ෂයයි. අපේ මුදල් ඇමතිතුමාට පින් සිද්ධ වන්නට ඒක ආදායම් බද්දෙන් තොරයි. ඊළඟට, එතැනට යන්නට ජීප් රථ දුන්නා. ඒවා හාන්නට ට්‍රැක්ටර් ගෙන්වා දුන්නා. ඒ වාගේම ලොරිත් තවත් කාර්මික උපකරණත් ගෙන්වන්නට විදේශීය විනිමය වෙන් කර දුන්නා. බෙහෙත් වර්ග ගෙන්වන්නටත් විදේශීය විනිමය වෙන් කර දුන්නා. ඒ තරම් සහනයක් ලැබුණාම මදැයි. අක්කර දාහයි. ඒකෙ ලීවලින් පමණක් රුපියල් හත් කෝටි පනස් ලක්ෂයයි. අවුරුදුපතා ලැබෙන වී විකුන් විකුණා ආදායමක් ලබා ගන්නවා. ඒවා සියල්ලක්ම ආදායම් බද්දෙන් තොරයි. විදේශීය විනිමය ඕනෑ තරම්. ජීප් රථ, කාර්, ට්‍රැක්ටර්, ලොරි ඕනෑ තරම්. ඉතින් මේ අය ගොවි රජවරුන් නොවෙන්නම්.

නමුත් ගමේ ගොවියාට මොක්කද සිද්ධ වී තිබෙන්නෙ? 1965 දී තමුන්නාන්සේලා බලයට පත් වන විට ප්‍රශ්න නිරවුල් කර ගත නොහැකිව, උසාවි යන්නට බැරිව මේ රටේ අද ගොවීන් 40,000 ක් පමණ සිටියා. නමුත් කුඹුරු පනතට සංශෝධනයක් ගෙනැවිත් හතළිස් දහසක් අද ගොවීන් ඒ වැටී සිටින අමාරුවෙන් ගොඩ ගන්නට අද වන තෙක් මේ ආහාර ඇමතිතුමාට පුළුවන් වුණේ නැහැ. ඒ සංශෝධනය ගෙනාවා නම් කිසිම විරුද්ධත්වයක් නැතිව මිනිත්තු පහෙන් සම්මත වෙනවා. කවුරුත් ඒකට පක්ෂයි. අද ගොවීන්ගේ ප්‍රශ්න විසඳන්නට සියලු දෙනාටම වුවමනා කර තිබෙනවා. නමුත් පසුගිය අවුරුදු හතර හමාර ඇතුළත කුඹුරු පනතට අවශ්‍ය ඒ සංශෝධනය ගෙනෙන්නට ආහාර ඇමතිවරයාට නුපුළුවන් වී තිබෙනවා. ඔන්න ගොවීන්ට සලකන හැටි.

එපමණක් නොවෙයි. අද ගොවීන්ට කුඹුරු සින්නක්කරව පැවරීමේ ක්‍රමයක් ආරම්භ කරනවාය කියා තමුන්නාන්සේලාගේ පළමුවන රාජාසන කථාවෙන් පොරොන්දුවක් දුන්නා. කෝ ඒක? අහසෙද? කඩදාසිවලින් කියන ඒවා තිබෙනවා. වචනවලින් කිව්වොත් හුළඟෙ යනවා. ඒක නැවතත් අහුලන්නට බැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. බී. එම්. හේරත් මයා.]
නමුත් මේ රාජාසන කථාව වැනි ලියවිලිවලින් කියන ඒවා සැමදාම තිබෙනවා. ඒවා කෞතුක වස්තූන් වාගේ තිබෙනවා. එම නිසා අමතක කරන්නට බැහැ. පොරොන්දුව දී දැන් පස් අවුරුද්දක් ගත වී තිබෙනවා. නමුත් අද වන තෙක් අද් ගොවීන්ට කුඹුරු සින්නකරව පවරා දීමේ ක්‍රමයක් ගැන සිතන්නටවත් තමුන්නාන්සේලාට පුළුවන්කමක් ලැබී නැහැ.

ඊළඟට ගොවි ණය ගැන බලමු. ඒ කාලයේ ගොවි ණය මුදල්වලින් පොලිය ගත්තේ සමුපකාර සමිතියක්; ආණ්ඩුව නොවෙයි. ඒ කාලයේ පොලිය සියයට 6 යි. අද කීයද? සියයට 9 යි. පළමුවන හය මාසය තුළ සියයට 9 යි. හය මාසය පැන්නොත් සියයට 12 යි. යම් විධියකින් කුඹුර පාළු වුණොත් ගත් ණය ගෙවන්නට බැහැ. ඇයි, වී නැහැ නොවැ. ණය ගෙවන්නට බැරි වුණොත් මොකද වෙන්නෙ? මුදල් අමතිතුමා ගොවියාගේ හාල් පොත රාජසන්තක කරනවා. ඊට පසු ගොවියා මොනවා කන්නද කියා මා දන්නේ නැහැ. කුඹුර පාළුවී වීත් නැහැ. හාල් පොතත් රාජසන්තකයි. ඒ ආකාරයට දැන් මේ රටේ හාල් පොත් ලක්ෂ ගණනක් රාජසන්තක කර තිබෙනවා. මිනිසුන්ට දැන් ඕනෑ තරම් මුදල් තිබෙනවා නොවැ. එම නිසා හාල් පොත් වුවමනා නැහැ. ඒකද තමුන්නාන්සේලාගේ තර්කය? තමුන්නාන්සේලා කල්පනා කරන්නේ දිරච්ච වේදිකාවක සිටගෙනයි. "දැන් මිනිසුන්ට ඕනෑ තරම් කන්නට බොන්නට තිබෙනවා, මිල මුදල් තිබෙනවා, මිනිසුන් දැන් සැපසේ ජීවත් වෙනවා" කියන දිරච්චි වේදිකාවේ සිටගෙනයි තමුන්නාන්සේලා කල්පනා කරන්නේ. ඒ වේදිකාව කඩා වැටෙන දිනය ඉතාම ළඟ බව කරුණාකර මතක තබා ගන්න.

එපමණක්ද? පෝරවල මිළ ඉහළ ගොස් තිබෙනවා. එදා කුඹුරු අක්කරයකට අවශ්‍ය පෝර ප්‍රමාණය රුපියල් තිස් ගණනකට ලබා ගන්නට පුළුවන්කම තිබුණා. නමුත් අද අක්කරයකට අවශ්‍ය පෝර ප්‍රමාණය සඳහා රුපියල් හතළිස් හතක් පමණ ගෙවන්නට සිද්ධ වී තිබෙනවා. මිළ ඉහළ ගියේ මක්නිසාද? බදු බර වැඩි කර තිබෙනවා. රුපියලේ අගය අඩු කළා. අර වෙන්දේසි ක්‍රමය උඩ තවත් සියයට 95 ක් ගන්නවා. පිරිවැටුම් බදු වැඩි කර තිබෙනවා. ඒවා ගෙවන්නට සිද්ධ වන්නේ කාටද? මහජනතාවටයි; ගොවියාටයි. හැබැයි, තමුන්නාන්සේලාට එකක් කියන්නට පුළුවනි. ඒක ඉලක්කම් මෝස්තරයෙන් පමණයි.

රුපියල් 12 ට තිබුණු වී බුසලක මිළ රුපියල් 14 ක් කර තිබෙනවා. ඇත්ත තමයි, ඉලක්කම වැඩියි. නමුත් මොකක්ද නියම තත්ත්වය? රුපියලේ අගය සියයට 20 කින් කැපූ බව අප දන්නවා. ගමේ මිනිසුන්ගේ භාෂාවෙන් කියනවා නම් ඉස්සර ශත 80 දැන් රුපියලක්. වී බුසලක මිළ රුපියල් 14 ක් කළාට තමුන්නාන්සේලා ගෙවන්නේ ඉස්සර ශත 80 ඒවායින් 14 ක් පමණයි. ඒ කියන්නේ රුපියල් 11.20 ක් පමණයි. තමුන්නාන්සේලා පරණ රුපියල් 12 න් සියයට 20ක් කැපුවා. ඒ පාඩුව පිරිමසන්නට නම් පරණ රුපියල් 12 ම ගොවියාට දෙනවා නම් වී බුසලකට රුපියල් 15 ක් වත් දෙන්නට ඕනෑ. නමුත් රුපියල් 15 ක් දී නැහැ. අද රුපියලේ වටිනාකම අනුව පරණ රුපියල් 12 ත් අද රුපියල් 15 ත් එක සමානයි. ගොවියාගේ වී බුසලට රුපියල් දෙකක් වැඩි කළා නොවෙයි, රුපියලකට තට්ටු කිරීමයි කළේ. රුපියලක් කපා දැම්මා. රුපියලේ මිල අඩු කිරීමෙන් එයයි සිදු වුණේ. මේ තර්කය තමුන්නාන්සේලාට නැහැයි කියන්න බැහැ. රුපියලේ මිල සියයට 20 කින් අඩු කළ අතර බඩුවල මිල සියයට 25 කින් ඉහළ නැග්ගා. එහෙම නම් රුපියල් 12 සියයට 25 කින් ඉහළ යන විට රුපියල් 15 ක් වෙන්න ඕනෑ. නමුත් තමුන්නාන්සේලා වී බුසලකට ගෙවන්නේ රුපියල් 14 යි. ඒ නිසා ගරු මුදල් ඇමතිතුමා මේ අයවැය ලේඛනයෙන්වත් ඒ ඉතිරි රුපියල ගොවියාට ලබා දෙන්න කටයුතු කරන්න. අවුරුදු ගණනක් තිස්සේ ඒ රුපියල කපා ගෙන ආවා. දැන්වත් එය ගොවියාට ලබා දෙන්න කටයුතු කරන්න.

ගොවියා රජ වෙලාලු. මහියංගනය, මොනරාගල, ලග්ගල ආදී ප්‍රදේශවල මා කලින් කී ආකාරයේ ගොවියන් රජ වුණ බව ඇත්තයි. නමුත් ගමේ සිටින

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගොවියාට මොකක්ද සිදු වී තිබෙන්නෙ? පෝර මිල වැඩියි. වී බුසලේ මිල කපා හැරියා. ඊළඟට ණය මුදල්වල පොලීවලින් මිරිකී සිටිනවා. එපමණද? නැහැ. ගොවිතැන දියුණු කරන්නය කියා තමුන්නාන්සේලාගේ අව්‍යාජ උත්සාහයක් තිබෙනවා නම් අනිකුත් වැවිලිවලට දෙන සහනය මේ ගොවියාට ලබා දෙන්න බැරි ඇයි? තේ වවන ධනපති ගොවියාට ආපසු නොගන්න රුපියල් 3,750 ක් ගෙවනවා නම්, රබර් වවන ධනපති ගොවියාට ආපසු නොගන්න අක්කරයකට රුපියල් 1,500 ක් දෙනවා නම්, ඇයි වී ගොවිතැන් කරන ගොවියාට එවැනි සහනයක් දෙන්න බැරි? මා අසන්නේ එයයි. අඩු වශයෙන් අලුතෙන් කුඹුරක් අස්වැද්දීමේදී ඔවුන්ට රුපියල් 500 ක මුදලක්වත් ආපසු නොගන්න ලෙස දෙන්න බැරිද? අපි මෙය 1965 දී කිව්වා. 1966 දීත් කිව්වා. දැන් 1969 දීත් කියනවා. නමුත් කරන්නෙ නැහැ. තමුන්නාන්සේලාගේ සැලකිලි ලැබෙන්නේ තේ වවන, රබර් වවන, පොල් වවන ධනපතියන්ට පමණයි. ඒ වගාවන් කරන්නේ ධනපති අයයි. තමුන්නාන්සේලාගේ සැලකිලි ලැබෙන්නේ ඒ අයටයි. ගම්බද සිටින සාමාන්‍ය ගොවියාට තමුන්නාන්සේලාගෙන් කිසිම සැලකිල්ලක් ලැබෙන්නේ නැහැ. මහජනතාව මුළා කිරීම සඳහා බොරු ප්‍රචාරයන් පමණයි, තමුන්නාන්සේලාගෙන් ලැබෙන්නෙ. බොරු ව්‍යාපාරයක් පමණයි තමුන්නාන්සේලා කර ගෙන යන්නෙ.

තමුන්නාන්සේලා මේ වගා ව්‍යාපාරය සම්බන්ධයෙන් කර තිබෙන ප්‍රකාශන හරිද? ගරු අක්මීමන මන්ත්‍රීතුමා (සුගතදාස අරඹෙවෙල මයා.) සඳහන් කරන්න යෙදුනා, ගරු මුදල් ඇමතිතුමා කවදාවත් අසත්‍ය වාර්තා ඉදිරිපත් කරන්නෙ නැත කියා. ගරු කථානායකතුමනි, කව්ද මේ වාර්තා හදන්නෙ? ගම්බද සිටින ක්ෂේත්‍ර නිලධාරීන් කියන පිළිවෙලටයි මේ වාර්තා සකස් කරන්නෙ. ඒ අය ලියන ඒවා උඩයි මේ වාර්තා සකස් කරන්නෙ. එයට හොඳ නිදර්ශනයක් මා ළඟ තිබෙනවා. මෙන්න මේ විධියටයි කරන්නෙ. මුලින්ම තීරණය කරනවා, මේ අවුරුද්දේ වී බුසල් 35 ක අස්වැන්නක් තිබිය යුතුය කියා. ඊළඟ අවුරුද්දේදී ලියා එවන්න ඕනෑ වී බුසල් 40 ක් තිබෙනවාය කියා. ඊට අඩු ගණනක් ලියා එව්වොත් ඒ මිනිහාගේ රක්ෂාවත් නැති වෙන්න පුළුවනි. ඔහුගෙන් නිදහසට කාරණා අහනවා. කොහොමද මේ ගණන අඩු වුණේ කියා ඒ නිලධාරියාගෙන් අසනවා. දෙවැනි අවුරුද්දේදී අක්කරයකට වී බුසල් 40 ක් විය යුතුයි. තුන්වැනි අවුරුද්දේදී අක්කරයකට වී බුසල් 45 ක් විය යුතුයි. ඔය විධියට ක්‍රමානුකූලව ගණන ඉහළ යන්න ඕනෑ. හැබැයි, ඉලක්කම්වලින් පමණයි, කුඹුරුවල අස්වැන්නෙන් නොවෙයි. කඩදාසිවලින් පමණක් අස්වැන්න වැඩි වී තිබෙනවා.

මා මේ නිදර්ශනය ඉදිරිපත් කරන්න කැමතියි. මෙන්න මේ විධියට ලිපියක් එවා තිබෙනවා :

> " ප්‍රාදේශිය ගොවිජන සේවා නිලධාරි,
> උඩහේවාහැට,
> රිකිල්ලගස්කඩ,
> 1967.6.26.
>
> ගරු ලේකම් මහතා,
> කොටයාපතන ගො.කා.ස.,
> මතුරට.
>
> **අස්වනු ලේඛනවල අස්වැන්න සඳහන් කිරීම**
>
> ඔබ ගොවි කාරක සභා ප්‍රදේශයේ අක්කරයකට සාමාන්‍ය අස්වැන්න බුසල් 35 හෙයින් ඒ අනුව අස්වනු ලේඛන පිළියෙල කරන ලෙස දන්වමි.
>
> මෙයට,
> කීකරු සේවක,
> අ.ක. කෂ.ස. "

ගමේ හැම කුඹුරකම අස්වැන්න අක්කරයකට වී බුසල් 35 ය කියා ඒ අය තීරණය කර අවසානයි. 35 ට අඩුවෙන් ලියන්න පුළුවන්කමක් නැහැ. 1968 දීත් මේ ලියමනම එවනවා, අක්කරයකට අස්වැන්න වී බුසල් 40 කියා සඳහන් කරන්නය කියා. ඊළඟට 1969 දී ලියා එවනවා අස්වැන්න වී බුසල් 45 ය කියා සඳහන් කරන්නය කියා. ඔන්න ඔය ආකාරයටයි මේ අස්වැන්න තීරණය කරන්නෙ. අර ක්ෂේත්‍ර නිලධාරීන් ලියා එවන ඉලක්කම් අනුව ඇමතිතුමා තීරණ අරගෙන මේ සංඛ්‍යා ලේඛන සකස් කර ගන්නවා. ඉලක්කම් මෝස්තරය නම් දියුණු වෙනවා. ඉලක්කම් මිනිසුන්ට කන්න දෙන්න බැහැ නේ. මෙන්න මේ වගේ අසාධාරණ වාර්තා උඩයි මේ වාර්තා සකස් කර තිබෙන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. එම්. හේරත් මයා.]

ඊළඟට ගෙවත්තක් වවනවා නම් ඉස්කෝලේ මහත්මයා ළමයාගේ මාර්ගයෙන් ඒ ගෙවත්ත ගැන ලියනවා. කෘෂිකර්ම ඕවසියර් මහතා ඔහුගේ දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා මගින් ඒ ගෙවත්ත ගැන ලියනවා. ඩී.ආර්.ඕ. මහතා ගමේ සිටින ග්‍රාමසේවක මහතාගේ මාර්ගයෙන් එය ලියනවා. ඔය විධියට එකම ගෙවත්ත තුන් පැත්තකින් ලියවෙනවා. දෙපාර්තමේන්තු තුනකින් ඒ ගැන ලියා එවනවා. ඊළඟට ඔය වාර්තා 3 ම අරගෙන ඇමතිතුමා කියනවා මේ තරම් වගා දියුණුවක් ඇති වී තිබෙනවාය කියා. රට සංවර්ධනය වෙනවාට අපි විරුද්ධ නැහැ. රට සංවර්ධනය කරන්න අපි කැමතියි. නමුත් මේ නිලධාරීන් විසින් ලියා එවන ලැයිස්තුවලට ඇයි රවටෙන්නෙ? ඇත්ත වශයෙන්ම රටට සංවර්ධනයක් අවශ්‍යයි. එහි කිසි ප්‍රශ්නයක් නැහැ. කාටත් රට සංවර්ධනය කිරීමේ ආසාව තිබෙන්නට ඕනෑ. එහෙත් මෙම නිලධාරීන් කරන ප්‍රෝඩාව තේරුම් ගන්න නමුත්නාන්සේලාට බැරි ඇයි? එම ප්‍රෝඩාවෙන් හදන මන්දිරය උඩට වී අපේ මුදල් ඇමතිතුමා සකස් කරන අය වැය ලේඛනය කවදාමුත් උන්නැහේත් සමගම කඩා වැටෙනවා නේද? එයින් හානි සිදු වන්නේ අපේම ජාතියට නේද? එම නිසා මේ උදවිය කරන වැඩ කටයුතු ගැන හොඳින් සොයා බැලිය යුතුයි.

එක වතාවක් මහනුවර නගරයේ ගෙවතු අක්කර 15 ක් වැවූ බව නිලධාරියෙක් කිව්වා. ඊළඟ වතාවේත් එවැනි වාර්තාවක් සපයන ලෙස ඔහුට නියම කළා. ඒ වතාවේත් ඔහු කිව්වා වගා කර තිබෙන්නේ ගෙවතු අක්කර 15 බව. අනතුරුව එවැනි තත්ත්වයක් ඇතිවීම ගැන ඔහුගෙන් නිදහසට කරුණු විමසා තිබෙනවා. ටවුමේ තියෙන ගෙවතු ප්‍රමාණය ඒපමණ බවත් මල් ගසක් හෝ වවන්නේ එම ඉඩම් ප්‍රමාණයේ බවත්, එන්න එන්නම අළුතින් ගෙවල් දොරවල් තැනෙන නිසා නගරයේ තිබෙන ඉඩම් ටිකින් ටික නමුත් අඩු වෙනවා මිස වැඩි නොවන බවත් ඔහු නිදහසට කරුණු වශයෙන් කියා තිබෙනවා. ඒක එහෙනම් උඹේ වරදයි කියා ඔහුට දඬුවම් කර තිබෙනවා. ඉඩම් වැඩි නොවීම ඔහුගේ අදක්ෂකමයි. දිස්මිස් නොකරන්නට නිදහසට කරුණු ඔහුගෙන් විමසා තිබෙන්නේ එම නිසායි. ඔහු ප්‍රකාශ කර තිබෙනවා තමාට බොරු කියන්නට බැරි බව. ඒ පාර වුණේ කුමක්ද? ඔහු අනුරාධපුර දිස්ත්‍රික්කයට මාරු කළා. මේ පිළිවෙළටයි වැඩ කෙරෙන්නේ. ඒ පිළිවෙළට අවංකව වාර්තා සකස් කරන උදවියත් ඉඳහිට ඇති. එහෙත් වැඩියෙන් සිටින්නේ බොරු කරන උදවියයි. එසේහෙයින් මීට වඩා ටිකක් කල්පනාකාරීව මෙමු වැඩ කටයුතු කළයුතුව තිබෙනවා.

මගේ ප්‍රදේශයට බලපාන තවත් කාරණයක් ගැන මතක් කරන්නට ඕනෑ. එනම් ඇපල් වගාව ගැනයි. මෙම ආණ්ඩුව පිහිටුවන්නට එක උපකාරයක් වුණා ඇපල් වගාවත්. ඇපල්, මුද්දරප්පලම් ඕනෑතරම් ගෙන්වා දෙන්නම් යනුවෙන් එදා මේ අය පොරොන්දු වුණා. කුරුඳුවත්තේ නෝනලා එහෙම ඇපල් මුද්දරප්පලම් කෑමේ බලාපොරොත්තුවෙන් තමයි අලියාට කතිරය ගැසුවේ. දැන් ඕස්ට්‍රේලියාවෙන්වත් ඕලන්දයෙන්වත් ඇපල් එන්නේ නැහැ. ටිකක්හරි ඇපල් එවන්නේ අපියි; වලපනේ උදවියයි. එහෙත් අපට කරන අසාධාරණය කුමක්ද? ඒ පැත්තේ ඇපල් ගෙඩියක් ශත 75 යි. කොළඹ ඇපල් ගෙඩියක වටිනාකම රුපියල් 3 යි; 3.50 යි. අඩුම වුණොත් රුපියල් 2.50 යි. ඊට අඩුවෙන් කවදාවත් කොළඹින් ඇපල් ගෙඩියක් ලබා ගන්නට බැහැ. රජයේ අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවය කියා එකක් තිබෙනවා නේද? ඇපල් ගස් තිබෙන්නේ ඉතා සුළු ප්‍රමාණයක්. වැඩිම වුනොත් ඇපල් ගස් 500 ක් පමණ ඇති. අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් මෙම ඇපල් සහතික මිලක් අනුව ලබා ගෙන ශත 75 ගණනේ වේවා රුපියල ගණනේ වේවා පාරිභෝගිකයන් අතර සාධාරණ මිලකට බෙදා දුන්නොත් නරකද? එය කරන්න බැරි මොකද? ලංකාවේ හැම තැනම තිබෙන, එකතු කරන්නට අමාරු දෙයක් හැටියට ඇපල් ගෙඩිය සලකන්නට බැහැ. එකම පතනක එකම තැනක අක්කර 50 ක විතර හරියක එකම යායක් හැටියටයි මෙම ඇපල් වගාව තිබෙන්නේ. සතියකට වරක් ලොරියක් ගියොත් එම ඇපල් අරගෙන ඇවිත් පාරිභෝගිකයන්ට සාධාරණ මිලකට සපයන්නට පුළුවනි. එවැනි වැඩ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පිළිවෙළක් යෙදුවොත් ගොවීන් ධෛර්‍යයී මත් වෙනවා. නව නවත් ඇපල් වවන්නට. එහෙත් මෙම වැඩ පිළිවෙළ ගැන ඉඩම් ඇමතිතුමාට බොහොම අමාරුයි. එම දේශගුණයේ පමණයි ඇපල් වැවිය හැක්කේ. තවත් බොහෝ තැන්වල පර්යේෂණ පවත්වා දැන් එම උත්සාහ යන් අතහැර දමා තිබෙනවා. එක්තරා කඳු බෑවුමක විතරයි ඇපල් වැවෙන්නේ. එම ප්‍රදේශයේ ඇපල් වැවියහැකි අක්කර තුන් හාරසියයක්ම තිබෙනවා. එහෙත් එම ප්‍රදේශයේ රෙඩ් ගම් බ්ලු ගම් වැනි ගස් වවා තිබෙනවා. එම ගස් වවනවාට වඩා ඇපල් වවන එක ප්‍රයෝජනවත් බව් අප කියා තිබෙනවා. එම නිසා රටට අවශ්‍ය ඇපල් වවන්නට මිනිසුන්ට එම ඉඩම් ලබා දෙන ලෙස ඉල්ලා සිටියා. එහෙත් එය කළේ නැහැ. ඒ අතර මිනිසුන් බල හත්කාරයෙන් ගොස් එම ප්‍රදේශයේ යටකී ගස් අස්සේම ඇපල් වැව්වා. ඇපල් වලට හෙවනත් අවශ්‍ය නිසා ඔවුන් එසේ කළා. එහෙත් ඉඩම් ඇමතිතුමා ඔවුන්ට විරුද්ධව නඩු දමා තිබෙනවා. ඔවුන් ඇපල් වවන නිසා එම ප්‍රදේශයෙන් එලවා දමන්නටයි යන්නේ. මෙන්න ඇපල් වගාවට ආධාර දෙන හැටි. ඉඩම් ඇමතිතුමා බැරිවෙලාවත් යම් ප්‍රදේශයක කජු වගාවක් පවත් ගත්තා නම් පරම්පරා ගණනක් තිබුණු කැලෑව කපා දමා ඒකට ඉඩ ලබා දේවි. එහෙත් ඉතා ස්වාභාවික ලෙස එම ප්‍රදේශයේ වැවෙන ඇපල් වගාවට ඉඩකඩ ලබා දෙන්නේ නැහැ. ඇපල් වගා කරපු උදවිය එලවන්නට හදනවා. අද උදා වී තිබෙන්නේ මෙවැනි තත්ත්වයක්.

එළවළු පිළිබඳ තත්ත්වය කුමක්ද? අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් එළවළු පිළිබඳව කිසිම උත්සාහයක් දරා නැහැ. නුවරඑළිය වවේට විතරක් එක ලොරියක් දුවනවා. එපමණයි. එහෙත් වලපනේ, නුවරඑළිය සහ හඟුරන්කෙත වැනි ප්‍රදේශවලින් ඕනෑතරම් එළවළු එකතු කරන්නට පුළුවනි. මා පදිංචිව සිටින තැනට යාබදව වටපුළුවේ තිබෙනවා එළවළු රාත්තල් ලක්ෂ 6 ක් පමණ තැන්පත් කළහැකි සීත ගබඩාවක්. එහෙත් එහි එකම එළවළු රාත්තලක්වත් තැන්පත් කරන්නේ නැහැ. එය නිකම් වසා දමා තිබෙනවා. රුසියන් ආධාරවලින් මහවැලි ගඟ අයිනේ සාදා තිබෙන එළවළු රාත්තල් හය ලක්ෂයක් පමණ තැන්පත් කළහැකි සීත ගබඩාවක් මේක. ඒකට එක එළවළු රාත්තලක්වත් ගෙනැවිත් දමන්නේ නැහැ. එසේ කරන්නට පළමු එළවළු මිලදී ගන්නට එපායැ. අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව භාරයේ ඒක ඔහේ නිකම් තිබෙනවා. මිනිසුන්ට අවශ්‍ය කරන එළවළු ටික නියම මිලකට ලබා දෙන්නේ නැහැ. ඇපල්වලට සහතික මිලක් ඇති කරන්නේත් නැහැ. එම වැඩ කටයුතු සඳහා නිරත වන, වැඩ කරන අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවකුයි අපට වුවමනා කරන්නේ. නිකම් බෝඩ් ලෑල්ලක් පමණක් තිබුණාට මදි. අද මේ රටේ වැඩ කටයුතු කෙරෙන්නේ ඔය පිළිවෙළටයි.

ඒ අතරතුර, "ගොවියා රජ වෙලා" යනාදී වශයෙන් කයිවාරු ගහනවා. ගොවීන්ට දැන් කන්න ඕනෑ තරම් තියෙනවාලු. ගොවීන්ට දැන් ඕනෑ තරම් මිල මුදල් තිබෙනවාලු. මුදල්වලට කරන්නට දෙයක් නැතිව ඒවා බැංකුවල ඉතිරි කර තිබෙන වාලු. කාටද මේවා කියන්නේ? මේවා කියන්නේ ඇත්තෙන්ම මේ රටේ මිනි සුන්ටද? මේ රටේ මිනිසුන්ට මේ විධියේ කථා කියන්නේ ඒ උදවියට මේවා තේරෙන්නේ නැතැයි හිතිලාවත්ද? මේ රටේ මිනිසුන් තමන් ඉන්න නියම තත් වය ගැන හොඳාකාර දන්නවා. ගොවියා විඳින දුක ගැන ගොවියා දන්නවා. ඒ ගැන කිසිම සැකයක් තිබෙනවායැ. පොල් ගෙඩි යක්, එළවලු ටිකක්, මිරිස් රාත්තලක්, හාල් සේරුවක් ගන්නට කොයි තරම් මුද ලක් ගෙවිය යුතුදැයි ගොවියා දන්නවා. ගොවිපළක හෝ වෙනත් තැනක හෝ දවස් පඩියට වැඩ කරන කෙනෙකුට ලැබෙන පඩිය කීයද? සාමාන්‍යයෙන් ලැබෙන්නේ රුපියල් තුනයි. ඔය රුපියල් තුන පවුලේ අයට එක වේලකටවත් සෑහෙනවාද? මෙසන් කෙනෙකුට දවසකට පඩිය හැටියට ලැබෙන්නේ රුපියල් 5 යි. ඒ මුදල වේලකටවත් ඇද්ද? වේලක් කන්න වුවමනා කරන දේවල් ගැනීමට කොයි තරම් මුදලක් අද වැය කරන්නට සිදු වෙනවාදැයි කල්පනා කර බලන්නට ඕනෑ. මිනිසුන්ට දැන් මුදල් තිබෙනවාය කිය නවා මේ ආණ්ඩුව. මිනිසුන් දැන් මුදල් ඉතිරි කරනවාය කියනවා මේ ආණ්ඩුව. මුදල් තිබෙනවාය කියන කතාව සැබෑවත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

වෙන්නට පුළුවනි. එහෙත් තිබෙන මුදලින් කරන්නට පුළුවන් දේවල් මොනවා දැයි කල්පනා කරන්නට ඕනෑ. මිල මුදලින් කර ගත හැකි දේ ගැන කල්පනා නොකර නොවෙයිද මේවා කියන්නේ? මේවා අහසේ ඉඳගෙන කරන ප්‍රකාශයන් බව පැහැදිලියි. ඇත්ත වශයෙන්ම අද මහ ජනයා කෙලින්ම පීඩාවෙන් පීඩාවට පත් වෙලා ඉන්නවා. මේ ආණ්ඩුවේ තමුන්නාන්සේලා මෙවැනි ප්‍රකාශයන් කරන විට කල්පනාවට ගන්නේ කෝටිපතියන්, ලක්ෂපතියන්, ධනවතුන් ජීවත් වන ආකාරය ගැන පමණක් වෙන්නට ඕනෑ. ඇත්තෙන්ම ඒ අය සැපසේ ජීවත් වන පිරිසක් තමයි. ආණ්ඩුවේ මැති ඇමතිවරුන්, ධනපතියන්, ජීවත් වන ආකාරයටම මේ රටේ සාමාන්‍ය ජනතාවත් ජීවත් වෙතැයි කල්පනා කිරීම වැරදියි. ඒ උදවිය වාගේම සාමාන්‍ය ජනතාවත් සැපසේ ජීවත් වෙනවාය කියනවා නම් එය වැරදියි.

අපේ ප්‍රදේශයේ සමුපකාර සංගම්වල ශාඛා විවෘත කර තිබුණා. ඒවායින් ගමක් ගමක් පාසා ඉන්න පාරිභෝගිකයන්ට වටිනා සේවයක් ලැබුණා. අපි හොඳ නැත්නම් එළියට දමන්නා. ඊට වඩා හොඳ අය ඉන්නවා නම් පත් කර ගන්න. ඒකට කමක් නැහැ. අප කවුරුත් බලාපොරොත්තු වන්නේ අපේ ආයතනවලින් වඩ වඩා හොඳ සේවයක් බව ඇත්තයි. ඒ නිසා හොඳ අය පත් කරගෙන හොඳට වැඩ කරන්නට ඕනෑ. එහෙත් ඇත්ත වශයෙන්ම දැන් කර තිබෙන්නේ කුමක්ද? තිබුණු ශාඛා සියල්ලක්ම වහලා දැම්මා. දැන් ඒවා මුදලාලිලාටයි භාර දීලා තියෙන්නේ. අද ඒ අය තම තමන්ට වුවමනා කරන විධියට ඒවායේ වැඩ කටයුතු කර ගෙන යනවා. අරුක්වත්තේ ශාඛාවක් තිබුණා. එය හැතැප්ම 26ක් පයින්ම යන්නට තිබෙන තැනකයි පිහිටා තිබුණේ. අද ඒකත් වහලා. මුදලාලි කෙනෙක් තමයි ඒකත් පාලනය කරගෙන යන්නේ. පරීක්ෂකවරුන් ඒවා බලන්නට යන්නේ නැහැ. පයින්ම ඔය තරම් දුරක් යන්නට කවුරුවත් කැමති නැහැ. නිතර නිතර පයින් යන්නට පුළුවන්කමකුත් නැහැ. පරීක්ෂකවරයෙක් එතැනට යෑමට පිටත් වුණත් එතැනට එන්නට පෙර ඒ බව ආරංචි වෙනවා. කලිසන්කාරයෙක් එනවාය කියලා දැන ගත්තොත් ඒ ඇති. එතකොටම මුදලාලිලා ඊට සූදානම් වෙනවා. එතකොට නියම මිළට බඩු මුට්ටු බෙදා දෙන බව පෙනෙන හැටියට වැඩ කටයුතු ලැස්ති කර ගන්නට පුළුවන් වෙනවා. ඔයින් මෙයින් පාරිභෝගිකයන්ට නොයෙක් විධියේ පීඩාවලට මුහුණ පාන්නට සිදු වෙනවා.

ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ අධ්‍යාපන ප්‍රතිපත්ති නිසාත් අද ගම්බද ජනතාවට දුක් විඳින්නටයි සිද්ධ වෙලා තියෙන්නේ. සියවස උත්සවය කියා එකක් මේ දවස්වල පවත්වනවා. මේ රටේ අධ්‍යාපනය දෙන්නට පටන් ගෙන දැන් අවුරුදු සියයක්ලු ගත වෙලා තියෙන්නේ. මෙය මේ රටට නින්දාවක් නොවෙයිද? අපේ ජාතියට මෙය නින්දාවක් නොවෙයිද? අවුරුදු දෙදාස් පන්සියයකටත් වඩා පරණ ජාතියක් හැටියට හඳුන්වනු ලබන අපේ ජාතියට අධ්‍යාපනයක් ලැබෙන්නට පටන් ගෙන තවම ගත වෙලා තියෙන්නේ අවුරුදු සියයක් පමණකැයි කියන්නට පුළුවන් කාටද? එහෙම නොවෙයිද මේ කියන්නේ? මේ කතාව ලොකුවට කිව්වට මොකද, එයින් ඇත්තෙන්ම අදහස් කරන්නේ මොකක්දැයි කල්පනා කර බැලුවද? අවුරුදු සියයකට ඉස්සර මේ රටේ හිටපු සිංහල මිනිසුන්ට අධ්‍යාපනයක් තිබුණේ නැද්ද? සිංහල මිනිසුන් පොත් ලිව්වෙ නැද්ද? ඔය කියන කතාවෙ හැටියට අපේ මිනිසුන් 1869න් පස්සේ තමයි අධ්‍යාපනයක් ලබන්නට පටන් ගත්තෙ. ඊට පෙර මේ රටේ හිටපු සිංහලයන් ම්ලේච්ඡයන් හැටියට හවංඩු ගැහිල්ලක් නොවෙයිද මෙයින් කෙරෙන්නේ? ගරු අධ්‍යාපන ඇමතිතුමා මේ සියවස උත්සවය පවත්වන්නේ මොන ආකාරයටද? ඒවාට පාඨශාලාවල ශිෂ්‍ය ශිෂ්‍යාවන් සහ ගුරුවර ගුරුවරියන් සහභාගි කර ගන්නේ කොහොමද? අද ඉස්කෝලවල ළමයින් ටිකට් විකුණනවා. සියවස ටිකට් විකුණන්නේ ගුරුවරුන් සහ ඉස්කෝලවල ළමයින් නේද? බලහත්කාරයෙන් නොවෙයිද ඒ උදවිය ලවා ටිකට් විකිණීම කරවන්නේ?

අද මේ රටේ පවත්වන විභාගවල ප්‍රතිඵල පවා හරියාකාර නිකුත් කරන්නට බැරි තත්ත්වයක් ඇති වෙලා තියෙනවා. විෂයයන් අටක් ගත් ශිෂ්‍යයකුගේ විෂයයන් හතරක පමණයි ප්‍රතිඵල නිකුත් කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙන්නේ. අනෙක් විෂයවල ලකුණුවලට මොනවා වුණාදැයි තාවම දන්නේ නැහැ. මගේ ළමයාගේ විභාගය ගත්තා. විෂයයන් අටකට පෙනී සිටිය නමුත් ලකුණු ලේඛනයේ තිබෙන්නේ විෂයයන් හතරක ප්‍රතිඵල පමණයි. අනෙක් හතරට කුමක් වුණාදැයි දන්නේ නැහැ. මේ ගැන ලියා යැව්වා. එහෙත් තවමත් ඊට පිළිතුරු ලැබී නැහැ. මේ තරම් තත්ත්වයක් ඒ සම්බන්ධයෙන් ඇති වී තිබෙන නමුත් ගරු අධ්‍යාපන ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් කරන්නේ කුමක්දැයි දැනගන්නට නැහැ. උන්නැහේ නම් තව්තිසා භවනයේ නොවෙයි, අකනිෂ්ඨ බ්‍රහ්ම ලෝකයේ වෙන්නට ඇති ජීවත් වන්නේ. උන්නැහේගේත් උන්නැහේ දන්නා පිරිසගේත් ජීවන තත්ත්වය අද ඊටත් වඩා ඉහළට නැගලා තිබෙන බවයි උන්නැහේ තැන් තැන්වල කරන කථාවලින් පෙනෙන්නේ. අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල වැනි කෙනෙක් මීට පෙර කවදාවත් මේ ලෝකයේ ඉඳලා නැති බවයි කියන්නේ. ඒ තරම් ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක් මේ රටේ මීත් ඉදිරියට උපදින්නෙත් නැහැ කියලයි කියන්නේ.

මොකද මේ වෙලා තියෙන්නේ ? අපේ ප්‍රදේශයේ ළමයින් බොහොමයකට නියම අධ්‍යාපනයක් ලැබෙන්නේ නැහැ. ගුරුවරුන් නැහැ. බොහොමයක් පාසල්වලට විද්‍යාලයාධිපතිවරුන් පවා නැහැ. පාසල්වලට හොඳ ගොඩනැගිලි නැහැ. සමහර පාසල්වලට වතුර නැහැ. මේ තත්ත්වය පවතින්නේ විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීන් නියෝජනය කරන ප්‍රදේශවලට පමණක් නොවෙයි. මා නියෝජනය කරන කොට්ඨාශයේ පමණක් පවතින තත්ත්වයක් ගැන නොවෙයි මා සඳහන් කරන්නේ. අහල පහල වෙනත් ප්‍රදේශ ගැනත් මා සොයා බැලුවා. මට ඒවා ගැනත් දැනගන්නට තිබෙන්නේ ඒ ආකාරයේ දේවල්මයි. නොයෙක් දේවල් දෙන්නට පොරොන්දු වී තිබෙන නමුත් දීලා තිබෙන්නේ බොහොම ටිකයි. මහජනයා අසහනයට පත් කරන මෙවැනි අයවැය ලේඛනවලින් මේ රටේ ජනතාවට කිසිම සැනසීමක් නොලැබෙන බව මතක් කරන්නට ඕනෑ.

තමුන්නාන්සේලා මේ ගරු සභාවේ හෝ වේදිකාවල හෝ කියන දේවලට තමුන්නාන්සේලාගේ ආණ්ඩු බලය තිබෙන තුරු මහජනයා ඇහුම්කන් දෙන එක සත්‍යයක්. අපටත් ඒ පිළිබඳ අත්දැකීම් තිබෙනවා. අගමැතිතුමා යම් තැනකට ගියොත් වටකර ගන්නවා. ඇමතිවරයෙක් ගියොත් වටකර ගන්නවා. ඇයි බලය තිබෙන්නෙ ඒ පැත්තෙ නේ. බලය තිබෙන පැත්තට ආවඩන එක, බලය තිබෙන පැත්තේ ඉන්නවාය කියා පෙන්වන එක මේ රටේ සාමාන්‍ය මහජනයාගේ හැටියක්. එහෙත් බලය නැති වුණ දවසට මොකක්ද වෙන්නෙ ? අද සමහර විට ගරු ඩඩ්ලි සේනානායක අගමැතිතුමාගේ මන්දිරය වට කරගෙන ඉන්නවා. එහෙත් මේ ආණ්ඩුව බිඳී හෙට මැතිණිය අගමැති වුණොත් ඒ පිරිසම ගොස් මැතිණිය වට කරගන්නවා. තමුන්නාන්සේලා අපි කවුරුත් ඒ කාරණය දන්නවා. එදා මැතිණිය අගමැති වශයෙන් සිටි කාලයේ එතුමිය වටකරගෙන සිටි හැටි අපට මතකයි. දැන් ඒ පිරිසම මෙතන වටකරගෙන ඉන්නවා. බලයට පත් වුණ පැත්තට ආ වැඩීම මේ රටේ සිරිතක් බවට පත් වී තිබෙනවා. බලය නැති වුණාම ඒ තත්ත්වය වෙනස්. මට වඩා හොඳට පළ පුරුදු මන්ත්‍රීවරුන් මේ ගරු සභාවෙ ඉන්නවා. අපේ කර්මාන්ත ඇමතිතුමා වුණත් දන්නවා ඇති, ඉස්සර එතුමා ගොවිකම් ඇමති වශයෙන් සිටි කාලයේදී එතුමා වටකරගෙන සිටි පිරිස ගැන. එතුමාට ඒ බලය නැති වී සාමාන්‍ය මන්ත්‍රීවරයකු වශයෙන් සිටින විට ඒ පිරිස නොසිටි බවත්, දැන් නැවතත් ඇමති පදවියේ සිටින විට නැවත ඒ පිරිස ඉන්න බවත්, පසුව ඇමති නොවුණොත් නැවත ඒ පිරිස නොඑන බවත් උන්නැහේ දන්නවා ඇති. ඒ තත්ත්වය මේ රටේ චාරිත්‍රයක් බවට පත් වී තිබෙනවා. එනිසා ජනයා එකතු වන ප්‍රමාණයෙන්, මහජනයාගේ මුහුණු වැඩි වන ප්‍රමාණයෙන් රටට පුහු සෝෂා කිරීම අවශ්‍ය නැහැ. ඒ පුහු සෝෂා කිරීමෙන් පාඩු සිදු වන්නේ සෝෂා කරන තමන්ට පමණක් නම් කමක් නැහැ. නමුත් එයින් තමන්ට පමණක් නොවෙයි මුළු රටටමයි පාඩුව සිදු වන්නෙ. ඒකයි මට පෙන්වා දෙන්න ඕනෑ කරන්නෙ.

ඊ ළඟට කථානායකතුමනි, ගොවිරජවරුන් තෝරන ආකාරය කෙසේද කියා මේ ගරු සභාවට මා පෙන්වා දෙන්න ඕනෑ. මේ තිබෙන්නේ විනිශ්චය මණ්ඩලවලට උපදෙස් වශයෙන් කෘෂිකර්ම දෙපාතී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

මේන්තුව විසින් 1968-69 තරඟය සඳහා ඉදිරිපත් කර තිබෙන පත්‍රිකාවක්. එහි දී තිබෙන උපදෙස් මොනවාද කියා බලමු. මා එකක් කියවන්නම් :

"වල් නෙලූ මනා ලෙස සකස් කළ නියරවලට ලකුණු පහක් දැමිය යුතුය. මීගුල් කක්කුටු ගුල් කැඩුණු නියර හා නියරේ වල් පැල ඇත්නම් ලකුණු වශයෙන් බින්දුවක් දැමිය යුතුය."

මීයෙක් හැරුවොත් බිංදුවයි. කක්කුට්ටෙක් හැරුවොත් බිංදුවයි. වල් පැළෑටියක් තිබුණොත් බිංදුවයි. කෘෂිකර්ම ඇමතිතුමාගෙන් මා අහන්නෙ ඔය බින්දුව කොයි පැත්තෙන්ද ලකුණු කරන්නෙ. පහට මුලින්ද, නැත්නම් අගින්ද? එසේත් නැත්නම් දෙපැත්තෙන්ම ලකුණු කරනවාද? මොකක්ද මේකෙ තේරුම? මේ ගොවියා රජ කරවන හැටි. කක්කුට්ටො මීයො එනවාද කියා බලාගෙන ඉන්න ඕනෑ. මෙන්න තවත් වගන්තියක් :

"කුඹුර සම්පූර්ණයෙන් වල් නෙලා ඇත්නම් ලකුණු පහක් ලැබිය යුතුය. කුමන ප්‍රමාණයෙන් වුවද නියරේ වල් පැල ඇත්නම්, ලැබෙන ලකුණු ප්‍රමාණය බින්දුවකි."

හරි ලස්සණ තරඟයක්. ගොයම් පැළ නොවෙයි, බලන්නෙ වල් පැළයි. විශේෂ සැලකිල්ලක් දක්වන්නෙ වල් පැලවලටයි. සේරු ගණන, කපන හැටි, වැඩ කරන හැටි ආදී සියලු දෙයක්ම මෙහි තිබෙනවා. මෙන්න තවත් වැදගත් කරුණක්.

"අවසාන තරඟයට තෝරාගත් තරඟකරුවන්ට වහා ඒ බැව් දැනුම් දී අක්කරයක් අස්වැන්න තක්සේරු කිරීමට ඔවුන්ගේ අක්කර බාගයේ අස්වැන්න සමීක්ෂණයක් පවත්වන බැව් දැනුම් දිය යුතුය."

මූලික තරඟයෙන් පසුව, තේරෙන අවසාන තරඟකරුවන්ට දැනුම් දෙනවා ලැහැස්ති වී සිටින්නය කියා. ඒ කියන්නෙ අපි කුඹුරට එනවා, අපි ඒ අස්වැන්න කපා බලනවා, ඒ නිසා කොහෙන් හෝ පැළ ටිකක් උගුල්ලාගෙන ඇවිත් හෝ එතැන සකස් කර තබාපන් කියන එකයි එයින් අඟවන්නෙ. ඒ තරඟකරුවන් 20 දෙනා කරගෙන යන විධියටම කරගෙන යන්න හැර ගිහින් අස්වැන්න කපා බැලුවම මොකද වෙන්නෙ? නැහැ, එහෙම කරන්නෙ නැහැ. දැනුම් දෙනවා. අසුවල් තැනිනුයි අපි කපා බලන්නෙ කියා තැනත් පෙන්වා යනවා. ඉතින් වී කරල් ඇති ගස් ටිකක් ගෙනැවිත් ඉඳුවා සකස් කර ගන්නත් ඒ තරඟකරුවන්ට පුළුවනි. ඉතින් අක්කරයකින් බුසල් 200 ක්, 300 ක්, 400 ක්, 500 ක් ලැබුණාය කිය නවා. මේ රටේ කුඹුරු අක්කරයකින් වී බුසල් 300 ක් ලැබෙනවා නම් කොයි මනුෂ්‍යයාද ඒකට විරුද්ධ වෙන්නෙ? විරුද්ධ වෙන්ට පුළුවන් කාටද? අපි විරුද්ධ නැහැ. අපි ඒ ගැන සන්තෝෂ වෙනවා. එහෙත් ඒක අවංක ප්‍රකාශයක්, ඇත්තක් වෙන්නට ඕනෑ. ඊයෙ-පෙරේද මාතලේ ගොවි රජවරුන්ට තෑගි බෙදා දීමේ උත්සවයේදී දිසාපතිතුමාත්, දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමාත් (ටී. බී. තෙන්නකෝන් මයා.) ඉදිරියේ ගොවීන් කියා සිටියේ මොකක්ද? "අපි නම් දැන් තෑගි ලබාගෙන ඉවරයි; නමුත් ඇත්ත ඕක නොවෙයි, ඔය කියන අස්වැන්න ප්‍රමාණය අපේ කුඹුරුවලින් ලැබුණේ නැහැ" කියායි. ප්‍රසිද්ධ රැස්වීමේදී තෑගි ලබාගත් ගොවීන් එහෙම කිව්වා. නිලධාරීන් තමන් ලොකු මිනිසුන් බව පෙන්වා ඇමතිතුමා මේ විධියට රැවටීමට උත්සාහ ගන්නවා. ඒ උත්සාහයෙන් සිදු වෙන්නෙ අහසේ හදන මාළිගාත් සමග කවදා හෝ ඇමතිතුමාත් ආණ්ඩුවත් කඩා වැටීමයි. ඒ තත්ත්වය මඟ හරවන්නට අපි මහන්සි ගන්නට ඕනෑ.

ඊළඟට පසුගිය අවුරුදු 4 තුළ මේ ආණ්ඩුව විසින් රට සංවර්ධනය කිරීමට කරන ලද කටයුතු පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කරන්නට අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමේදී මුදල් ඇමතිතුමා මහන්සියක් දරා තිබෙනවා. ඒ විස්තරය කියවා බලන විට අපට පෙනී යනවා, එතුමාගේ සංඛ්‍යා ලේඛනත්, ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යා ලේඛනත් පරස්පර විරෝධී බව. අපි අහන්නේ කොයි සංඛ්‍යා ලේඛන හරිද කියායි. මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළ සංඛ්‍යා ලේඛන හරිද, එසේ නැත්නම් ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යා ලේඛන හරිද? මුදල් ඇමතිතුමා තම අයවැය කථාවෙන් මහත් පරිශ්‍රමයක් දරා තිබෙනවා, රටේ සංවර්ධනය වුණු පැත්ත හුවා දක්වන්න. එහෙත් මහ බැංකුව සමහර තැන්වලදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ විධියේ පරිශ්‍රමයක් දරා ඇති නමුත් සම හර තැන්වලදී ඒ ගැන පරිශ්‍රමයක් දරා නැති බව පෙනී යනවා.

කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) කිව්ව වගේ ශ්‍රී ලංකා මහ බැංකුවේ 1968 වාර්තාවේ, 1967 සංඛ්‍යා වශයෙන් යොදා තිබෙන්නේ 1967 මහ බැංකු වාර්තාවේ එම වර්ෂය වෙනුවෙන් සඳහන් වන සංඛ්‍යා නොවෙයි. ඒ වගේම 1967 වාර්තාවේ 1966 සංඛ්‍යා වශයෙන් යොදා තිබෙන්නෙ 1966 වාර්තාවේ තිබුණු සංඛ්‍යාව නොවෙයි. ඒ වගේම 1966 වාර් තාවේ යොදා තිබෙන්නේ ඊට පෙර වර්ෂ වල සංඛ්‍යා හැටියට යොදා තිබුණු සංඛ්‍යා නොවෙයි, මේ සංඛ්‍යා ලේඛන එක වාර්තා වකින් තවත් වාර්තාවකට ගන්න විට වෙනස් වෙනවා. ඒ බැංකුවේම වාර්තාවල සංඛ්‍යා පරස්පර විරෝධියි. අන්තිම වර්ෂ යේ සංඛ්‍යා වෙනස් වුණා නම් කමක් නැහැ. මන්ද, ඒවා ස්ථිර නොකළ සංඛ්‍යා බව සඳහන් වන නිසා. එහෙත් මේ ස්ථිර කරන ලද සංඛ්‍යා ලේඛනත් වැරදියි. ඔය වගේ නූල් සූත්තරවලින්, මෝස්තරවලින් වගේ නූල් සූත්තරවලින්, මෝස්තරවලින් මහජනයාට ඉලක්කම් පෙන්වා තිබෙන බව ඇත්ත. හැබැයි ඒවා මහජනයාට කන්ට බැහැ. ඒවායින් මිනිසුන්ට ජීවත් වෙන්ට බැහැ. අවසානයේදී තමුන්නාන් සේලා මේ අයවැය ලේඛනයෙන් කියා තිබෙන්නෙ මොකක්ද? මුදල් ඇමතිතුමා මෙන්න මෙහෙම කියා තිබෙනවා:

"අපේ සංවර්ධන ප්‍රයත්නය සාර්ථක කර ගැනීම සඳහා කවර ආකාරයකින් වුව උපකාර වී ඇති සියලුම පුද්ගලයන්ට හා සංවිධානයන්වත් ස්තුති කිරීමට මේ අවස්ථාව ලබා ගැනීමට මා කැමතියි."

අපේ රටේ ගොවියො බොහොම වැඩ කරනවලු; මහන්සි වෙනවලු; උපදවනව ලු; නිපදවනවලු; සංවර්ධනය කරනවලු; ඒ කරන ලද උසස් ශ්‍රේෂ්ඨ ක්‍රියාවට අපේ මුදල් ඇමතිතුමාගෙන් ලැබෙන එකම එක උපහාරය "ස්තුතියි" යන්න පමණයි. "ගොවි රජවරුනි, ස්තුතියි. අතේ සල්ලි තියෙනවා නම් කාපල්ලා." එපමණයි.

රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කරන්නට යනවා. අපි ඒකට විරුද්ධ නැහැ. රටේ ජනතාවගේ ජීවන වියදම පහළ බස්වනවා නම් අද රජයේ සේවක යන්ට වැඩි කරන්නට යෝජනා කර

තිබෙන වැටුප් වැඩි කරන්නට වුවමනා නැහැ. පිටි රාත්තලක මිළ ශත 5 කින් අඩු කළා නම්, සීනි රාත්තලක මිළ ශත 5 කින් අඩු කළා නම්, තව හාල් සේරු වක් රජය ලබා ගන්න මිළට මහජනයාට දෙනවා නම්, අනෙකුත් මහජනයාට එදි නෙදා අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍යවල මිළ අඩු කරනවා නම්, රෙදි මිළ අඩු කරනවා නම් වැඩි පඩි වුවමනා කරන්නෙ නැහැ. මේ එකක්වත් අඩු කර නැහැ. සමහර දේවල් තිබුණු තත්ත්වයේම පවතින අතර සමහර දේවල මිළ තවත් වැඩි කර තිබෙනවා. මේ රටේ ජීවන වියදම් අංකය 4 කින්, 5 කින් හෝ 10 කින් බැස්සුවා නම් ඒ වැඩි වැටුප් ඉල්ලන උදවියම කියයි, ජීවන වියදම අඩුවී තිබෙන නිසා අපට වැඩිපුර පඩි අවශ්‍ය නැහැ කියා. ඒ විධියේ රජයේ සේවකයන් ඕනෑ තරම් ඉන්න පුළුවනි.

තවමත් ගරු මුදල් ඇමතිතුමාට පුළුවන් වුනේ නැහැ. වැටුප් කොමිසමේ අතිරේක වාර්තාව අපේ අතට පත් කරන්න. තවම මේ ගරු සභාවට වැටුප් කොමිෂන් සභාවේ වාර්තාව ඉදිරිපත් කර නැහැ. මේ සාකච්ඡාව ආරම්භ කිරීමට පෙර වැටුප් කොමිසමේ නිර්දේශයන් අපේ අතට පත් කරන්නට ගරු මුදල් ඇමති තුමාට යුතුකමක් තිබුණා. අද වන තුරු ඒ නිර්දේශ අප අතට පත් කර නැහැ. අප දන්නා හැටියට වැටුප් වැඩිවීම් දෙකක් දී තිබෙනවා. රුපියල් 3.50 ක වැටුප් වැඩි වීමක් ලබන තැනැත්තාට රුපියල් 7 ක් දී තිබෙනවා. ඒ වාගේම රුපියල් 50 ක වැටුප් වැඩි වීමක් ලබන තැනැත්තාට රුපියල් 100 ක් දී තිබෙනවා. රුපියල් 250 ක වැටුප් වැඩි වීමක් ලබන තැනැත් තාට රුපියල් 500 ක් දී තිබෙනවා. පඩි වැඩි කරන්නට මේ ආණ්ඩුව තීරණය කර තිබෙන බව ඇත්තයි. එහෙත් වැටුප් අතර තිබෙන විෂමතාවට අත තබා නැහැ. විෂම තාව තවත් වැඩි කරන්නට යනවා. වැටුප් වැඩිපුර ලැබෙන තැනැත්තාට වැඩියෙන් දෙනවා. අඩු තැනැත්තා හිටි තැනමයි. වැටුප් විෂමතා එතැනමයි. වැටුප් විෂමතා නැති කරන්නටයි, අප නම් බලා පොරොත්තු වන්නේ. එහෙත් මේ ආණ් ඩුවට නම් ඒක බැහැ. මේ ආණ්ඩුව දෙන දෙයක් දෙන්නේ තියෙන මිනිහාටමයි. බඩුස් වැඩිපුර දෙන්නේත් තියෙන මිනිහා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. බී. එම්. හේරත් මයා.]

ටයි. ඉඩම් දෙන්නේත් තියෙන මිනිහාටයි. සහන දෙන්නේත් තියෙන මිනිහාටයි. ලොරි දෙන්නේත් තියෙන මිනිහාටයි. මෝටර් රථ දෙන්නේත් තියෙන මිනිහාටයි. ඔක්කෝම තියෙන මිනිහාටයි. " නැති උදවිය මැරියල්ලා " යනු තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තියයි. එහෙත් ඉලක්කම්වලින්, නූල් සූත්තරවලින්, මෝස්තරවලින්, වාර්තාවලින් මහජනයා මුළා කිරීමට ක්‍රියා කර තිබෙනවා. මේවායින් සතුටු වන්නට අපට පුළුවන්කමක් නැහැ.

ගරු කථානායකතුමනි, විරුද්ධ පක්ෂයේ උදවියත්, ආණ්ඩු පක්ෂයේ උදවියත් එකතු වී ප්‍රශ්න විසඳීමට ක්‍රියා කළයුතු බව ගරු රාජ්‍ය ඇමතිතුමා ඊයේ ප්‍රකාශ කළා. එහෙත් එසේ කරන්නේ කොහොමද ? රාජ්‍ය ඇමතිතුමා ක්‍රියා කරන්නේ සමාජ සන්තක දේවල් පුද්ගලයන්ට පවරන්නටයි. සතොස මගින් ගෙන්වන ලද රෙදි පෞද්ගලික සමාගමකට දී තිබෙනවා. ආණ්ඩුවේ සල්ලිවලින් ගෙන්වූ රෙදි පෞද්ගලික සමාගමකට දුන්නා. මා මුලින් කීවාක් මෙන් කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඇතිව, එහෙත් මෙම ගරු සභාවට නොදන්වා, හෝටලයක් සෑදීම සඳහා සතොස සතු රුපියල් ලක්ෂ 360 ක් ඉන්දියානු සමාගමකට දෙන්නට ගරු රාජ්‍ය ඇමතිතුමා ක්‍රියා කර තිබෙනවා. ඔව්, හෝටලයක් විවෘත කිරීම සඳහා සතොස සතු රුපියල් ලක්ෂ 360 ක් ඉන්දියානු සමාගමකට දෙන්නට එතුමා තීරණය කර තිබෙනවා. රාජ්‍ය ඇමතිතුමා අදින්නේ ධනපතියන්ගේ පැත්තටයි. අප අදින්නේ නැති මිනිහාගේ පැත්තටයි. උන්නැහේ ඇති පැත්තට අදිද්දී අප නැති පැත්තට අදිනවා. ඉතින් අප එකතු වී වැඩ කරන්නේ කොහොමද ? එකතු වන්නට නම් ඇති නැති පරතරය නැති කළ හැකි බණ්ඩාරනායක ප්‍රතිපත්තිවලට අනුව ක්‍රියා කරන්නට සූදානම් විය යුතුයි. ඇත්තෙන්ම මේ රටේ ඇති නැති පරතරය නැති කරන්නට ඕනෑ. මේ රටේ සංවර්ධනයක් ඇති කරන්නට පුළුවන් වන්නේ එවිටයි.

මේ රටේ බණ්ඩාරනායක ආණ්ඩු දෙකක් තිබුණා. ඒ ආණ්ඩු දෙක මේ රටට ආර්ථික අත්තිවාරම දමා තිබෙනවා. කර්මාන්ත අතින්, සංස්ථා අතින්, ඇති නැති පරතරය නැති කිරීම අතින්, ඒ වාගේම මහජන බැංකුව, කුඹුරු පනත වැනි සමාජවාදී පියවරවල් අතින් සෑහෙන දුරට ඉදිරියට යන්නට ඒ ආණ්ඩුවලට පුළුවන් වුණා. එහෙත් මේ ආණ්ඩුව මේ අවුරුදු හතරකුත් මාස කීපය තුළ ක්‍රියා කර තිබෙන්නේ එදා අප ඉදිරියට ගිය ගමන ආපසු ඇද ගන්නටයි. සතොස ආයතනය වෙළෙඳුන්ට පැවරුවා. ඒ වාගේම ලංගමය වැනි ආයතන කඩාකප්පල් වන තැනට කටයුතු කර තිබෙනවා. අක්මීමන ගරු මන්ත්‍රීතුමා (සුගතදාස අරඹවල මයා.) නම් ලංගමය ගැන වර්ණනා කළා. හෙට අනිද්දා වන විට උන්නැහේට තවත් දෙතුන් දෙනකුට ලංගමයේ රක්ෂා දෙන්නට වුවමනා වී ඇති. ඒ නිසා වන්නට ඇති ලංගමය ගැන පොඩි වර්ණනාවක් කෙළේ. ඇත්තෙන්ම අද ලංගමය වසා දමන්නට සිදු වී තිබෙනවා. ඒකෙන් අලාභයි; පාඩුයි. කොතෙකුත් සේවකයන් බඳවා ගන්නවා. මේ අන්දමට හැම සංස්ථාවක්ම, හැම සමාජවාදී පියවරක්ම ආපසු හරවනන්ට මේ ආණ්ඩුව ක්‍රියා කර තිබෙනවා. ඇමතිවරුන් එක් කෙනෙකු දෙදෙනෙකු හැර අනෙක් අය මෙතෙක් ක්‍රියා කර තිබෙන්නේ සමාජවාදී පියවරවල් ආපසු හරවන්නටයි. ඇත්තෙන්ම ධනපති පංක්තියේ උදවිය ආරක්ෂා කරන්නටයි, මේ ආණ්ඩුව සිටින්නේ. ධනපති පංක්තිය ආරක්ෂා කරන්නට මේ ආණ්ඩුව ක්‍රියාකරන තුරු සාමාන්‍ය ජනතාවට සෙතක් වන්නේ නැහැ. ඒ නිසා අප දෙගොල්ලන් එකතු වීමෙන් ප්‍රයෝජනයක් නැහැ. මේ රටේ ඇති නැති පරතරය නැති කිරීම සඳහා ක්‍රියා කිරීම අපේ යුතුකමයි. මහජනතාවට යහපතක් සැලසීමට කැමති උදවිය ආණ්ඩු පක්ෂයේ ඉදිරි පෙළ ආසනවලත් එක් කෙනකු දෙදෙනෙකු ඉන්නට පුළුවනි. ඒ අතර පිටුපසු ආසනවල නම් සෑහෙන පිරිසක් ඇති. කෙසේ වුණත් ජනතාවගේ සංවර්ධනය සඳහා පරම පවිත්‍ර චේතනාවෙන් ක්‍රියා කරන පිරිස් කොයි පැත්තේ සිටියත් ඒ උදවිය එකතු වී ක්‍රියා කරන්නට සිදු වේවි. එසේ නැත්නම් බඩ ගින්නේ සිටින ජනතාව, අදින්නට නැතිව සිටින ජනතාව, ගෙවල් දොරවල් නැතිව සිටින ජනතාව, ලෙඩට බෙහෙත් නැතිව සිටින ජනතාව, රැකීරක්ෂා නැතිව සිටින ලක්ෂ සංඛ්‍යාව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තරුණ පිරිස කවදා හෝ එකතු වී ධනපති අධිරාජ්‍ය රාමුව යටතේ ගෙන යන මේ ක්‍රමය මේ රටෙන් අතු ගා දමන්නට සටනක් ආරම්භ කිරීම සක්සුදක් සේ පැහැදිලි බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

අ. භා. 12.15

**විමලා කන්නන්ගර මිය. (සෞඛ්‍ය ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திருமதி விமலா கன்னங்கர—சுகாதார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mrs. Wimala Kannangara—Parliamentary Secretary to the Minister of Health)

ගරු කථානායකතුමනි, මේ අජටාකාශ තරණ යුගයේදී උසස් කීර්තියක් ඇති යාපහුවේ රාජධානියෙත් එවා තිබෙන ගරු වන්නිනායක ඇමතිතුමා—වන්නි හත්පත්තුවේ පුතා—එංගලන්තයේ ඔක්ස්ෆර්ඩ්, කේම්බ්‍රිජ් වැනි ලොකු විශ්ව විද්‍යාලවල ඉගෙන ගත් මහා පඬුවන්ට කරන්නට බැරි වූ හපන්කමක් කරමින් සිය පස් වන අයවැය ලේඛනය ඉදිරිපත් කර ඇති මේ අවස්ථාවේදී මටත් වචන ස්වල්පයක් කථා කරන්නට ඉඩදීම ගැන මා ගරු කථානායකතුමාට ස්තුතිවන්ත වෙනවා. මීට පෙර සිටි සමාජවාදී මුදල් ඇමතිවරයකු තම අයවැය කථාවේදී ප්‍රකාශ කර ඇත්තේ සමහරුන් මුදල් ඇමතිවරුන්ගෙන් විශ්මයජනක දේවල් බලාපොරොත්තු වන බවයි. ගරු මුදල් ඇමතිවරුන් තම අයවැය ලේඛන සකස් කරන අවස්ථාවේදී පදනමක් උඩ ක්‍රියා කරන නිසා, රටේ උන්නතිය සඳහා අයවැය ලේඛන සකස් කරන නිසා මිනිසුන් මවිත කරන අයවැය ලේඛන සකස් කිරීමට පුළුවන්කමක් නැහැ. මිනිසුන් මවිත කරන අය වැය ලේඛන සකස් කිරීමට හපන් මුදල් ඇමතිවරුන් එදා සිටියේත් නැහැ; අද ඇත්තේත් නැහැ; හෙට සිටින එකකුත් නැහැ. දේශපාලන මත උඩ ඇති කර ගෙන තිබෙන ආර්ථික පදනමකින් වේගවත් දියුණුවක් ලබා ගන්න නම්, වේගවත් සංවර්ධන ක්‍රමයක් පදනම් කරගෙන අයවැය ලේඛනය සකස් කළ යුතු බව තමුන්නාන්සේ දන්නවා. පසුගිය වර්ෂ හතරෙහිදී මෙන්ම මෙවර අයවැය ලේඛනයෙන් ද අපේ ගරු මුදල් ඇමතිතුමා වේගවත් සංවර්ධන ක්‍රමයකින් රට ස්වයංපෝෂණය කිරීම සඳහා ගෙන තිබෙන උත්සාහය ගැන රජයටත්, විශේෂයෙන් එතුමාටත් අපේ ප්‍රශංසාව හිමි වෙනවා. රටේ ස්වාභාවික ධනසම්පත් උපයෝගී කර ගනිමින් අපේ රට කාර්මික අතින් ද සංවර්ධනය කිරීම පිණිස ක්‍රමවත් වැඩ පිළිවෙළක් අනුව මේ රජය වැඩ කට යුතු කරගෙන යනවා. ඒ සඳහා අපේ ජාතික රජය ගෙන ඇති පියවර කුමක්ද?

ගරු කථානායකතුමනි, මට පෙර කථා කළ වලපනේ ගරු මන්ත්‍රීතුමා මෙම ස්ථානයේ නැහැ. එතුමා ගොවිතැන් ගැන, ගොවි රජවරුන් ගැන, හාල් සලාකය කැපීම ගැන, ඔය ආදී කාරණා රාශියක් ගැන සඳහන් කළා. එතුමා නවදුරටත් සඳහන් කළා දුප්පත් පෝසත් භේදය නැති කර දමන්න ඕනැය කියා. එය එසේ නම් අවුරුදු නවයක කාලයක් තිස්සේ එතුමන්ලාගේ රජය බලයේ සිටි කාලයේ එබඳු තත්ත්වයක් ඇති කිරීමට ක්‍රියා නොකළේ මන්ද කියා ප්‍රශ්න කරන්න කැමතියි. එසේ ක්‍රියා නොකර දැන් බොරු පුරසාරම් ගසා පැනයන්නේ නැතුව මෙතැන තව විනාඩි දහයක් පහළොවක් රැඳී සිටියා නම් ඒවාට පිළිතුරු ලබාගන්න තිබුණා.

ගරු කථානායකතුමනි, හාල් සලාක ක්‍රමය සම්බන්ධයෙන් එඩිතර පියවරක් මේ රජය ගත්තා. එනම්, රුපියල් දහසකට වැඩි මාසික ආදායමක් ලබන සියලු දෙනාම තමන්ගේ සහල් සලාක පොත් ආපසු රජයට දෙන්න ඕනැ, එසේ නැතිනම් ඒවාට බදු ගෙවන්න ඕනැ කියන නියමයක් රජයෙන් කළා. අප දන්නවා, වී ගබඩාවල් තිබුණු අය, මහ වී බිස්සවල් පුරවා ගෙන සිටි අය, ඒ වාගේම වී රැස්කර ගෙන තිබුනා ධනපති උදවිය තමන්ගේ වී ටික විකුණා හාල් සලාකය නොමිලයේ ලබා ගත් බව. බදු ගෙවිය යුතු අය එයින් ප්‍රයෝජනය මෙතෙක් කල් භුක්ති වින්දා. එය සම්පූර්ණයෙන්ම නතර කොට දුප්පත් ජනතාවට නොමිලයේ හාල් සලාකය දෙන්නටත්, ධනපති උදවියගෙන් බදු අය කර ගන්නටත් මේ රජය ක්‍රියා කර ඇති බව පෙනී යන නිසා වලපනේ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කළ තර්කය නිෂ්ඵල බව එතුමා මේ ගරු සභාවේ සිටියා නම් හොඳ හැටි වැටහී යනවා ඇති. සමහර අය තමන් බඩ බැඳුණත් බිහිරන් වාගේ ඉන්නවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විමලා කන්නන්ගර මිය.]
හොඳ හැටි කන් ඇසෙන උදවිය කන් නෑසෙන උදවිය වාගේ නෑසුණා වාගේ, එසේ නැතිනම් ඒ ගැන නොදන්නවා වාගේ හැසිරෙනවා. එමනිසා කන් නෑසෙන මන්ත්‍රීවරයකුගේ තත්ත්වයට වලපනෝ මන්ත්‍රීතුමා වැටෙනු දැකීම ඉතාම කනගාටු දායක සිද්ධියක් බව මතක් කරන්න කැමතියි.

ගරු කථානායකතුමනි, හාල් සලාකය සඳහා දරන්නට වූ වියදම පමණක් නොවෙයි, අපේ රටට ස්ථිර ආදායම් මාර්ගයන් වන තේ, රබර්, පොල්, කුරුඳු ආදී ද්‍රව්‍ය වල මිල ජාත්‍යන්තර වෙළඳපොළේ පහත වැටීම නිසා අපේ ආර්ථික පදනම බිඳ වැටී යාමේ තත්ත්වයක් තිබුණා, රට කනගාටු දායක තත්ත්වයකට මුහුණ දී තිබුණා. සාමාන්‍යයෙන් ජාත්‍යන්තර වෙළඳ පොලේ මෙම ද්‍රව්‍ය මිල ඉහළ ගියහොත් අපට වැඩි ආදායමක් ලැබෙනවා. පහත වැටුණොත් අපේ ජාතික ආදායම පහත වැටෙනවා. අපට ආර්ථික දුෂ්කරතාව—ඩිප්රෙෂන්—ඇති වෙනවා. අපේ මූලික ද්‍රව්‍යවලින් අපට ලැබෙන ආදායම—විනිමය—මෙතෙක් කල් සම්පූර්ණයෙන්ම අපට වැය කරන්නට සිදු වූයේ මොනවාටද? අධිරාජ්‍යවාදීන් අපේ රට අත්පත් කර ගත්තාට පසුව අප වහලුන් බවට පත් වුණා. අපේ ජාතික සම්පත් විනාශ වී ගියා. අපේ විශාල කුඹුරු යායවල්—පොලොන්නරුව, තිස්සමහාරාම ආදී ප්‍රදේශවල තිබුණු විශාල කුඹුරු යායවල්—මුඩුබිම් බවට පත් වුණා. හාල් සේරුව ශත 10 කට 15 කට ලබා ගන්න පුරුදු කර ජාතිය වහල් බවට පත් කළා. අතපය වෙහෙසා වැඩ කළ හැකි පිරිසක් වෙනුවට ලියන මහත්වරුන් පිරිසක් ඇති කළා. කෑම බීම පණක් නොවෙයි, ඇඳුම් පැළඳුම් ආදී සෑම දෙයක්ම නැවෙන් කටට එනතුරු, පිටරටින් අපට ලැබෙන තුරු බලාගෙන සිටියා. අපේ සරුසාර පොලොවේ වැවුණු තේ ගසින්, රබර් ගසින්, පොල් ගසින් ලැබුණු පලදාව විකුණා අප ලබා ගත්තේ මොනවාද? අපේ නිෂ්පාදනය දියුණු කළාද? අපට ප්‍රයෝජනයක් වන කිසි දෙයක් කළේ නැහැ. ලුනු ගෙඩිය, මිරිස් කරල, මේ සියල්ලක්ම පිටරටින් ගෙන්වා ගැනීමට අප පුරුදුවී සිටිනවා නම් අපේ රටේ නිෂ්පාදනයක් ඇති වෙනවාද? අපේ හොඳ දේවල් විකුණා නරක දේවල් ලබාගන්න, කටට රස ඇති දෙවල් ලබා ගන්න, අප පුරුදු වුණා. ලුනු ටික මිරිස් ටික නැති නම් අප කාටවත් කටට රසට බත් ටික කන්න බැහැ. මුල් කාලයේදී කාන්තාවක් වශයෙන් මමත් මේවා නතර කිරීම සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයේ රැස්වීමේදී කෑගැසුවා. කාන්තා වන් වශයෙන් අප කව්රුනුත් අපේ දරුවන්ට, සහෝදර සහෝදරියන්ට, ස්වාමිපුරුෂයන්ට හොඳට කන්ට දෙන්ට සතුටුයි. එහෙත් මේ දේවල් පිටරටින් ගෙන්වීමෙන් රට ගිහමනට වැටෙනවා නම්, අපේ තරුණ තරුණියන්ට රක්ෂා නැති වෙනවා නම් අපේ පාරවල් හරියා කාර හදන්නට බැරි නම් දිගටම මේ වැඩය කරන්නට බැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පසුගිය පස් අවුරුදු කාලය තුළදී පාරවල් අළුත්වැඩියා කිරීම නතර කළා. දිස්ත්‍රික් සම්බන්ධතා කාරක සභාවේදී පාරක් අළුත්වැඩියා කරන්නටය කිව්වම පාරවල් අළුත්වැඩියා කිරීම නතර කර තිබෙනවාය කියනවා. ඒ නිසා පාරවල වාහනයක් යන්නට බැරි තත්ත්වයක් ඇති වුණා. මෙවැනි දේ සිදු වීම නිසා රට ස්වයම් පෝෂිත වන්නෙ නැතිව තිබුනා; සංවර්ධන ක්‍රම ඇනහිටියා; අපේ තරුණ යන්ට රක්ෂා නැති වීම නිසා ඔවුන් කසිප්පු ජාවාරම්වලට, සූදුවට, සොරකමට පෙළඹුනා. එවැනි අවස්ථාවකදී පිටරටින් අල, ලූනු, මිරිස් ගෙන්වීම නතර කර ඒ මුදල් රටේ දියුණුව සඳහා කරන වැඩවලට යෙදුවා. පෝර, ගොවි උපකරණ වගී ආදිය වැඩිපුර ගෙන්වීමට වියදම් කළා. එක කොට්ඨාශයකට රෙදි වියන මධ්‍යස්ථාන 7 බැගින් ඇති කිරීමට, රෙදි වියන මධ්‍ය ස්ථාන සඳහා රුපියල් 2,500 බැගින් දුන් මුදල 6,500 දක්වා වැඩි කිරීමට, හැම ආසනයකම බල වේග යන්ත්‍ර ඇති කිරීමට වියදම් කළා.

රුසියාව, ජර්මනිය, වියට්නාමය, එංගලන්තය වැනි රටවල පසුගිය පනස් අවුරුදු කාලය තුළදී යුද්ධ ඇති වීම නිසා ඒ රටවල මව්වරුන්ට තමන්ගේ මස්, ලේවලින් පෝෂ්‍ය කළ දරුවන් යුද්ධයට යවා රට ආරක්ෂා කර ගැනීමට සිදු වුණා. තමන්ගේ දරුවන් පමණක් නොව ස්වාමි පුරුෂයන් පවා ඔවුන් රටේ උන්නතිය සඳහා පරිත්‍යාග කළා. එහෙත් පසුගිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පනස් අවුරුද්ද තුළ අපේ රටේ කාන්තාවන් වශයෙන් අප කළ පරිත්‍යාගය කුමක්ද? අපට පිටරටින් එන මෝස්තර සාරි ඕනෑ; හොඳ සුවඳ වගී ඕනෑ; ලක්ෂණ මුතු මැණික් ආදිය ඕනෑ. අපට මෙය අධිරාජ්‍යවාදීන් බෝ කළා. අපට රසට කේක් එක ඕනෑ; හැම් ටික ඕනෑ; බේකන් ටික ඕනෑ; ලූනු ටික ඕනෑ; මිරිස් ටික ඕනෑ; උම්බලකඩ ටික ඕනෑ. ඒවා පිටරටින් ගෙන්වීම නතර කිරීම නිසා කරන්නට සිදු වන සුළු පරිත්‍යාගය කිරීම නිසා අපේ රටේ දස දහස් සංඛ්‍යාත තරුණ තරුණියන්ට රක්ෂාව ලැබෙනවා නම් අප ඒ ගැන සතුටු විය යුතු නේද? එයින් අපේ රට ස්වයම්පෝෂිත වෙනවා නම් ඒ රසවත් කෑම ටිකක් අඩු වුණත් මව්වරුන් වශයෙන්, සිංහලයන් වශයෙන් පරිත්‍යාග ශීලීව, සිනහ මුහුණින් අප එය පිළිගත යුතු නේද?

සෑම ආසනයකින්ම තෝරා ගත් 40,000ක් පමණ අද ගොවි හමුදාවේ සිටිනවා. කව්ද මේ ගොවි හමුදාවෙ ඉන්නෙ? මමත් ගලිගමුව ආසනයේ ගම් පුරා ගිහින් කිව්වා, මව්වරුනි, සහෝදර සහෝදරියනි, අපට වුවමනා ලූනු ටික, මිරිස් ටික, අල ටික පිටරටින් ගෙන්වීම නතර කළා, දැන් මේවායින් අපේ රට ස්වයම්පෝෂිත කළ යුතුය කියා. එවිට ඒ වැඩ සඳහා තමන්ගේ දරුවන් ඉදිරිපත් කිරීමට ඔවුන් ලෑස්ති වුණා. අවුරුදු 18 ත් 25 ත් අතර වූ තමන්ගේ දරුවන් කොහේ යනවාද කියා ඒ මව්වරුන් දන්නෙ නැහැ. ඔවුන් රාජාංගනය, මින්නේරිය, ලග්ගල, යාපහුව වැනි පළාත්වලට ඇරියා. මමත් මේ අය බලන්නට ගියා, රාජාංගනයට. ඔවුන්ගේ වැඩ දකින විට පුදුමයි. කණිෂ්ඨය, ජ්‍යෙෂ්ඨය සමත් මේ තරුණයන් කොට කාකි කලිසම් ඇඳගෙන හෙන ගිනි අව්වේ, ගල් කඩමින්, පස් කපමින්, දූවිලි උරමින් මොකද කරන්නේ? පෙර කාලවල මෙන් යෝධ වැව් අමුණු බැඳගෙන ඒ මුඩු බිම් සාරවත් බිම් කොට අපට අවශ්‍ය ලූනු ටික, මිරිස් ටික, අල ටික වවන්නට කටයුතු කරනවා. එසේ නම් අප ඒ ගැන සතුටු විය යුතු නේද? මේ ආණ්ඩුව විප්ලවයක් කොට වහල් බැමි කඩා දමා ජාතියක් වශයෙන් හිස එසවීමට අපට මාර්ගය සලසා දී තිබෙනවා. එහෙනම් මිරිස් ටිකට ලූනු ටිකට ටිකක් වැඩිපුර දෙනවය කියා ඒ මුදල යන්නේ තමන්ගේ පරම්පරාවට නැත්නම් ජාතියට නම් ජාති ඇල්මක් ඇති කෙනෙක් එයට විරුද්ධ වේද? ඒ නිසා ලූනු මිරිස් ගැන කෑගහන අය දැන් නිහඬ වී සිටින්නේ ඔවුන්ට තත්ත්වය හොඳින් අවබෝධ වී තිබෙන නිසයි.

වලපනේ ගරු මන්ත්‍රීතුමා ගොවිතැන ගැන නොයෙක් දේවල් කිවා. එතුමාගේ කථාව නම් ඉතාම බංකොළොත් කථාවක්. අපි මෙහි හතර අවුරුද්දක්ම එතුමාගේ කථා අහගෙන හිටියා. අපි බලාගෙන ඉන්නේ අමුතුවෙන් කියන්නට යන්නේ මොනවාද කියලයි. එහෙත් එකම ටේප් රෙකෝඩ් එකමයි හැමදාම ගහන්නේ. ඉඩම් බදුදීම ගැන කී වරක් ප්‍රශ්න කළාද? හරියට දැවැද්දට දුන්නා වගෙයි කියන්නේ. කරුවල ආදී ගස් වර්ග ගැන හැමදම කියනවා. විරුද්ධ පාර්ශ්වයේ නායිකාවත් ඔය ප්‍රශ්නය මතු කළා. ගරු අගමැතිතුමා එයට පිළිතුරුත් දී තිබෙනවා. වලපනේ ගරු මන්ත්‍රීතුමා අදත් කියන්නේ ඒ ගැනමයි. මේක මහජන මුදල් නාස්තිකිරීමක් නේද? වලපනේ ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නවලට පිළිතුරු ඕනෑ නම් හැන්සාඩ් වාර්තා බැලුවාම බලා ගන්න පුළුවන්. ඕවාට පිළිතුරු දී තිබෙනවා.

එතුමා තවත් කථාවක් කිව්වා. ගොවියා රජ කළාය ගොවීන්ට ඕනෑ තරම් මුදල් තිබෙනවාය කියා ගරු අගමැතිතුමාත් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් රට පුරා කියාගෙන යනවාය, එය අමූලික බොරුවක්ය කියා එතුමා කීවා. ටිකක් දුරට කථාව කරගෙන ගියාට පසුව හරිම පුදුම කථාවක් කිව්වා. වෙනදාට වඩා මෙවර තැන්පත් මුදල් වැඩි වී තිබෙනවාය කියා ගරු මුදල් ඇමතිතුමා මේ අයවැය ලේඛනයෙන් කියනවාය, එසේ වැඩි වීමට හේතුව ගොවීන් ග්‍රාමීය බැංකුවල මුදල් තැන්පත් කිරීමයි කියා එතුමා කිව්වා. මොකක්ද කියන සිංහලය? එක අතකින් කියනවා ගොවියා දියුණුවක් ලබා සිටිනවාය කියන එක බොරුවක්ය කියා. අනික් අතින් කියනවා තැන්පත් මුදල් වැඩි වී තිබෙන්නේ ගොවීන් වැඩිපුර මුදල් තැන්පත් කළ නිසාය කියා. එහෙනම් ගොවීන්ගේ ආදායම් තත්ත්වය වැඩි වී තිබෙනවා කියා ගරු අගමැති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විමලා කන්නන්ගර මිය.]

තුමාත් මන්ත්‍රීවරුනුත් කියන කියමන හරියටම හරි. එය ස්ථිර කිරීම ගැන වලපනේ ගරු මන්ත්‍රීතුමාට මා ස්තුතිවන්ත වෙනවා.

වලපනේ ගරු මන්ත්‍රීතුමා එතුමාගේ කථාවෙන් පරාජිත බව පෙන්වා ඒ පරාජිත භාවය නිසාම මෙතැනින් පැන ගියා. මා හිතාගෙන නම් හිටියේ වලපනේ ගරු මන්ත්‍රීතුමාට පිළිතුරු දෙන්න ටිකක් අමාරු වෙයි කියලයි. ඉස්සර නම් එතුමාගේ වචනත් සැරයි. දැන් නම් හොඳට හික්මිලා. අපේ රජය හොඳ වැඩ කොටසක් කර තිබෙන නිසා ලොකුම විරුද්ධකාරයෙක් වූ ඒ මන්ත්‍රීතුමාට කියන්නට දෙයක් නැතිව බංකොළොත් වී පැනගිය බව එයින්ම පෙනෙනවා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

Order, please! The Sitting is suspended until 2 P.M.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් සිටුවන ලදින්, අ. භා. 2 ට නැවත පවත්වන ලදී.**

*அதன்படி அமர்வு இடை நிறுத்தப்பட்டு, மீண்டும் பி. ப. 2 மணிக்கு ஆரம்பமாயிற்று.*

*Sitting accordingly suspended till 2 P.M. and then resumed.*

**විමලා කන්නන්ගර මිය.**
*(திருமதி விமலா கன்னங்கர)*
(Mrs. Wimala Kannangara)

කථානායකතුමනි, විසි අවුරුද්දකට අධික කාලයක් ගම්බද ජනතාවට සේවය කර ඇති, ගැමි ජනතාවගේ නියෝජිතයෙක් වශයෙන් පෙනී සිටින මට නිර්භයව කියන්නට පුළුවනි, ගම්බද ප්‍රදේශවලට මේ රජයෙන් ඉමහත් සේවයක් සිදු වී තිබෙන බව. දුප්පත් ගම්බද ජනතාව දියුණු ජන සමූහයක් බවට පරිවර්තනය කිරීම සඳහා විශ්මය ජනක වැඩ පිළිවෙළක් මේ රජයෙන් ගෙන ගොස් තිබෙනවා. අද ගම්බද ජනතාවගේ ගෙමිදුල්වලටම ග්‍රාමීය බැංකු ලබා දී තිබෙන නිසා, කෘෂිකාර්මික හා කාර්මික වැඩ සඳහා ණය ලබා ගැනීමේ පහසුව ඔවුන්ට සැලසී තිබෙනවා. ජාතික රජය මගින් අළුතින් ගම් 500 කට විදුලි බලය ලබා දීමේ වැඩ පිළිවෙළක් ඇති කර තිබෙන නිසා නගරවල මෙන්ම ගම්වලත් කාර්මික දියුණුවක් ඇති කිරීමේ අවසථාව දැන් ලැබී තිබෙනවා. වැව් අමුණු ප්‍රතිසංස්කරණය කිරීමත්, ගොවියන්ට වුවමනා කරන පෝර හා වෙනත් අවශ්‍ය දේවල් පහසුවෙන් ලබා දීමත් නිසාම අපේ ආහාරයෙන් සියයට 75 ක්ම සපයා ගන්නට තරම් ප්‍රමාණවත් අස්වැන්නක් ලැබී තිබෙන බව සඳහන් කරන්නේ සන්තෝෂයෙන්.

මේවායින් පැහැදිලි වන්නේ මොකක්ද? මුදල් ඇමතිතුමා ඇතුළු වර්තමාන ජාතික රජයම ආර්ථික සංවර්ධනය පිළිබඳ නියම අවබෝධයකින් යුතුව, නිසි සැලැස්මක් ඇතිව වැඩ කරන බවයි. අපට වුවමනා කරන ආහාර ද්‍රව්‍ය මෙහිම නිෂ්පාදනය කිරීමට ජනතාව පෙළඹවීම නිසා ගොවි මහතුන්ට වැඩි ආදායමක් ලැබුණ අතර, මෙතෙක් හාල්, මිරිස්, ලූනු ආදිය සඳහා පිටරට ඇදී ගිය විශාල මුදලින් සැහෙන ප්‍රමාණයක්ද මේ රටේම ඉතිරි කර ගන්නට පුළුවන්කම ලැබුණා. එසේ ඉතිරි කර ගත් මුදලින් කාර්මික සංවර්ධනයක් ඇති කරන්ටයි, දැන් ජාතික රජය කටයුතු කර ගෙන යන්නේ. ගොවි ජනතාව වැඩි මුදලක් ලැබෙන විධියට එසේ කටයුතු කිරීම නිසාම, අපේ විදේශ විනිමය ඉතිරි කර ගෙන මේ රටේ කාර්මික යුගයක් බිහි කරන්නට පවා පුළුවන්කම ලැබී තිබෙනවා. එහෙත් අප එතෙකින් සෑහීමට පත් වන්නට හොඳ නැහැ. වැඩි වන ජනගහනයට සරිලන අන්දමට මේ රට සියයට සියයකින්ම ස්වයංපෝෂණය කිරීමට අප උත්සාහ කළ යුතුව තිබෙනවා. පසුගිය අවුරුදු 4½ තුළ මේ රට ආහාරයෙන් ස්වයංපෝෂණය කිරීම සඳහා වර්තමාන ජාතික රජය ගත් එඩිතර ක්‍රියා මාර්ගය කෙරෙහි මේ රටේ බහුතර ජනකාය ප්‍රසාදය පළ කරන නිසා, ඉදිරි අවුරුදු පහ තුළ මේ රට නවදුරටත් ස්වයංපෝෂණය කිරීම සඳහා ඔවුන් යළිත් වරක් මේ රජයම බලයට පත් කරන බවට මට නම් කිසිම සැකයක් තුමාගේ (ටී. බී. එම්. හේරත් මයා.) අරුම නැහැ.

ඊළඟට නැවතත් වලපනේ ගරු මන්ත්‍රී පුදුම කථාව ගැන වචනයක් දෙකක් කියන්නට මා අදහස් කරනවා. මේ රජය බලයට පත් වූ දා සිට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, ලංකා සමසමාජ පක්ෂය හා ලංකා කොමියුනිස්ට් පක්ෂයත් ගෙන ගිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වැඩ පිළිවෙළ අප කවුරුත් හොඳින් දන්නවා. 1968 ජනවාරි 8 වැනි දින රජයේ සේවකයන් වැඩ වර්ජනයකට පෙළඹවීමෙන් විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් බලාපොරොත්තු වුණේ මොකක්ද? ඒ හේතුවෙන් රජයේ සේවකයන් ගණනාවකට රක්ෂා පවා අහිමි වුණා. පසුගිය අවුරුද්දේදීත් ඔවුන් නැවතත් රජයේ සේවකයන් වැඩ වර්ජනයකට පෙළඹුවා. රජයේ සේවකයන් සටන් කරන්නේ වැඩි පඩි ලබා ගැනීමට යයි එතුමන්ලා එදා කීවා. එහෙත් වලපනේ ගරු මන්ත්‍රීතුමා අද කීවේ මොකක්ද? පඩි වැඩි කිරීම නොවෙයි, අප අදහස් කළේ බඩු මිළ අඩු කිරීමය කියා දැන් එතුමා කියනවා. බඩු මිළ වැඩි නිසා පඩි වැඩි කිරීමෙන් වැඩක් නැතිලු. මට මේ අවස්ථාවේදී අර නරියාගේ කථාව මතක් වෙනවා. මිදි කන්න උඩ පැන, බැරි තැන මිදි තිත්තය කියා නරියාත් කීවාලු. ඒ වාගේ තමයි, විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන්ගේ එදා කථාවයි, අද කථාවයි. එතුමන්ලාට කියන්න දෙයක් නැතිව හතර බීරි කථා කියනවා. වලපනේ ගරු මන්ත්‍රීතුමා දැනුත් මේ ගරු සභාවේ නැහැ. දිවා භෝජනයට කලින් එතුමාට පිළිතුරු දෙමින් මා කථා කළ අවස්ථාවේදීත් එතුමා මේ ගරු සභාවේ නොසිට පැන ගියා. එම නිසා තව දුරටත් එතුමාගේ කථාවට පිළිතුරු දෙන්න වුවමනා නැහැ.

මුදල් දුෂ්කරතා තිබෙද්දීත් රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම සඳහා ජාතික රජය ගත් මේ ඓතිහාසික පියවර නිසා, ඔවුන් රජය කෙරෙහි ලොකු ඇල්මකින් පසු වෙනවා. ඒ සඳහා කළගුණ සළකන්න රජයේ සේවකයන් දැන් බලා සිටිනවා. මේ අවස්ථාවේදී රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීමේ සටන පිළිබඳ ඉතිහාසය ගැනත් ටිකක් සොයා බලන්න ඕනෑ. 1946 දී, ඕ. ඊ. ගුණතිලක සහ සී. එච්. කොලින්ස් මහත්වරුන්ගේ වැටුප් කමිටුවේ වාර්තාව පොදුවේ ක්‍රියාත්මක කළා. ඉන් පසු 1953 දී එච්. ඊ. පෝලියර් මහත්මයාගේ ප්‍රධානත්වයෙන් පත් කළ කමිටුවේ වාර්තාවත් ක්‍රියාත්මක කළා. ඉන් පසු 1957 දී ක්‍රිස්ටෝෆල්ස් මහත්මයාගේ ප්‍රධානත්වයෙන් පත් කළ වැටුප් විෂමතා කමිටුවේ වාර්තාවත් පොදුවේ ක්‍රියාත්මක කළා. ඒ කමිටුවෙන් කළේ වැටුප් විෂමතාවන් හරිගැස්සීම පමණයි. ඔය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවෙන් කළේ වැටුප් විෂමතාවන් හරිගැස්සීම පමණයි. නමුත් එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව පෝලියර් වාර්තාවේ නිර්දේශ සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කළා.

රජයේ සේවකයා වැඩි පඩි ඉල්ලා දිගටම සටන ගෙන ගියා. ඒ සටනේ ප්‍රතිඵලයක් වශයෙන් ඊළඟට විල්මට් පෙරේරා මහත්මයාගේ ප්‍රධානත්වයෙන් කොමිෂන් සභාවක් පත් කළා. වැටුප් වැඩි කරනවාට වඩා බඩු මිළ පහත හෙළීම සුදුසුය කියනවා නම් ඒ කාලයේ විල්මට් පෙරේරා මහත්මයාගේ ප්‍රධානත්වයෙන් වැටුප් වැඩි කිරීම පිළිබඳව සොයා බලන්නට කොමිෂන් සභාවක් පත් කළේ මක්නිසාද කියා මා වලපනේ ගරු මන්ත්‍රීතුමාගෙන් ප්‍රශ්න කරනවා. මෑතක් වන තෙක් ඒ වාර්තාව තිබුණා. කම්කරු නායකයකු වන ආචාර්ය එන්. එම්. පෙරේරා මුදල් ඇමති වශයෙන් සිටියදී කම්කරු පක්ෂයත් රජයේ සේවකයනුත් ඒ වාර්තාව ක්‍රියාත්මක කරන මෙන් ඉල්ලීමක් කළා. නමුත් එතුමා රටේ භයානක තත්ත්වයක් තිබෙනවාය කියා ඒ වාර්තාව කුණු බාල්දියට දැම්මා නේද?

ඊට පසු 1967 දී ස්ථිර ලේකම් කෙනෙකු වූ ඒ. ඕ. වීරසිංහ මහත්මයාගේ ප්‍රධානත්වයෙන් තවත් වැටුප් විෂමතා කමිටුවක් පත් කළා. ඒ අනුව එක් එක් අමාත්‍යාංශය පිළිබඳව නිර්දේශ නිකුත් කළා. 1968 මැයි මාසයේ සිට සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සේවාවන්හි පමණක් ඒ නිර්දේශ පළමු වන වරට ක්‍රියාත්මක කළ බව මා ආඩම්බරයෙන් කියන්නට සතුටුයි.

නමුත් රජයේ සේවකයා එතැනින් සටන නතර කළේ නැහැ. මේ තිබෙන ආර්ථික පදනම උඩ, බඩු මිළ ඉහළ යෑම ආදී ප්‍රශ්න උඩ තමන්ටත් පඩි වැඩි කළ යුතුය කියා රජයේ සේවකයා දිගටම සටන් කළා. ඒ ගෙන ගිය සටනේ ප්‍රතිඵලයක් වශයෙන් 1969 දී එල්. බී. ද සිල්වා මහත්මයාගේ ප්‍රධානත්වයෙන් වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිෂන් සභාවක් පත් කළා. 1969 මුල් භාගයේදීම ඒ කොමිෂන් සභාවේ අතුරු වාර්තාවක් නිකුත් කළා. මූලික වශ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විමලා කන්නන්ගර මිය.]

යෙන් දැනට ගෙවන මූලික වැටුප සහ ගෙවල් කුලිය ආදී දීමනා වැඩි කිරීමට ඒ කොමිෂන් සභාව නිර්දේශ කර තිබෙනවා. ඉතා භයානක ආර්ථික ප්‍රශ්නයක් තිබුණත් අප ඒ නිර්දේශ ක්‍රියාත්මක කරන්නට තීරණය කර තිබෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුවේ අවසාන කාලයේදී, ලංකා සමසමාජ පක්ෂයේ නායකතුමාට මුදල් ඇමතිකම භාර දී තිබුණු කාලයේ දී රටේ යම් ආර්ථික අර්බුදයක් තිබුණාද එවැනිම අර්බුදයකට අද අපටත් මුහුණ පාන්නට සිද්ධ වී තිබෙනවා. තෝ මිළ භයානක ලෙස පහත වැටී තිබෙනවා. එම නිසා ජාතික ආදායමෙන් සියයට හැටක් පමණ නැති වී තිබෙනවා. එවැනි තත්ත්වයක් තිබෙන්නේ වී නමුත් ගරු අගමැතිතුමා දුන් පොරොන්දුව අනුව ඔක්තෝබර් 1 වන දින සිට එල්. බී. ද සිල්වා වාර්තාව ක්‍රියාත්මක කිරීම ගැන ඇත්ත වශයෙන්ම මේ ආණ්ඩුවට ප්‍රශංසා කළ යුතුයි.

මේ වාර්තාවේ මූලික ලක්ෂණයක් නම් මූලික වැටුපට සියලුම දීමනා ඒකාබද්ධ කිරීමයි. ගෙවල් කුලිය, ජීවනාධාර දීමනාව, විශේෂ ජීවනාධාර දීමනාව, රුපියලේ අගය අඩු කිරීම නිසා දුන් අතුරු දීමනාව, ආදී සියල්ලක්ම ඒකාබද්ධ කර වැඩි වැටුප් ක්‍රම පිළියෙළ කර තිබෙනවා. එපමණක්ද? විවාහක රජයේ සේවකයා ගැන විශේෂයෙන් කල්පනා කර තිබෙනවා. ගෙදර සිටින දරු මල්ලන් සහ භාර්යාව අමතක කර නැහැ. කාන්තාවන් අමතක නොකරන දරු දැරියන් ඇති පියකු වන අපේ ගරු මුදල් ඇමතිතුමා විශේෂයෙන්ම විවාහක රජයේ සේවකයන්ට මසකට රුපියල් 100 ක් දෙන්නට තීරණය කර තිබෙනවා. එසේ නම් ගරු මුදල් ඇමතිතුමා අමතක කර තිබෙන්නේ කාවද කියා මා වලපනේ ගරු මන්ත්‍රීතුමාගෙන් ප්‍රශ්න කරනවා. ගරු මුදල් ඇමතිතුමාට ගම්බද ගොවියා අමතක වී නැහැ. ගෙදර සිටින රජයේ සේවකයාගේ භාර්යාව සහ දරු දැරියන් අමතක වී නැහැ. එසේ නම් මේක ඒ සියලු දෙනා ගැනම මතක තබාගෙන පිළියෙළ කළ අය වැය ලේඛනයක් නොවේද කියා මා ප්‍රශ්න කරනවා. හැම දෙනා ගැනම මතක තබාගෙනයි මේ අයවැය ලේඛනය සකස් කර තිබෙන්නෙ.

ඒ වගේම මෙම නිර්දේශයන් පමණක් නොවෙයි සැලකිල්ලට භාජන කර තිබෙන්නෙ. ගිය වර්ෂයේදී සුළු සේවකයන් විසින් අගමැතිතුමාගෙන් ඉල්ලීමක් කර තිබෙනවා. සුළු සේවකයන් යනුවෙන් හැඳින්වෙන්නේ උපස්ථායකවරුන්, කුස්සිවල උයන උදවිය, කම්කරුවන්, වැසිකිළි කැසිකිළිවල සේවය කරන අය ආදී පිරිසයි. ඒ අයට අතිරේක දීමනාවක් දෙන්නය කියා අගමැතිතුමාගෙන් ඉල්ලා සිටියා. මෙම ඉල්ලීම ආචාර්ය එන්. එම්. පෙරේරා මහතා මුදල් ඇමතිව සිටි කාලයේදීත් ඉල්ලුවා. ඉලංගරත්න මහතා මුදල් ඇමතිව සිටි කාලයේදීත් ඉල්ලා සිටියා. නමුත් මේ සුළු සේවකයන්ට ඒ අයගෙන් කිසිම සහනයක් ලැබුනේ නැහැ. නමුත් අපේ ගරු අගමැතිතුමා රුපියල් 10 ක අතිරේක දීමනාවක් ලබා දී ගිය වර්ෂයේ සිට තවත් රුපියල් 10 ක් ලබා දීමෙන් ඔවුන්ගේ ඉල්ලීම සියයට සියයකින්ම ඉටු කර තිබෙනවා. දුප්පත් කම්කරු ජනතාවගේ අහිංසක දුක්ගැනවිලි ගැන එතුමාට වැටහීමක් ඇති වුණ නිසයි, ගරු අගමැතිතුමා එවැනි සහනයක් ඒ අයට ලබා දුන්නෙ. ඒ ලබා දුන් සහනය ගැන දුප්පත් කම්කරු ජනතාව සදාකාලිකවම එතුමාට ප්‍රශංසා කරන බවත් ණයගැති බවත්, ඒ අය අද සඳහන් කරනවා. කම්කරු නායකයන්ය කියා ගන්නා උදවිය, කම්කරු රජයක් පිහිටුවන්නය කියා ඡන්ද ලබා ගන්නා උදවිය, කම්කරුවන් දියුණු කිරීමටය කියා බලය ලබා ගන්නා උදවිය නොකළ දෙයක්, ඒ අයට කරන්න බැරි වුණ දෙයක්—වලපනේ මන්ත්‍රීතුමා කිව්වා ධනපති රාමුවක සිට මේ කටයුතු කර ගෙන යන්න බැරිය කියා— මේ සමාජවාදී ආණ්ඩුවට කරන්න පුළුවන් වුණ බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනැ. කම්කරු නායකයින්ටත් කරන්න බැරි වූ දෙයක් මේ ආණ්ඩුව විසින් අද කර තිබෙනවා. ඒ නිසා මා මේ ගැන තව දුරටත් කියන්න යන්නේ නැහැ. ඉදිරියේදී කතා කරන අනිකුත් ඇමතිවරුන් ගෙන් තවත් විස්තර දැනගන්න පුළුවන් වේවි.

ගරු කථානායකතුමනි, මගේ කථාව අවසන් කරන්න පෙර සෞඛ්‍යය සම්බන්ධ වත් යමක් කිව්වේ නැත්නම් මගේ කතාව සම්පූර්ණ වෙන්නේ නැහැ. සෞඛ්‍යය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සම්බන්ධයෙන් මොනවාද අපි කර තිබෙන්නේ කියා බොහෝ අවස්ථාවලදී අපට දෝෂාරෝපණය කර තිබෙනවා. නමුත් මන්ත්‍රීවරුනුත් මහජනතාවත් ටිකක් සවන් දිය යුතුයි, මේ අවුරුදු 4 ඇතුළතදී මේ රජය විසින් රෝගීන්ගේ පහසුව තකා කර තිබෙන්නේ මොනවාද කියා දැනගැනීමට, දුක් විඳින දුප්පත් රෝගීන්ට නොමිළේ බෙහෙත් දීම ආරම්භ කළ මේ එක්සත් ජාතික පක්ෂය නැවත වරක් බල යට ආ විට මොනවාද ලබා දී තිබෙන සහන කියා තමුන්නාන්සේලා සොයා බැලුවොත් තමුන්නාන්සේලා හිතාවි, සියයට සියයක්ම සහයෝගය දී මේ ආණ්ඩුව තව දුරටත් ඉදිරියට ගෙන යා යුතුය කියා.

1965 දී ඇපොතිකරි ක්‍රමය නැතිකර දමා ග්‍රාමීය ආරෝග්‍යශාලාවලට වෛද්‍යවරුන් නැත්නම් දොස්තර මහත්වරුන් පත් කරන්න කටයුතු කළා. අද මුළු අග්නිදිග ආසියාවේ සෞඛ්‍ය කටයුතු අතින් ප්‍රධාන ස්ථානයක් අපේ රටට හිමි වෙනවා. සෑම මිනිසුන් 4,000 කටම එක දොස්තර මහත්මයෙක් වෙන්න අපි දැන් පත් කර සිටිනවා. පෞද්ගලික දොස්තරවරුන් ආයුර්වේද දොස්තරවරුන් හැරෙන්නයි ඒ. අග්නිදිග ආසියාවේ රටවල් වන බුරුමය, ඉන්දියාව, පාකිස්ථානය, මැලේසියාව ආදී රටවල් අතුරෙන් දොස්තරවරුන්ගේ සංඛ්‍යාව අනුව අපට ප්‍රධාන ස්ථානයක් හිමි වෙනවා. එපමණක් නොවෙයි, හෙදි සංඛ්‍යාව 2,450 කින් වැඩි කර තිබෙනවා. අපි මේ රජය බාර ගන්නා කාලයේදී තරග විභාගයක් පවත්වා හෙදියන් බඳවා ගැනීමේ ක්‍රමයක් තිබුණා. මේ විධියට ග්‍රාමීය ආරෝග්‍යශාලාවලට පත් කරන හෙදියන් වැසිකිළි නැත, ඉන්න තැනක් නැත, ආදී වශයෙන් කියමින් ලොකු ලොකු පුද්ගලයන් අල්ලා ගෙන වෙන පළාත්වලට මාරුවීම් සකස් කර ගත්තා. මෙහි තිබෙන අසාධාරණකම මට විශේෂයෙන්ම පෙනී ගියා. මේ තත්ත්වය නැති කළ යුතු බව මට වැටහුණා. අපේ ගම්වල හොඳ වටිනා ළමයින්, ජ්‍යෙෂ්ඨ සමත්, කණිෂ්ඨ සමත් ගැහැනු පිරිමි ළමුන් කොතෙකුත් සිටිනවා. රැකියාවල් නැතිව සිටින අය කොතෙකුත් ගම්වල සිටිනවා. මා අපේ මන්ත්‍රීවරුන් සමග මේ කාරණාව ආණ්ඩු පක්ෂයේ රැස්වීමකදී ඉදිරිපත් කර ඒ සඳහා අප ඉදිරියෙන් සිටින ගරු සෞඛ්‍ය ඇමතිතුමාගේ අවධානය යොමු කෙරෙව්වා. එතුමාගෙන් අපට අනුමැතියක් ලබාගන්න පුළුවන් වුණා. ආදායම් පාලක ප්‍රදේශ අනුව, ජනගහනය අනුව, ඒ ඒ ප්‍රදේශවලට අවශ්‍ය හෙදියන් පත් කර ගන්නය කියා එතුමාගෙන් අනුමැතියක් ලැබුණා. එයින් ගම්බද තරුණ තරුණියන්ට විපුල ප්‍රයෝජනයක් ලැබුණා. එමෙන්ම නිවාස යෝජනා ක්‍රම ආදිය ඇති කිරීමෙන් ඈත ප්‍රදේශවලට යන්න බැරිය කියන අදහස බොහෝ අය තුළින් සම්පූර්ණයෙන්ම ඈත් වී ගියා.

අපට බොහෝ දෙනා නිතර නිතරම වාගේ දරු උපත් පාලනය කරන ආණ්ඩුව යන නම යොදනවා. ඒ වාගේම සෞඛ්‍ය අමාත්‍යාංශයට දරු උපත් පාලනය කරන අමාත්‍යාංශය යන නම යොදනවා. මව්වරුන් දරු උපත් පාලනය කරන්නේ සිය කැමැත්තෙනුයි. වැඩිපුර ළමයින් ලැබීම අයෝග්‍යය කියා කල්පනා කරන උදවියට තමන් කැමති අන්දමට පාලනය කරන්නට පුළුවනි. මව්වරුන් උපත් පාලනය කරන්නේ සතුටින්.

දරුවන් ලැබෙන මව්වරුන්ගේ සුභ සිද්ධිය සඳහා මේ ආණ්ඩුව වින්නඹු මාතාවන් වැඩිපුර පත් කර තිබෙනවා. අප පාලනය භාර ගන්න අවස්ථාව වන විට ලංකාවේ සිටියේ වින්නඹු මාතාවන් දෙදහක් පමණයි. වුවමනා වේලාවට වින්නඹු මාතාවන්ගේ සේවය ලබා ගන්නට බැරිවීම නිසා ලග්ගල, යාපහුව වැනි පාරවල් අඩු ප්‍රදේශවල මව්වරුන් ගණනාවක් දරු ප්‍රසූතියේදී මිය ගියා. 1965 දී ජනගහනයෙන් 20,000කට එක් වින්නඹු මාතාවක බැගින් පමණයි සිටියේ. ඒ තත්ත්වය බිඳ දමා, මවගේත් ඇයට ලැබෙන්නට සිටින දරුවාගේත් ජීවිත දෙකම ආරක්ෂා කර දීම සඳහා ජනගහනයෙන් තුන්දහකට වින්නඹු මාතාවක බැගින් පත් කරන්නට අපේ ආණ්ඩුව තීරණය කළා. අපේ ඒ ප්‍රතිපත්තිය අනුව දැනටමත් වින්නඹු මාතාවන් 1,255ක් පත් කර සිටිනවා. මේ අයවැය ලේඛනයෙන් තවත් වින්නඹු මාතාවන් දාහකට පත්වීම් දෙන්නට බලාපොරොත්තු වෙනවා. ඈත ප්‍රදේශවලට දැනටමත් පත්වීම් දී අවසානයි. ඉදිරි කාලයේදී ඉතිරි ප්‍රදේශවලටත් වින්නඹු මාතාවන් යවනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විමලා කන්නන්ගර මිය.]

රටේ ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා ඉදිරි කාලයේදී තව තවත් දොස්තර මහත්වරුන් මෙන්ම සාත්තු සේවක සේවිකාවන්ද වැඩි කරන්නට යනවා. ආරෝග්‍යශාලාවල ඇඳන් සංඛ්‍යාව 1,500කින් වැඩි කිරීමට කටයුතු කර තිබෙනවා. රු. 5,20,00,000ක් වියදම් කොට මහියන්ගනය, මස්කෙලිය, කෑගල්ල වැනි ආරෝග්‍යශාලා රාශියක් මෙන්ම මාතෘ නිවාස රාශියක්ද තනා තිබෙනවා.

මේ අනුව සලකා බලන විට මේ ආණ්ඩුව ගොවි ජනතාවටත්, දුප්පත් රෝගීන්ටත්, වෙනත් අංශවලටත්, පොදුවේ සෑම දෙනාටත් විශාල සේවයක් කර තිබෙන බව පෙනී යනවා ඇති. මේ රට කිරියෙන් සහ පැණියෙන් උතුරා යන තැනට කටයුතු කිරීමේ අපේ මූලික පරමාර්ථය බොහෝ දුරට ඉටු වී තිබෙන බව දැන් ජනතාව පිළිගෙන තිබෙනවා. ආර්ථික අමාරුකම් කොපමණ තිබුණත් අපට තිබුණු හැකියාවන් අනුව පුළුවන් තරම් දේවල් කර තිබෙන බව ජනතාව පිළිගන්නවා ඇති. අපේ ආර්ථික පදනම වඩාත් වැඩි දියුණු කර මීටත් වඩා වේගවත් ලෙස දියුණුව කරා ගමන් කරන්නට අපි බලාපොරොත්තු වෙනවා. අප බලයේ සිටි කෙටි කාලසීමාව තුළ ජනතාවගේ සම්පූර්ණ සහයෝගය අපට ලැබුණා. ඒ අනුව එක්තරා ප්‍රමාණයක් වැඩ කරන්නට අපට පුළුවන් වී තිබෙනවා. මේ කාල සීමාව ඇතුළත හැම දෙයක්ම කරන්නට කොයිම ආණ්ඩුවකට වත් පුළුවන්කමක් නැති බව ජනතාව පිළිගන්නවාට සැකයක් නැහැ.

ලක්වැසි අපේ සහෝදර ජනතාවගේ සහයෝගය ඇතිව වැඩ කටයුතු කර ගෙන යෑම නිසා අපේ ආණ්ඩුවට පස්වැනි අය වැය ලේඛනයත් ඉදිරිපත් කරන්නට පුළුවන් වුණා. එක්සත් ජාතික පක්ෂයේ අපේ ආණ්ඩුවට නැවතත් වරක් මීටත් වඩා දීප්තිමත් අයවැය ලේඛනයක් ඉදිරිපත් කිරීමේ අවස්ථාව ලැබෙන අතර අපේ වර්තමාන මුදල් ඇමතිතුමාටම නැවතත් වරක් මුදල් ඇමතිවරයා වීමේ භාග්‍යය ලැබෙනවාට සැකයක් නැහැ. එතුමා කෙරෙහි මහජන විශ්වාසය තිබෙනවා. මහජන යහපත ඉටු වන ආකාරයට වැඩ කරන අන්දමත් එතුමා හොඳාකාර දන්නවා. ඉදිරි කාලයේදී සෞභාග්‍යමත් ලංකාවක් ඇති කිරීමට සෑම දෙනාගේම සහයෝගය ලැබෙනවා නිසැකයි. දීප්තිමත් අනාගතයක් අපේ ජනතාවට ලබා දීමට නිතර නිතර වෙහෙස මහන්සි වන මේ ආණ්ඩුවට ස්තුති කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. භා. 2.19

**ලීලාරත්න විජේසිංහ මයා.** (පොළොන්නරුව)

*(திரு. லீலாரத்ன விஜேசிங்க—பொலன்னறுவை)*

(Mr. Leelaratne Wijesinghe—Polonnaruwa)

ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුවේ පස්වැනි අයවැය ලේඛනය පිළිබඳ විවාදයට සහභාගි වෙමින් මාත් වචන ස්වල්පයක් කථා කරන්නට බලාපොරොත්තු වෙනවා. ගරු මුදල් ඇමතිතුමාගේ පස්වැනි අයවැය ලේඛනය පිළිබඳ විවාදයට සහභාගි වන්නට අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. සෞඛ්‍ය කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්වරියගේ කථාව අසන්නට ලැබීම ගැන මා ඊටත් වඩා සන්තෝෂ වෙනවා. එතුමිය වේගවත් ස්වරයකින් දෘඪ ජාතික අභිමානයකින් යුක්තව අනාගත බලාපොරොත්තු රාශියක් ඇතිව අපට දේශනයක් කළා. එතුමිය කළ දේශනය ගැන කල්පනා කරන විට එහි නොයෙක් කාරුණු ඇතුළත් වී තිබුණු බව පෙනී යනවා. එතුමිය ජාතියේ දුප්පත්කම ගැන කථා කළා. ඒ වාගේම අඩුපාඩු සියල්ලක්ම සම්පූර්ණ කර රට කිරියෙන් සහ පැණියෙන් උතුරවා යන්නට මේ ආණ්ඩුව වැඩ කර තිබෙන බවත් ඒ සමගම කිව්වා. ජනතාවගේ කඳුලු ගැන මෙන්ම යුද්ධ භූමිවලදී ගැලූ ලේ ගැනත් කථා කර, ලෝකයේ නොයෙක් රටවල් ගැනත් කථා කර නැවත වරක් ලංකාවට පැමිණ උපත් පාලනය ගැනත් කථා කරලයි නතර වුණේ.

සංවර්ධනය ගැන කොයි තරම් දුරට කථා කළත් මේ අවස්ථාවේ එක් කාරණයක් ගැන පමණක් ප්‍රශ්න කරන්නට මම කැමතියි. දියුණුව ගැන මේ තරම් කථා කරද්දීත් ආරෝග්‍යශාලාවල සිටින ලෙඩුන්ගේ ආහාර හිඟය මේ තරමට බල පාන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නේ මන්දැයි අහන්නට ඕනෑ. රටේ ආහාර නිෂ්පාදනය මේ තරම් දියුණු වී තිබෙනවා නම්, ගැමි ජනතාව අත මුදල් තිබෙනවා නම්, මුදල්වලින් බැංකු පිරී තිබෙනවා නම්, රට ස්වයංපෝෂිතවීමේ අරමුණ සාර්ථක වී තිබෙනවා නම්, ලෙඩුන් ගැන බොහොම අනුකම්පා සහගතව කථා කරන පාර්ලිමේන්තු ලේකම්තුමියගෙන් මා අහනවා, මේ ලෙඩුන්ට කලින් ලබා දුන් බත්වේල නැවත ලබා නොදෙන්නේ ඇයි කියා. දුප්පතුන් වෙනුවෙන් පිණට හාල් සේරුවක් දෙන බව එතුමිය කිව්වා. රුපියල් 1,000 කට වැඩි ආදායමක් ලැබෙන අයට නොමිළයේ හාල් නොදෙන බවත් කිව්වා. එහෙම නම් ඇයි ලෙඩුන්ට බත් වේලක් දෙන්න බැරි? විශේෂ යෙන්ම ලෙඩ සුව වුණායින් පසුව ඔවුන්ට හොඳ ආහාරයක් වුවමනා කරනවා. රටේ ජාතියේ පුරුදු ආහාරය තමයි, බත්. ඒ බත්වේල සපයන්න බැරි ඇයි කියා මා නැවතත් අහනවා.

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මයා.** (ගල ගෙදර)
*(திரு. டபிள்யூ. எம். ஜீ. ரீ. பண்டா—கல கெதர)*
(Mr. W. M. G. T. Banda—Galagedera)
එතකොට උණ වැඩි වෙනවා.

**ලීලාරත්න විජේසිංහ මයා.**
*(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)*
(Mr. Leelaratne Wijesinghe)
මගේ යහළුවකු නිසා ගලගෙදර ගරු මන්ත්‍රීතුමාට මා උත්තර දෙන්ට යන්නෙ නැහැ. ඇත්ත වශයෙන්ම අධිරාජ්‍ය යුග යේ රටේ ආර්ථිකයට වුණු අනිෂ්ට විපාක නිසා, බරපතල හානි නිසා නිදහස ලැබී ගතවූ මේ ටික කාලයේදී රට සෑම අතින්ම අංග සම්පූර්ණ කරන්නට අමාරු බව ඇත් තයි. මේ රටේ ආර්ථිකයෙන් සෑහෙන කොටසක් තවමත් විදේශීයයන් අතේ තිබෙන බව අප කවුරුත් පිළිගත යුතුයි. ජනසතු කිරීමට තව ඉතිරිව තිබෙන්නේ වතු පමණක්ය, අනික් සියල්ලම ජනසතු කර හමාරය කියා රාජ්‍ය ඇමතිතුමා මේ විවාදයේදී ප්‍රකාශ කළා. ජනසතු කිරීමට ඉතිරිව ඇත්තේ වතු පමණක්ද කියා මා ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් අහන්නට කැමතියි. ඇයි මේ රටේ තිබෙන බැංකු ජනසතු කරන්නෙ නැද්ද? ඉන්දියාවේ ගරු අගමැතිනිය ඊයේ-පෙරේදා බැංකු 14 ක් ජනසතු කර ඉතා එඩිතර පියවරක් ගත්තා. මේ රටෙන් පිටරට ඇදී යන මුදල් මෙහි නතර කර ගැනීමට මේ බැංකු ජනසතු කරන්නේ නැද්ද කියා මා අහ නවා. සිගරට් කොම්පැණිය වැනි ජන සතු කළ හැකි විශාල කර්මාන්තශාලා ඕනෑ තරම් මේ රටේ තිබෙනවා. ඒවා වෙනුවෙන් පෙනී සිටින්න සිංගල්ටන්-සැමන් මහතා වැනි උදවිය මේ සභාවට ඇවිත් සිටිනවා. මේ රටේ දුප්පත්කම නැති කිරීමට, මේ රටේ යහපත සඳහා මේ මුදල් ලබා ගන්න මාර්ග සකස් නොකරන් නේ ඇයි?

මෙපමණ කලක් රාජ්‍ය ඇමතිතුමා වතු ජනසතු කිරීම සම්බන්ධයෙන් වචනයක් වත් කථා කළේ නැහැ. එතුමා දැන් කිය නවා ජනසතු කරන්නට තව ඉතිරිව තිබෙන්නේ වතු පමණයි කියා. එහෙත් දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමා ඒ කාලයේ කිව්වා, වතු ජනසතු කිරීමට අවු රුදු 10 ක් කල් දෙන බව. මේ රටේ කන්ද උඩරට තේ අක්කරයකින් රුපියල් 5,000 කටත් වැඩි ආදායමක් ලැබෙනවා. එයින් රුපියල් 300 බැගින් අය කර ගැනීමේ වැඩ පිළිවෙලක් යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) මුදල් ඇමති වශයෙන් සිටියදී ඇති කළා. ඒ වැඩ පිළි වෙල සම්පූර්ණයෙන්ම අහෝසි කර දමා අධිරාජ්‍යවාදී සුද්දන්ට මේ රටේ කන්ද උඩරට සරු සාර පොළොවේ උපදින ආදා යම් සෑහෙන අන්දමට පොදි ගහගෙන යන්නට මේ ආණ්ඩුව උදව් දී තිබෙනවා. මේ රජය උදව් කර තිබෙන්නේ දුප්ප තුන්ට නොවෙයි. කෙළින්ම මේ රට සූරා ගන්ට ඉඩ දී තිබෙන්නේ දේශීය හා විදේශීය ධනපතීන්ටයි.

ගරු කථානායකතුමනි, දේශීය භාණ්ඩ වල පිරිවැටුම් බද්ද සියයට 5 කින් වැඩි කර තිබෙනවා. මේ බර ජනතාව පිට වැටෙන්නේ නැද්ද කියා මා අහනවා. කොයිම නිෂ්පාදකයෙකුවත් කවදාවත් පාඩු විඳින්නට සූදානම් නැහැ. හැමවිටම මොන විදියේ හෝ උපක්‍රමයකින් ඒ බර ජනතාව පිට දමනවා. සම හරවිට රජය වැඩි කරන බද්ද මෙන් දෙගුණයක් පාරිභෝගිකයාට ගෙවන්නට සිද්ධ වෙනවා. රජය වැඩි කළේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලීලාරත්න විජේසිංහ මයා.]
සියයට 5ක් වුණත් වෙළඳපොළේ සම හර භාණ්ඩවල මිළ සියයට 10කින් තරම වැඩි වෙනවා. මම නිදර්ශනයක් වශයෙන් එකක් ඉදිරිපත් කරන්නම්. සිගරට් බද්ද සියයට 5කින් වැඩි කර තිබෙනවා. මේ බද්ද පැනවීමට පෙර "f පෝ ඒසස්" නමැති සිගරට් පැකැට්ටුවක් රුපියලයි. මේ බද්ද පැනවීමෙන් පසු දැන් රු. 1.10 යි. සියයට 10කින් වැඩි වී තිබෙනවා.

**ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මයා.**
*(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா)*
(Mr. W. M. G. T. Banda)
අපි බොන්නෙ බීඩි.

**ලීලාරත්න විජේසිංහ මයා.**
*(திரு. லீலாரத்ன விஜேசிங்ஹ)*
(Mr. Leelaratne Wijesinghe)
අපි කන්නෙ, බුලත්විට. තමුන්නාන්සෙ හිතාගෙන ඉන්නෙ තවම ඉන්නෙ කොණ්ඩෙ බැඳපු මිනිසුන් කියායි. කොණ්ඩය බැඳපු මිනිසුන් තව ටික දෙනයි ඉන්නෙ. දැන් මේ රටේ ගම්බද තරුණයින් වත් නයිලෝන් කමිස, ඩී. අයි. සපත්තු ආදිය ඕනෑ. තවම මේ රටේ ගම්බද ජනතාව සාරණ හා ගොටුකොළ පමණක් කා ජීවත් වෙනවා කියායි තමුන්නාන්සේලා හිතාගෙන ඉන්නෙ. නැහැ, මේ රටත් සෑහෙන තරමකින් ඉදිරියට ගිහින් තිබෙනවා. රටක් ගැන කථා කරන විට රටේ දියුණුව ගැනත් කල්පනා කරන්නට ඕනෑ. රතුලූනු ගෙඩිය ගැනත්, බොම්බයි ලූනු ගෙඩිය ගැනත් කථා කරල මදි. අධ්‍යාපන අංශයෙනුත්, අනෙක් සෑම අංශය කිනුත් අපේ ජනතාව සෑහෙන දියුණුවක් ලබා තිබෙන බව අමතක නොකළ යුතුයි. අද වැඩි දෙනෙකු කොණ්ඩය කපන නිසා ඒකටත් සල්ලි වුවමනා කර නවා.—[බාධා කිරීමක්] ඉස්සර කොණ්ඩය කපන්නට සල්ලි වුවමනා කළේ නැහැ. අපට කියනවා පටි තද කර ගන්නය කියා. වුවමනා කෙනෙකු කොණ්ඩය බැන්දට කමක් නැහැ. එහෙත් දැන් පනා එහෙම නැහැනෙ. තමුන්නාන්සේලා බරකරත්ත යුගයට ආපසු ගියාට දැන් මිනිසුන් බරකරත්ත යුගයෙන් ඉස්සර හට ඇවිත් සිටින්නේ.—[බාධා කිරීමක්] අපේ වැලිමඩ ගරු මන්ත්‍රීතුමා (සමරවීර මයා.) හැමදාම කථා කරන්නෙ බීජ අර්තාපල් ගැනයි. අර්තාපල් ගැන කථා කළාට හරි යන්නෙ නැහැ. තමුන්නාන්සේට අර්තාපල්, අපට මඤ්ඤොක්කා අල බතල. මේ පිරිවැටුම් බදුවලින් මා කලින් මතක් කළ අන්දමට බඩු මිළ ඉහළ නගිනවා. මේ ආණ්ඩුව ඉදිරිපත් කර තිබෙන මේ අයවැය ලේඛනය නිසා සමාජවාදී කර්තව්‍යයන් ඉෂ්ට වෙතැයි මා නම් බලාපොරොත්තු වන්නේ නැහැ. ධනපති රාමුවෙන් ඉවත් වන්නට උත්සාහ කරන බවක්වත් මේ අයවැය ලේඛනයෙන් පෙනී යන්නේ නැහැ. වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) කීවාක් මෙන්, මේ ආණ්ඩුව ධනපති රාමුවෙන් එළියට පනින්නට ක්‍රියා නොකර ඇතිවාක් පමණක් නොව, මහ ජනතාවට සහනයක් සලසා දෙන්නට මේ අයවැය ලේඛනය මඟින්වත් ක්‍රියා කර නැහැ. වී නිෂ්පාදනය කරන ගොවීන්ට වී බුසලක් සඳහා ගෙවන රුපියල් 14 මුදල ප්‍රමාණවත්දැයි මා අහනවා. මේ වර අයවැය ලේඛනය මඟින් වී බුසලක් සඳහා තවත් රුපියලක්වත් වැඩිපුර ලැබේ යයි ගොවීන් බලාපොරොත්තු වුණා. එහෙත් ගොවි ජනතාව වෙනුවෙන් වී බුසලක් සඳහා තව එක රුපියලක්වත් වැඩිපුර ගෙවීමට මේ ආණ්ඩුව සූදානම් නොවන බවයි, අපට මෙයින් පෙනී යන්නේ. ඒ නිසා අද අපේ රටේ ගොවීන් බලාපොරොත්තු සුන් වූ තත්ත්වයකට පත් වී සිටිනවා.

ගරු කථානායකතුමනි, අද පවතින බඩු මිළ ගැන කථා කරන්නට මට වුවමනා නැහැ. රතු ලූනු, බොම්බයි ලූනු, අර්තාපල්, වැනි පාරිභෝගික භාණ්ඩවල මිළ වැඩි වී තිබෙනවා. කෘෂිකර්මය දියුණු කරන්නට රුපියල් 36 කෝටියක් වැය කරන බව අයවැය ලේඛනය අනුව පෙනී යනවා. එහෙත් අද පෝර මිළ කීයද? පෝර මිළ එකට එකක් නැඟලා. පඩි නඩි එකට එකක් නැඟලා. දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය උපකරණවල, පොත්පත්වල මිළ නැගලා. මේ තත්ත්වය යටතේ ගොවියා අතේ යම්කිසි මුදලක් ඉතුරු වුණත්, එය මාසෙන් හමාරෙන් නිමාවට පත් වෙනවා. නැවතත් ණයගැති වන්නට ගොවියාට සිදු වෙනවා. ඊළඟ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කන්තයේ අස්වැන්න නෙළන්නට ගොවියාට සිදු වන්නේ හැම තැනටම ණය ගැති වූ තත්ත්වයක සිටගෙනයි.

දුම්කොළ වගාව ගැන වලපනේ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රකාශ කරන්නට යෙදුණා. අත්තෙන්ම දුම්කොළ වගාව නිසා අපේ විදේශ විනිමය සැහෙන ප්‍රමාණයක් ඉතිරි වෙනවා. අද මේ රටේ තිබෙන්නේ එක ප්‍රධාන දුම්කොළ කොම්පැනියයි. ඒ නිසා දුම්කොළ ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම ඒකාධිකාරයක් යටතට පත් වෙලා. ඒ දුම්කොළ කොම්පැනියට කැමති අන්දමට මේ රටේ ගොවීන්ගේ සාරය උරා ගනිමින් කටයුතු කරගෙන යන්නට පුළුවනි. ආණ්ඩුවත් ඇහැත් කණත් පියාගෙන සිටිනවා. මේ අවුරුද්දේදී එක විධියකට දුම්කොළ වර්ග කරනවා නම්, ඊළඟ අවුරුද්දේ වර්ග කරන්නේ වෙනත් විධියකටයි. මේ අවුරුද්දේ පළමුවැනි වර්ගය හැටියට තේරෙන දුම්කොළ ඊළඟ අවුරුද්දේදී සමහර විට තුන්වැනි වර්ගය හැටියට තෝරන්නට පුළුවනි. ඒ වාගේම මේ අවුරද්දේදී තුන් වන වර්ගය හැටියට තේරෙන දුම්කොළ ඊළඟ අවුරුද්දේදී පස් වන වර්ගය හැටියට තෝරන්නට පුළුවනි. දුම්කොළ රාත්තලක් සඳහා ගොවියාට තව රුපියලක්වත් දෙනවා නම් සිගරැට්ටුවකට තවත් ශතයක් දෙකක් වැඩි වුණාට කමක් නැහැ. අද දුම්කොළ රාත්තලකට රුපියල් 4 කට වඩා ලැබෙන්නේ නැහැ. සිගරැට්ටුවේ මිළ තව කීයකින් හෝ වැඩි කර වුණත් දුම්කොළ නිෂ්පාදනය කරන ගොවියාට වැඩි පුර ගෙවීමක් කරන්නට කටයුතු කරනවා නම් හොඳයි.

දුම්කොළ අක්කරයකින් දුම්කොළ රාත්තල් 900 කට වඩා මිළයට නොගන්නට දැන් ඒ දුම්කොළ කොම්පැනිය තීරණය කර තිබෙනවා. ඒ ඒ ප්‍රදේශයේ පසේ සරුසාර ප්‍රමාණය අනුව අක්කරයකින් ලැබෙන දුම්කොළ ප්‍රමාණය අඩු වැඩි වෙනවා. සමහර විට සමහර ඉඩමකින් අක්කරයකට රාත්තල් 1,500ක් ලැබෙන්නට පුළුවනි. එහෙත් ඒ වැඩිපුර නිෂ්පාදනය වන ප්‍රමාණය මිළයට ගන්නට කොම්පැනිය සූදානම් නැහැ. මේ නිසා දුම්කොළ වගාව සම්පූර්ණයෙන්ම අඩපණ වන තත්ත්වයකට පැමිණ තිබෙනවා. දේශීය ධනපතියන් පමණක් නොව, විදේශීය ධනපතියන්ද අපේ දුම්කොළ වවන ගොවියා අධෛර්‍ය්‍ය කරන්නට ක්‍රියා කරන බවයි, පෙනෙන්නට තිබෙන්නේ. අමු දුම්කොළ රාත්තල් 10 කින් වියළි දුම්කොළ රාත්තලක් නිෂ්පාදනය කරන්නට පුළුවනි. අක්කරයකට රාත්තල් 900 කට වඩා නොගන්නට තීරණය කිරීමෙන් අපේ දේශීය දුම්කොළ නිෂ්පාදනය අඩපණ වී තිබෙනවා.

මේ අතර අපේ අත් යන්ත්‍ර පේස කර්මාන්තයටත් අද බලවත් පහරක් වැදී ගෙන යනවා. එංගලන්තයේ මැන්චෙස්ටර් එකේ තිබෙන කොම්පැනි සමග තරඟ කරන්නට අපේ අත් යන්ත්‍ර පේස කර්මාන්තකාරයන්ට පුළුවන්ද? එහෙත් දැන් එවැනි තත්ත්වයක් උදා වී තිබෙනවා. ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා අත් යන්ත්‍ර පේසකර්මාන්ත මධ්‍යස්ථාන 1,000 ක් පිහිටුවා සැහෙන සේවයක් කළා. ඒ කළ සේවයේ අඩුපාඩු තිබෙන බව ඇත්තයි. නිෂ්පාදන භාණ්ඩ විකුණා ගන්නට ක්‍රමයක් නැහැ. නොයෙකුත් අඩුපාඩු තිබෙන බව අප පිළිගන්නවා. මේ අතර බිර්ලා කොම්පැනිය වැනි කොම්පැනිවලට රෙදි විවීමේ කර්මාන්තය භාර දුන්නාම අපේ අත් යන්ත්‍ර පේසකර්මාන්තය පරිහාණියට පත් වේවි. මේ ඇති කරන්නට යන්නේ ධනේශ්වර ක්‍රමයේ වැඩ පිළිවෙළක්. පරිත්‍යාග කරන්නටයයි හැම වෙලාවෙම කියනවා. රටේ යහපත සඳහා, පොදු මහජනතාවට පරිත්‍යාග කරන්නට යයි කියනවා. වෙහෙස මහන්සි වී වැඩ කරන දුප්පත් කෙනෙකුට දිනකට රුපියල් පහක් හයක් උපයා ගන්න පුළුවන් තත්ත්වයක් ඇති වී නැහැ. එසේ වුණත් පුටු පිට වාඩි වී ලක්ෂ ගණන් උපයන ධනපතියන් මේ රටේ සිටිනවා. ධනපති පංක්තියට හැම අවස්ථාවේම හැම දෙයින්ම පහසුකම් සැලසෙනවා. ඒ වාගේම දුප්පත් ජනතාවට පටි තද කර ගෙන ජීවත්වන්නට යයි කියනවා. මා අහනවා, දුප්පත් ජනතාව පමණක්ද පටි තදකරගෙන ජීවත් වන්න ඕනෑ කරන්නේ ?

ගරු කථානායකතුමනි, මේ රටේ ජීවත් වන දුප්පත් ජනතාව ආහාරයට ගන්නා විශේෂයෙන්ම කුඩා දරුවන් කැමට ප්‍රිය කරන ආහාරයක් තමයි පරිප්පු. පොල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලීලාරත්න විජේසිංහ මයා.]

සම්බල ටිකකුයි, පරිප්පු ටිකකුයි හදා ගෙන බත් කෑමට අපේ ගම්බද උදවිය පුරුදු වී සිටියා. නමුත් දැන් පරිප්පු ගෙන්වීම නතර කර දමා තිබෙනවා. එහෙම නතර කළේ අපේ රටේ නිපදවන නිසාද ? නැහැ. නමුත් කියනවා, සෑම දෙයකින්ම රට ස්වයංපෝෂණය කරන්න යනවාය කියා. මේ විධියේ බොරු කථාවලින් ජනතාව මුළා කරන්න උත්සාහ දරනවා. ඇත්ත වශයෙන්ම රටට අවශ්‍ය ප්‍රමාණයට පරිප්පු ගෙන්වන්න ඕනෑ. රටේ ජනතාවගෙන් වැඩි කොටසක් අද මන්ද පෝෂණයෙන් පෙළෙනවා. පරිප්පු ඇඟට බොහොම ගුණදායක ආහාරයක්. නමුත් ලැබෙන්නේ සතියකට අවුන්සයක් නැතිනම් දෙකක් පමණයි. පොල් සම්බල ටිකක් හදා ගන්න ඕනෑ කරන උඹලකඩත් ලැබෙන්නෙ මංචාඩි ගණන් වලින්. ආහාර අතින් ඉතාමත්ම අසතුටුදායක තත්ත්වයක් දැනට තිබෙන්නේ. එසේ තිබෙද්දී කියනවා, කෑම ගෙනෙන්නට සල්ලි යනවාය කියා. කෑම ගෙන්වන්න සල්ලි යන බව ඇත්ත. කෑම නොකා ජීවත්වන්න පුළුවන්ද ? මෙපමණ මුදලක් කෑම ගෙන්වීම සඳහා යනවායයි ඉලක්කම් ඉදිරිපත් කරනවා. දරුවන්ට කිරි නැතුව ජීවත්වන්න පුළුවන්ද ? කැවොත් තමයි වැඩ කරන්න පුළුවන් වන්නෙ. එහෙනම් කන්න දෙන්න මුදල් නැතැයි කීම හරිද ?

ගරු කථානායකතුමනි, කොටින්ම කියනව නම් මේ ආණ්ඩුව දුප්පත් ජනතාවගේ ආහාරයත් සීමා කළා. හාල් සේරු දෙකින් එකක් කපා දමා මහජනතාවට තුවක්කු එල්ල කළා. එපමණක් නොවෙයි, හදිසි නීතිය දින දාහකටත් වැඩි කාලයක් ක්‍රියාවේ යොදවමින් මහජනතාව තුවක්කුවේ බලයෙන් පාලනය කළා. මහජනතාවට තම අයිතිවාසිකම් ගැන කථා කරන්න ඉඩ දුන්නේ නැහැ.

1953 හර්තාලය ඇති වුණෙත් මෙබඳු තත්ත්වයක් ඇති වීම නිසයි. එදා, මේ අගමැතිතුමාම මහජනතාවගේ බත්පතට තට්ටු කළා. ශත 25 ට තිබුණු හාල් සේරුව ශත 70 කළා. මහල්ලන්ගේ පිංපඩි කපා දැම්මා. ශත 5 ට තිබුණු තැපැල් ගාස්තුව ශත 10 කළා. දුම්රිය ගාස්තුව වැඩි කළා. එම නිසා හැමදාම මේ පිරිසට බලය ලැබුණොත් දුප්පතා පිට සියළුම බර පටවන වාට කිසිම අනුමානයක් නැහැ. මේ අයවැය ලේඛනයෙන්ද මහජනතාව පිට බදුබර පටවා තිබෙනවා. මේ ප්‍රශ්නය ඉක්මනින් විසඳාළන්නට නම් හෙට අනිද්දාම මහා මැතිවරණයක් තබා තමුන්නාන්සේලා ඉක්මනින් විශ්‍රාම යන්නට ඕනෑ. ඒ අන්දමට තමුන්නාන්සේලා විශ්‍රාම යවන්නේ නැතුව මේ රටේ දුප්පත් මහජනතාවට ඔළුව උස්සන්න නම් ලැබෙන්නෙ නැහැ.

ගරු කථානායකතුමනි, මට පෙර කථා කළ සෞඛ්‍ය ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමිය පෙන්නුම් කර දෙන්න වෑයම් කළා, රජයේ සේවකයන්ට සියළුම පහසුකම් සලසා දී තිබෙනවාය, ඉල්ලීම් ඉටු කර දී තිබෙනවාය කියා. පසුගිය කාලයේදී පැවති මහා වැඩ වර්ජනය දේශපාලන බලපෑම්වලින් ඇති වුණාය කියා කිසිවකුටවත් කියන්න පුළුවන්කමක් නැහැ. විල්ප්‍රඩ් පෙරේරා වැනි පුද්ගලයන් අල්ලාගෙන එය කඩා කප්පල් කර දමන්නට උත්සාහ කළ බව අප දන්නවා. නමුත් මේ රටේ කිසිම දේශපාලන පක්ෂයක් එම වැඩ වර්ජනයට උදව් දුන්නේ නැහැ. එම වැඩ වර්ජනයේ ප්‍රතිඵලයක් වශයෙන් රජය දුන් ප්‍රතිඥාවක් අනුව සුළු වශයෙන් වැටුප් වැඩි කිරීමට රජය පියවර ගෙන ඇතත් බඩු මිල වැඩි වීම ගැන සලකා බලන විට ඒ හිඟන වැටුපෙන් ජීවත්වන්න පුළුවන් වේයයි අප කල්පනා කරන්නෙ නැහැ. ඒ වාගේම ගොවි ජනතාව නගා සිටුවීමට මේ රජය ක්‍රියා කළායයි කියනවා. නමුත් මෙය පිළිගන්න පුළුවන් කථාවක් නොවෙයි. ගොවියා නගා සිටුවන්න නම් ඔවුන් නිපදවන ද්‍රව්‍යවලට සෑහෙන මුදලක් ලැබෙන්න ඕනෑ. නමුත් අද තිබෙන තත්ත්වය මොකක්ද ? අමාරුවෙන් හෝ එළවලු කොටුවක් දමා ගත්තොත් ලැබෙන අස්වැන්න සෑහෙන මිලකට විකුණා ගන්න ක්‍රමයක් නැහැ. පතෝල කොටුවක් දමා ගත් පුද්ගලයකුට ලැබෙන අස්වැන්න සෑහෙන මිලකට විකුණාගන්න කොයි තරම් අමාරු වෙනවාද කියනවා නම් අවුරුදු ගණනාවකට පතෝල වවන්න එපා වෙනවා. රාත්තලක් ශත පහකටවත් අලෙවි කර ගන්න බැරි වුණත් ඒවා කොළඹට ගෙනැවිත් රාත්තල ශත 50 ගණනේ විකුණනවා. මුරුංගා, තක්කාලි ආදී එළවලු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වර්ග වැව්වත් නියම මිලකට අලෙවි කර ගන්න ලැබෙන්නෙ නැහැ, කෙලින්ම වගා කරන අයවලුන්ට මුදල් ලැබෙන්නේ නැහැ. මැද ඉන්න තැරැව්කාරයනුයි වැඩි ආදායමක් ලබන්නේ ; තරවී සිටින්නේ. මෙබඳු තත්ත්වයක් තිබෙන නිසා ගොවියාගේ තත්ත්වය උසස් වී නැහැ.

ගරු කථානායකතුමනි, මෙහිදී අපේ ගම්වලින් පැමිණි, දුප්පත් ජනතාවගේ ඡන්දයෙන් පැමිණි ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ට එක් වචනයක් කියන්න කැමතියි. එතුමන්ලාත් අපත් මේ ගරු සභාවට පැමිණ සිටින්නේ ගම්බද දුප්පත් ජනතාවගේ ඡන්දයෙන් බව අමතක කරන්න නරකයි. දුප්පතාට උදව් කරන වාය කියමින් ඡන්දය ලබාගෙන, කොම්පැනිකාරයන්ට, ඉඩම් අයිතිකාරයන්ට, පැක්ටේරිකාරයන්ට කත් අදින විධියේ වැඩ කලොත් අපි අපේ ගම්බද ජනතාව විකුණා දැම්මා වෙනවා. එම නිසා ඇත්ත කථා කරනවා නම් මේ රට හැම අතින්ම ස්වයංපෝෂණය වී තිබෙනවායයි තමුන්නාන්සේලාට කියන්න බැහැ. මට පෙර කථා කළ සෞඛ්‍ය ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමිය සඳහන් කළා, රට කිරියෙන් පැනියෙන් උතුරා ගොස් තිබෙනවාය කියා. ඒ කථාව ගැන කල්පනා කරන විට මට එක්තරා කවියක් මතක් වෙනවා :

වන්නියෙ මුහුණුවල තැවරෙයි පුයර කුඩු
උරපන් පුතේ ලාබයි රට දෙතන පුඩු
කමු, බොමු තිබේ කුණු කොල්ලෙට
සියලු බඩු
කට වහගනිව් දැන් මොනවද අපට අඩු

දැන් කථා කරන්න දෙයක් නැහැ, මුදල් ඇමතිතුමනි, දැන් කට වහගන්න එකයි, තියෙන්නෙ. දැන් සියල්ලකම අංග සම්පූර්ණයි. ඒ නිසා අපි දැන් කට වහගන්නවා. [බාධාකිරීමක්] ඔව්, බේරුවල බොක්කට තමයි, සේරම. මේ අවුරුදු පහ තුළදී විස්මිත මහා ප්‍රාතිහාර්‍ය්‍ය කළේ තමුන්නාන්සේලා තමයි. ඊට කලින් මේ රටේ දියුණුව සඳහා කිසිම වැඩක් කෙරුනෙ නැහැ. ඒ කාලය නිකම් තමයි, ගත වුණේ. තමුන්නාන්සේලාගේ මුදල් ඇමතිතුමත් දැන් ලෝක බැංකුවේ සභාපති කෙනෙක්. ඒ නිසා අපට බොහොම ආඩම්බරයි. අපට සල්ලිත් එහෙන්ම ගලාගෙන එයි. කථානායකතුමනි, මගේ කථාව මෙයින් අවසාන කරනවා.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන (විද්‍යාත්මක පර්යේෂණ හා නිවාස ඇමති)**

*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன—விஞ்ஞான ஆய்வு, வீடமைப்பு அமைச்சர்)*

(The Hon. M. D. H. Jayawardena—Minister of Scientific Research and Housing)

Mr. Speaker, I have had the privilege of listening to most of the speeches on the Budget made during the last three days. I must confess that I was sadly disappointed because, with the exception of one or two speeches, they hardly dealt with the Budget.

The Second Reading Debate of the Appropriation Bill is usually an occasion to criticize and to congratulate the Minister of Finance on the formulation of the Budget ; that is, the arguments should be directed towards a criticism of the general principles of the Budget. But, unfortunately, most of the matters which were raised were matters which could be more appropriately dealt with at the Commitee stage of the Budget.

It is not fair to judge a Budget by one year's performance. If a Budget is to be judged on just one year's performance, then the hon. Member for Kolonnawa (Mr. Ilangaratne), who opened the Debate for the Opposition, should be the last person to speak on it because, as you know, his Budget went haywire within four months of its presentation. His entire body of calculations went wrong and they had almost to formulate a second Budget during his speech.

We are however fortunate that we have a Finance Minister who has presented a Budget for the fifth time. I should like on this occasion to convey my heartiest congratulations to him on this unique achievement of presenting five Budgets, each of which has been very well formulated.

Now, the Hon. Minister of Finance in his first Budget speech stated that he wished to give a certain direction

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

of policy in the Budget. He stated that the principle of the Budget would be to prevent inflation. Inflation, as you know, is an insidious way of robbing the poor of their savings, and it puts the cost of living up. As such, he enunciated the principle that his primary purpose would be to stabilize prices and to prevent inflation. He also stated that his Budget would be one aimed at economic development. A Budget has not only a present ; it has a past as well as a future.

One who formulates a Budget knows that almost 85 per cent of the Budget is pre-determined. That is because from the previous years the built-in expenditure comes in and there is very little room for manoeuvre. Similarly, a Budget has a future because the impact of the action that you take on one Budget continues for many, many years. So, one finds it difficult to adjust even the revenue proposals although there is much more room for manoeuvre on the revenue side. As against that, on the expenditure side it is tied up for several years by your predecessor's decisions.

The Treasury allocates and gives Rs. 15 million a year. That also, hon. Members must realize, is not given as a grant. It is given as a loan which I have got to repay. The situation in the Department of Housing can well be appreciated when I tell this House that arrears of instalments amount to Rs. 10 million. And why is this arrears position so bad ? The reason is this : The Treasury gave us a certain number of clerks in 1963 when the department was started. It is the same number of clerks we are having today. Ledgers have not been posted for five years. Certain persons have not been prosecuted owing to the existence of loopholes in the law. I have devoted my time and the little learning of the law I have to remedying the position and I am glad that during the short period I have held office I have been able to recover nearly Rs. 3 million being arrears of instalments. Where earlier people having millions of rupees have managed to evade payment, I have reorganized the working of the department in such a way that now they find it impossible to do so. They have found that it is not possible to evade payment of loans due to the Housing Department.

I mention this in passing only to show that in spite of the great difficulties we have to face, in spite of giving almost everything free to the people, this Government has, during the years 1965 to 1969, spent Rs. 72 million on housing compared with Rs. 88 million spent by previous Governments during the years 1956 to 1965. For nine years those Governments spent only Rs. 88 million whereas within four years we have spent Rs. 72 million and given assistance to 7,621 applicants. The previous Governments gave assitance to 7,700 during their entire nine-year period, spending Rs. 88 million. They have constructed within that nine-year period 1,100 flats and 2,000 houses. We have constructed during our four-year period 1,800 flats at a cost of Rs. 33 million.

We are now doing the Maligawatta slum clearance scheme, putting up 28 shops and flats. In Anuradhapura we are putting up 50 houses, and the money has been allocated for another 50 houses. In Mahiyangana we are constructing 50 houses.

So, Sir, with the little money at our disposal we are doing everything possible. I wish to tell hon. Members that I have not slept over my duties. I have been able to get the corporation together and ask them how much they have been given for putting up houses and what assistance we could give them. The C. W. E. has come forward and asked for land to put up houses for its employees. We are in the process of acquiring the land now. Various other firms in the private sector have done the same thing. Laksala also has come forward to put up houses. So have the Insurance Corporation and various other bodies. They have come forward and aked for land. We have been conferring daily and weekly with the private sector and the public sector, asking them what assistance we can give them. If it is for acquiring land we are prepared to give them all assistance.

I will be introducing in this House what is known as condominium legislation. Condominium legislation will help flat builders to dispose of their flats. Today as you know a single unit in a flat cannot be disposed of. It is held as common property. By this legislation it will be possible for a a condominium plan to be registered. It will be registered like a deed. Each flat will have a separate number and once it is registered it will have perpetual succession and a common seal. There will be a manager with statutory powers who will look after the common amenities like water, lights and drainage. Each individual owner would have the right to dispose of the common flat. This will be an incentive to house builders. People in Hawaii, Singapore and Hong Kong Kong today are having these flats and selling them to people who want them. Today there is a very large

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. එච්. ජයවර්ධන]

demand for flats. For a number of flats we advertized the other day, we have had over 10,000 applicants, which shows that there is a very big demand for houses and people are now willing to live in flats. The condominium legislation is ready and will be placed before this House within the next few weeks.

I have appointed a committee to look into ways and means of building low-cost housing schemes. I am getting down an expert from India, Dr. Mohan, who is coming out to Ceylon to advise us on low-cost housing schemes. He is in charge of the Indian scheme.

I am now coming to the revenue proposals. The hon. Member for Divulapitiya (Mr. Jayakody) stated that cocoa has to pay an export duty and fibre has to pay an export duty. Hon. Members must realize that from this export duty we are expecting only Rs. 10 million. The hon. Member for Divulapitiya especially must realize that under the scheme of FEECs they get 55 per cent more than they would have got under normal conditions of trade. From that 55 per cent there is a 10 per cent tax which has been imposed by the Minister of Finance, so that they are still up on the deal. So, what is there for them to complain ? When the Government, under FEECs, is giving them 55 per cent more than what they are entitled to, are they cavilling at this 10 per cent which they have got to pay ? I mentioned that under the FEECs scheme cocoa has got a new impetus and the highest exports of cocoa were made last year.

In regard to the reduction to Rs. 75,000 of businesses liable to turnover tax, the hon. Member was saying that he had to pay more for his rice and curry, that all the boutique-keepers in Divulapitiya have to pay more for their rice. The Government has been careful to protect the poor man, not only the poor man but the poor trader. The Taxation Commissioner which was appointed by this Government recommended that the level be reduced to Rs. 50,000, but the Government did not reduce it to that level but only to Rs. 75,000, which is about Rs. 6,000 of trade turnover a month, at Rs. 200 a day. And that does not apply to the poor boutique-keeper who sells a few cigars or cigarettes. He does not have to pay turnover tax on all the articles. That is what you must tell the poor people.

This Government has thought of the poor man and not charged the turnover tax on the following things —this will lighten the hearts of the hon. Members on the other side : arrack sold in taverns, books, bread, coconut oil, dried fish, maldive fish, paddy, rice uncooked, safety matches, sugar, toddy sold at taverns, wheat flour, fresh coconuts, fresh fruits, fresh vegetables, onions, jams, chillies, condiments and spices. What is there in the poor man's diet which is not caught up here ? We have even thought of his drink. Arrack and toddy are also exempted from the turnover tax. Therefore, hon. Members should realize that this Government in bringing down the limit of the turnover tax, thought of both these categories, namely, the poor trader and the poor man. A large number of items have been exempted from the turnover tax. Chillies, coriander, cummin seed, fresh vegetables, coconut, wheat flour, sugar, safety matches, rice uncooked, fresh meat, maldive fish, coconut oil, arrack, and animal foods are a few of them. So, is there anything to complain with regard to the limit of the turnover tax being brought down ?

With regard to the increase in the price of cigarettes, one hon. Member said that already a packet of a certain brand of cigarettes is Rs. 1.10, and with the turnover tax people will have to pay more. The manufacturers have assured us that the people will have to pay only one cent more, and that the turnover tax and the manufacturer's tax will both be caught up in the increase of one cent.—[*Interruption*].

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

With regard to the revision of the telephone tariff, the increase is only five cents. The telephone services are satisfactory, but certainly, there is room for improvement. One can dial from Mirigama to Padukka for 20 cents. A five-cent increase is not such a large increase to complain about. We must also remember that the telephone service is still a subsidized service in Ceylon.

Those are the main revenue proposals, and from those proposals one would see that the poor man has not been hit. This Government has been careful to see that the effects of those revenus proposals will not be felt by the poor man.

We have also increased certain other taxes like the tax on textiles, but we have exempted cotton textiles from the increase. Increased taxes have been imposed on things like perfumes, hair dressing and toilet requirements. But those are not things used by the ordinary poor man. They use coconut oil.

The tax on kerosene oil cookers and refrigerators has also been increased. I have heard some people say that the manufacturers will put up their prices. There is a committee being set up by the Cabinet, and we can assure hon. Members that stern action will be taken against those manufacturers who try to put up their prices. These manufacturers do not pay any import taxes, and they have been given tax holidays. If we imported these articles we would have had to pay the import tax, but still the article could be sold cheaper. These rich industrialists are making money enjoying tax holidays. Of course, once we have given them an assurance that they will enjoy a tax holiday we cannot withdraw it because it will discourage other investors. But we will take action and see that some of these articles are price controlled. Those who are making unconscionable profits will be made to cough up their profits.

There is also an increase of tax on distemper, paints, and so on, but those are not things that go into the poor man's purchases. But the people can rest assured that the Government is appointing a committee to look into this question of the prices of locally made articles.

I have shown that the Hon. Minister of Finance has kept the two promises that he made in his first Budget speech. One was to prevent inflation in this country and the other was to undertake development work. He has fulfilled those two promises. Hon. Members should realize that we had to face a difficult situation. The tea prices came down, and have reched rock-bottom levels. If the tea prices remained high the increase in the Gross National Product would have been much more than 5 per cent ; it could have been as much as 12 per cent. During this period coconut prices too dropped sharply. If the prices remained high the Gross National Product would have registered a much higher increase. We also had to face another difficult situation : the import of rice from Burma was suddenly stopped.

When the export of rice was suddenly stopped from Burma, when we were told by Burma that they could not export any more rice to Ceylon, that they were sorry they could not send the 100,000 tons of rice promised to Ceylon, we took a bold decision.

Our Prime Minister was not taken aback by the hartal of 1953 when we had to cut a measure of rice. We appealed to the people and the people understood our position. We appealed to the people through the radio and told them of our decision.

If the country is to progress we must all live hard times until, like Russia and China, we reach progress.

In Russia for seventeen years the people had to eat saw dust in their bread. That is the sacrifice that they

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. එච්. ජයවර්ධන]

had to make. The people of this country are not being asked to eat saw dust.

We have brought and are bringing to the people of this country all essential articles of food. Essential articles are being provided at just prices, at controlled prices, at competitive prices. The rich and the poor alike receive their rationed articles at equal prices. We have not favoured the rich; we have not favoured the poor. We have treated everybody alike.

**සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මිය. (අත්තනගල්ල)**

*(திருமதி சிறிமாவோ ஆர். டீ. பண்டாரநாயக்க—அத்தனகல்ல)*

(Mrs. Sirimavo R. D. Bandaranaike—Attanagalla)

Here some are eating better than the poor.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**

*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*

(The Hon M. D. H. Jayawardena)

Pardon!

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**

*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*

(Mrs. Sirimavo Bandaranaike)

The Russians may have eaten alike, but here some are eating better than the poor.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**

*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*

(The Hon. M. D. H. Jayawardena)

Sir, the hon. Leader of the Opposition has come into politics only recently. So I can forgive her knowledge of history. If she wants, I can give her the book to show that for seventeen years the people of Russia had to eat saw dust in their bread. And the Russian Revolution started in 1917 and not in 1956.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**

*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*

(Mrs. Sirimavo Bandaranaike)

I know that. Here some people are eating well while others are asked to make sacrifices.

**ගරු එම්. ඩී. එච්. ජයවර්ධන**

*(கௌரவ எம். டீ. எச். ஜயவர்தன)*

(The Hon. M. D. H. Jayawardena)

The Government has assured for the people the rationed articles on the correct date at the correct amount.

These are the sacrifices that people must make in a developing country.

We in the Front Bench here realize more than anyone else that the time is short, that the people are looking for the fruits of freedom, that they are waiting patiently.

Within the democratic framework we are working, we call upon the nation to help us. The nation has rallied to the Prime Minister's call to make the little sacrifices that they have been called upon to make.

We believe that in our time will be seen not the decline but the renaissance of Ceylon; and that in that great work we shall play an imperishable part, is not only our great hope but also our unshaken belief.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

Order, please! The Sitting is suspended for half an hour.

On resumption, the hon. Deputy Speaker will take the Chair.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ. භා. 4.30 ට නියෝජ්‍ය කථානායකතුමාගේ [එම්. සිවසිතම්පරම් මයා.] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

*இதன்படி அமர்வு பி. ப. 4.30 மணிவரை இடை நிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. உபசபாநாயகர் அவர்கள் [திரு. எம். சிவசிதம்பரம்] தலைமை தாங்கினார்கள்.*

*Sitting accordingly suspended till 4.30 P.M. and then resumed,* MR. DEPUTY SPEAKER [MR. M. SIVASITHAMPARAM] *in the Chair.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආර්. එම්. අප්පුහාමි මයා.** (බණ්ඩාරවෙල)
*(திரு. ஆர். எம். அப்புஹாமி—பண்டாரவளை)*
(Mr. R. M. Appuhamy—Bandarawela)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම රජයේ අවසාන අයවැය කථාව පිළිබඳ විවාදයට සහභාගි වන්නට අවස්ථාවක් ලැබීම ගැන මා සන්තෝෂ වෙනවා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් සහ ඇමතිවරුන් මෙම විවාදයේදී කතා කළේ කෙසේද? අසාධ්‍ය රෝගියකුට ඔක්සිජන් දී ඔහු සුව කර ගන්නට සැරසෙන්නා වාගේ මෙම අයවැය ලේඛන කථාවෙහි පවතින නිරස භාවය මකාගැනීම සඳහා ඒ උදවිය නොයෙකුත් විධියේ කරුණු ඉදිරිපත් කළා. මට ප්‍රථමයෙන් කථා කළ නිවාස හා විද්‍යා කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාගේ කථාවෙහිදී එතුමා සඳහන් කළා, මෙම රජය බලයට පත් වුණායින් පසු මේ රටේ ජනතාවට කිසිදු හිරිහැරයක් කරදරයක් නැතුව ඉතා උසස් අන්දමින් තමන්ගේ ජීවිත ගත කරන්නට ඉඩ ලැබී තිබෙන බව.

ගම්බද ජනතාව ජීවත්වන නියම තත්ත්වය පිළිබඳව එම ප්‍රදේශ නියෝජනය කරන මන්ත්‍රීවරුන් වශයෙන් අපට පැහැදිලි අවබෝධයක් තිබෙනවා. මෙම රජයේ මැති ඇමතිවරුන් කෙසේ කතා කළත් අපේ ප්‍රදේශවල ගොවි ජනතාවට නම් ඒ කියන විධියේ යහපතක් සැලසී නොමැති බව කිවයුතුයි. ගම්බද ප්‍රදේශවල ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය අවුරුද්දෙන් අවුරුද්ද පහත් තත්ත්වයකට වැටී තිබෙන බව අපට පේනවා. ඒ උදවිය සමූපකාර සමිතිවලට වී තිබෙන ණය අවුරුද්දෙන් අවුරුද්ද වැඩි වෙනවා. බොහෝ දෙනා එම ණය මුදල් ගෙවා ගන්නට බැරි තත්ත්වයකට පත් වී සිටිනවා. එම ණය මුදල් ගෙවා ගන්නට නොහැකිවීම නිසා තමන්ගේ සහල් සලාක පොත් රජයට භාර දෙන්නට සිදු වුණු ගොවීන් ගණනාවක් එම ප්‍රදේශවල සිටිනවා. එම ප්‍රදේශවල වී ගොවිතැන විශාල වශයෙන් නොකෙරුණත් ගොවීන් සියයක් ගෙන බැලුවොත් ඔවුන්ගෙන් අනූවක් පමණම අක්කර දෙකකටත් අඩු ප්‍රමාණයක් තුළ ගොවිතැන් කරන උදවිය බවයි අපට පෙනෙන්නේ. ඒ අය අවුරුද්දකට එක කන්නයයි ගොවිතැන් කරන්නේත්. අක්කර බාගයක් අක්කරයක් හෝ වැඩිම වුණොත් අක්කර එකහමාරක් දෙකක් පමණ ගොවිතැන් කිරීමෙනුයි ඔවුන් තමන්ගේ ජීවන තත්ත්වය රැකගෙන ඉන්නේ. එසේ සිටින අතරයි එළවළු වගාවත් කරන්නේ. එහෙත් අද අප රටේ බඩු මිල—කෘෂිකාර්මික ද්‍රව්‍ය අතින් බැලුවත් පොහොර යනාදිය අතින් බැලුවත් වෙන වෙනත් දේවල් අතින් බැලුවත් තත්ත්වය එකයි—බලවත් අන්දමින් ඉහල යාම නිසා ඔවුන්ට සිදු වී තිබෙන්නේ තමන් නිපදවන ද්‍රව්‍යවලින් ඉතා අඩු ආදායමක් ලබන්නටයි. අපේ ගම්බද ජනතාවට මෙම ආණ්ඩුව කියන විධියේ ජීවන තත්ත්වයක් ගොවිතැනින් නම් ලබාගන්නට පුළුවන්කමක් ලැබී නැති බව ඒ අනුව අපට කියන්නට පුළුවනි.

විශේෂයෙන් අපේ ප්‍රදේශවල අර්තාපල් වගා ව්‍යාපාරය සැහෙන අන්දමකට කෙරෙනවා. මේ රටට අර්තාපල් ගෙන්වීම නැවැත්තුවායින් පසු උඩරට ප්‍රදේශවල ගොවීන්ට ලොකු ආදායමක් ලබා ගන්නට මාර්ගයක් සැලසුනායයි අයවැය කථාවෙහි සඳහන් වී තිබුණා. ගරු මැති ඇමතිවරුන් කිහිප දෙනකුගේ කථාවලින්ද ඒ බව ප්‍රකාශ වුණා. අද අර්තාපල් ගොවියා ඉතාමත්ම භයානක තත්ත්වයකට පත් වී සිටින බව මේ අවස්ථාවේදී මතක් කළ යුතුව තිබෙනවා. මේ ළඟදී පුවත්පත් ගණනාවකම සඳහන් වී තිබුණා, උඩ රට ප්‍රදේශයේ උඩුකිඳ සහ මැදකිඳ පළාත්වල අර්තාපල් ව්‍යාපාරයට වී තිබෙන්නේ කුමක්ද කියා. අර්තාපල් වගාව පිළිබඳව මේ ආණ්ඩුවේ සළුසලේ සභාපති ජේ. එල්. එම්. ප්‍රනාන්දු මහතා විසින් කර තිබෙන විස්තරයක් මා තමුන්නාන්සේලාට ඉදිරිපත් කරන්න කැමතියි. එතුමා විසින් කර තිබෙන විස්තරයේ මෙසේ සඳහන් වෙනවා :

" අර්තාපල් අර්බුදයේ ඇත්ත යුත්ත

මෙරට අර්තාපල් වගාව පිළිබඳව ඇතැම් විදේශීන්ගේ මැදිහත්වීම් හා අපේම සමහර නිලධාරීන් විසින් අනුගමනය කරන ලද වැරදි වැඩපිළිවෙලවලුත්, දිවයිනේ අර්තාපල් වගාවත් එම වැවිලිකරුවනුත් අද වැටී ඇති අන්ත දුක්ඛිත තත්ත්වයට හේතු වී ඇතැයි ලංකා සළුසල සභාපති ජේ. ඇල්. ඇම්. ප්‍රනාන්දු මහතා ' දවස ' නියෝජිතයෙකුගේ ප්‍රශ්නයට උත්තර දෙමින් කීය. අර්තාපල් වගාවට ලැබී



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අප්පුහාමි මයා.]

ඇති දුර්දශාවන් සම්බන්ධයෙන් ඉකුත් 10 දා 'දවස' පත්‍රයේ පළ වී තිබූ පුවත උඩ රට අර්තාපල් වැවිලිකරුවකු වශයෙන් තමා මුලුමනින් අනුමත කරන බවද ප්‍රනාන්දු මහතා පැවසීය."

අර්තාපල් පිළිබඳව තවත් වාර්තාවක් අද "ජනතා" පත්‍රයේ පළ වී තිබෙනවා. මා එයින්ද කොටසක් කියවන්න බලා පොරොත්තු වෙනවා :

"ඔස්ට්‍රේලියාවට ගිහින් ගෙනා බීජ අර්තාපල් කුණු වෙනවා. ගොවීනට බෙදා දීම සඳහා ඔස්ට්‍රේලියා වෙන් ගෙන ආ බීජ අර්තාපල් තොගය කුණුවීම අභිරහසක්ව පවතී. බීජ අර්තාපල් ටොන් 2,500ක් ගෙන්වූ බවත්, මෙයින් වැඩි කොටසක් කුණු වී ඇති බවත් දැන් සොයාගෙන තිබේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පිරිසක් ඔස්ට්‍රේලියාවට ගොස් මෙම බීජ අර්තාපල් තොගය පරීක්ෂා කළ බවද ඒවා මෙරටට ගෙන්වන ලද්දේ ඔවුන්ගේ අනුමැතියෙන් පසුව බවද ගොවිකම් අමාත්‍යාංශය කියයි. මෙම බීජ අර්තාපල් සිටුවා ටික දිනකින් පැළ මැරෙන්නට පටන් ගත් බවත් මේ නිසා උඩුකිඳ මැදකිඳ ආදී පළාත්වල අර්තාපල් වගාව විනාශ වෙමින් පවත්නා බවත් ගොවිකම් අමාත්‍යාංශයට වාර්තා වී ඇත."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අර්තාපල් ගොවියාට බීජ අර්තාපල් හොන්ඩරයක් රජයෙන් ලබා ගන්නට සිද්ධ වෙන්නේ රු. 67.20 ක මුදලකටයි. පොහොර හොන්ඩරයක මිල දැන් රුපියල් 24 කට ආසන්න මුදලක් වී තිබෙනවා. ඒ වාගේම කෘමිනාශක ද්‍රව්‍ය මිල අධික වී තිබෙනවා. මේ සියල්ලම සඳහා අධික වියදමක් දරා ගොවිතැන් පටන්ගත් ගොවියාට නිසරු බීජ අර්තාපල් බෙදා දීමෙන් ඇති වන භයානක තත්ත්වය ඇත්ත වශයෙන්ම ඉවසාගන්නට පුළුවන්කමක් නැහැ. අපට පෙනී යනවා බීජ අර්තාපල් ගෙනඒම සඳහා රජයේ නිලධාරීන් කීප දෙනකු ඔස්ට්රේලියාවටත් ගිහින් තිබෙන බව. එවැනි නිලධාරි පිරිසකුත් ගිහිල්ලයි මෙවැනි සිද්ධියකටත් මුහුණ පාන්නට සිද්ධ වුණේ. මේ විධියේ හේතු නිසා අද අර්තාපල් ගොවියා අන්ත ප්‍රපාතයකට වැටී සිටිනවා. තමන් ගොවිතැන් කළ බීජ අර්තාපල් පැළ වෙනවා වෙනුවට සම්පූර්ණයෙන්ම නරක් වී කුණු වී විනාශ වී ගියා. ඉතින් එවැනි තත්ත්වයකට මුහුණ පාන ගොවියා මොන තරම් අපහසු අමාරු තත්වයකට පත් වෙනවාද ?

නරක්වූ බීජ අර්තාපල් වෙනුවට හොඳ බීජ අර්තාපල් නැවත බෙදා දෙන්නට අද හස් කරන බව අපට දැනගන්නට ලැබුණා. එහෙත් මෙහිදී කල්පනා කර බැලිය යුතු තවත් වැදගත් දෙයක් තිබෙනවා. ගොවියාට මෙතෙක් වූ අලාභය ගැන වග කියන්නේ කවුද කියා අප කල්පනා කර බැලිය යුතුයි. ගොවියාගේ ශ්‍රමය යෙදුවා. සෑහෙන කාලයක් මහන්සි වී වැඩ කළා. පොහොර යෙදුවා. සෑහෙන වියදමක් දරන්න වුණා. එසේ නම් ඒවාට වග කියන්නේ කවුද ? ඒ අලාභය විඳ දරාගන්නේ කවුද ? ඒ එක්කම කල්පනා කළ යුත්තක් නම් සමහර විට මේ රටේ නිෂ්පාදනය කරන බීජ අර්තාපල් නැවත ඔවුන්ට බෙදා දුන් විට ඒ බීජ අර්තාපලුත් නරක් වුණොත් ඇති වන තත්ත්වය කුමක්ද යන්නයි. ඒ මොකද ? ඒ බීජ අර්තාපල්වලත් මොන විධියේ තත්ත්වයක් තිබෙනවාද කියා අපට කියන්න බැහැ. අර්තාපල් සඳහා පිට රටට ඇදී යන විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ලංකාවේම ඉතිරි කර ගැනීම සඳහා අර්තාපල් ගෙන්වීම සම්පූර්ණයෙන්ම නතර කර තිබෙන මේ අවස්ථාවේදී අර්තාපල් ව්‍යාපාරය පිළිබඳව රජය දක්වන සැලකිල්ල කිසිසේත් ප්‍රමානවත් නොවන බව කියන්නට ඕනෑ. නොයෙක් අවස්ථාවලදී නුසුදුසු බීජ අර්තාපල් බෙදා දීම නිසා අපේ ගම්බද ගොවීන්ට නොයෙකුත් හිරිහැරවලට මුහුණපාන්නට සිදු වන අතර විශාල වශයෙන් පාඩු සිදු වෙනවා. එසේ සිදු වීමෙන් පෙනී යන්නේ බීජ අර්තාපල් ලබා ගැනීම සහ ඒවා සකස් කිරීම පිළිබඳව රජය නිසි සැලකිල්ල දක්වන්නෙ නැති බවයි. සළු සලේ සභාපතිතුමාම කර තිබෙන ප්‍රකාශයෙන් එය පැහැදිලි වෙනවා. එතුමා මේ ආණ්ඩුවට සහයෝගය දෙන, තමුන්නාන්සේලාගේම පක්ෂයේ කෙනකු හැටියට මේ ව්‍යාපාරය පිළිබඳ අවංක හැඟීමක් ඇතිව කර තිබෙන්නේ සත්‍ය ප්‍රකාශයක්. ඒ නිසා ඒ පිළිබඳව යම්කිසි වැඩ පිළිවෙළක් යොදන්නට ඕනෑ. අර්තාපල් ව්‍යාපාරය මෙ රටින් සම්පූර්ණයෙන්ම නැති කර දැමීම සඳහා යම් කිසි ක්‍රියා මාර්ගයක් තිබෙනවාද කියා අපට සැක සිතෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

1963 දී ආරම්භ කරන ලද මේ අර්තාපල් ව්‍යාපාරය ක්‍රමක්‍රමයෙන් දියුණුවට පත් වුණා. එදා කෘෂිකර්ම ඇමතිව සිටි ගරු දොම්පේ මන්ත්‍රීතුමා (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) මේ ව්‍යාපාරය පිළිබඳව ලොකු උනන්දුවකින් ක්‍රියා කර ගොවීන්ට නියම අන්දමට බීජ අර්තාපල් ලබා දුන්නා පමණක් නොවෙයි, සහතික මිල ක්‍රමයක් ඇති කිරීමෙනුත් ගොවීන්ට ආධාර දුන්නා. අද කව්රුත් අර්තාපල් වවන්නේ අර්තාපල් වවන සෘතුවේදී පමණයි. ඒ හේතුව නිසා අස්වැන්න ලැබෙන කාලයේදී අර්තාපල් මිල ඉතා පහළ බහිනවා. පසුගිය වතාවේ අර්තාපල් රාත්තල ශත 30 ට, 35 ට, 40 ට විකිණීමට ගොවීන්ට සිදු වුණා. රු. 67.20 කට බීජ අර්තාපල් හොණ්ඩරයක් අර ගෙන ඒ මගින් ලැබෙන අස්වැන්න මේ තරම් අඩු මුදලකට විකිණීමෙන් ගොවියාට මුහුණපාන්නට සිදු වන තත්ත්වය කුමක්ද යන්න කාටත් පැහැදිලියි. පසුගිය වතාවේ නුසුදුසු බීජ අර්තාපල් බෙදා දීම නිසා ගොවීන්ට ලැබුනේ හොණ්ඩරයකට තවත් හොණ්ඩරයක් හෝ ඊටත් අඩු ප්‍රමාණයක් පමණයි. එසේනම් මේ ව්‍යාපාරයේ දියුණුවක් දකින්නට පුළුවන්ද? ඒ නිසා බීජ අර්තාපල් පිළිබඳව දැනට ඇති වී තිබෙන භයානක තත්ත්වය නැති කිරීම සඳහා යම් කිසි වැඩ පිළිවෙළක් ඇති නොකළොත් අර්තාපල් වගා කරන අපේ ගම්බද ගොවීන්ට ඉතාම භයානක තත්ත්වයකට මුහුණ දෙන්නට සිදු වෙනවා.

ගරු ඇමතිතුමාගේ කථාවේදී මිල පාලනය ගැන ප්‍රකාශ කළා. ගෘහෝපකරණ සෑම එකක් සම්බන්ධයෙන්ම මිල පාලනයක් තිබෙන බව එතුමා ප්‍රකාශ කළා. මිල පාලනය සම්බන්ධයෙන් නියම ක්‍රමයක් තිබෙන නිසා මහජනයාට නියම මිලට බඩු ලබා ගන්නට පුළුවන් බවත් එතුමා ප්‍රකාශ කළා. දැනට අවුරුදු දෙකකට, දෙකහමාරකට පමණ පෙර මිල පාලක නිලධාරීන් හදිසියේ කඩවලට පැන වැඩි මිලට විකුණන බඩු රාජසන්තක කළ බවත්, ඒ වෙළඳුන් සම්බන්ධයෙන් නීති මගින් ක්‍රියා කළ බවත් අප දන්නවා. එහෙත් අද තත්ත්වය එහෙම නොවෙයි. මිල පාලකයන් ඉන්නවාද නැද්ද කියාවත් දැනගත නොහැකි තත්ත්වයක් අද තිබෙන්නේ. වෙළෙන්දන්ට වුවමනා වුවමනා අන්දමට තමන්ට ඕනෑ කරන මිලකට බඩු විකුණන්නට අද ඉඩකඩ තිබෙනවා. ඒ නිසා මිල පාලනයක් කරනවාය, මේ මේ විධියට කරනවාය කීවත් එවැන්නක් නියම අන්දමින් සිදු නොවන බව මේ අවස්ථාවේදී කියන්නට ඕනෑ.

අනික් ප්‍රශ්නය ජීවන වියදම ගැනයි. ජීවන වියදම් වැඩිවීම සාධාරණ දෙයක්ය කියන එකයි මේ ගරු සභාවේදී කියවුණේ. ඒ කෙසේ වුවත් රජයේ සේවකයින්ගේ වැටුප සුළු ප්‍රමාණයකින් වැඩි වුණත්, අද බඩු මිල ඉහළ ගොස් තිබෙන ආකාරය දෙස බලන විට එසේ වැඩි වන ප්‍රමාණයට වඩා වැඩි මුදලක් වියදම් කරන්නට ඔවුන්ට සිදු වෙනවා. රජයේ සේවකයින්ගේ අංශයෙන් එසේ වන විට ගම්බදව සිටින ජනතාවගේ ජීවන තත්ත්වය සම්බන්ධව කොයි විධියකවත් විසඳීමක් ඇති වන්නේ නැහැ. ඔවුන්ට ස්ථිර රක්ෂාවක් නැහැ. ගොවිතැන කරන අයත් සියයට සියයක්ම නැහැ. ස්වල්පයයි ඉන්නේ. ගොවිතැන් කරන අය වැඩි වශයෙන් සමහර පළාත් වල සිටියත් හැම ප්‍රදේශයකම ඒ ආකාරයට නැහැ. රජයේ රැකියා කරන අයත් සියයට 5 කට වඩා නැහැ. තවත් කොටසක් එදිනෙදා තැනින් තැන වැඩපළ කර ජීවත් වන අයයි. දවසකට රුපියල් 3 ක හෝ 3.50 ක පඩියකට වැඩ කරන එවැනි කම්කරුවන්ට මේ අයවැය ලේඛනයෙන් ඇති වී තිබෙන්නේ මොන විධියේ සහනයක්ද? අන්න ඒකයි අපි බලන්නට ඕනෑ. පවුලේ හත් අට දෙනෙක් සිටිනවා නම් දිනකට රුපියල් තුනක හෝ තුනයි පනහක පඩියක් ලබාගෙන ජීවත් වන්නට පුළුවන්ද? ඒ අනුව බලන විට රජය නොමිලේ හාල් දෙනවාය, ඒ නිසා කිසිම කරදරයක් නැතිව ජීවත් වන්නට පුළුවන්ය, ජීවන වියදම නැඟීම සාධාරණය කියා තමුන්නාන්සේලාට කියන්නට පුළුවන්ද? ගම්බද ගොවි කම්කරු ජනතාව අතර සිටින කිසිම රක්ෂාවක් හෝ ආදායම් මාර්ගයක් නැති අය අද ඉතාම අමාරු තත්ත්වයකිනුයි ජීවත් වන්නේ. බඩුමිල නොයෙක් අන්දමින් ඉහළ ගොස් තිබෙනවා. ඒ නිසා ස්ථිර රක්ෂාවක් නැති අය අද බොහොම අමාරුවෙනුයි ජීවත් වන්නේ. තමුන්නාන්සේලා කියන්නේ ජීවන වියදම ඉහළ යෑම සාධාරණ දෙයක්, එය වළක්වන්නට බැහැ කියලයි. හොඳයි ජීවන වියදම ඉහළ



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අප්පුහාමි මයා.]

යෑම වළක්වන්නට බැරි නම් එය සාධාරණ දෙයක් නම් මා සඳහන් කළ අර ජනතා කොටස්වලට තමුන්නාන්සේලා ඇති කරන පහසුකම් මොනවාද? ඔවුන් ඒ අමාරු තත්ත්වයෙන් මුදා ගන්නේ කොහොමද? එයයි ප්‍රශ්නය. ඒ ප්‍රශ්නයට කිසිම අන්දමක විසඳුමක් ඇත්තේ නැහැ. ඒ නිසා ඔවුන් තව තවත් අමාරුවට වැටෙනවා; ප්‍රපාතයටම වැටෙනවා. ඒ නිසා මේ අයවැය ලේඛනයෙන් මේ රටේ ගම්බද සාමාන්‍ය ගොවි කම්කරු ජනතාවට කිසිම විධියක සහනයක් සැලසී තිබෙනවාය කියා අපට කියන්නට පුළුවන්කමක් නැහැ. මේ අවස්ථාවේදී අපට කියන්නට තිබෙන්නේ එයයි.

ඊළඟට එළවලු වගාව ගැන කියන්නට ඕනෑ. එළවලු වගාවෙන් ගොවීන්ට සෑහෙන ආදායමක් ලැබෙනවාය කියා කලින් කථා කළ ගරු ඇමතිතුමා කිව්වා. එමෙන්ම එළවලු මිල ඉහළ යෑම වළක්වන්නට බැරිය, යනාදී වශයෙනුත් කිව්වා. එහෙත් අද එළවලු ගොවියා අමාරු තත්ත්වයක සිටින බව අපට පෙනෙනවා. ගොවීන් එළවලු වගාව කරන්නේ කුඹුරු ගොවිතැන් ඉවර වුණාට පසුව ඉඩකඩ තිබෙන ප්‍රමාණයට අනුව වර්ෂාව ලැබෙන අන්දම ගැන සොයා බැලීමෙන් පසුවයි. එමෙන්ම එළවලු වගාව කෙරෙන්නේ එක්වරටම නිසා එය විශාල වශයෙන් කෙරෙනවා. ඒ නිසා කොහොම වත් එළවලු මිල ඉහළ යෑමක් සිදු වන්නේ නැහැ. එළවලු ගොවියා ගෝවා බෝංචි ආදී එළවලු වර්ග විකුණනු ලබන්නේ සත හතට අටට වැනි ඉතා සුළු ගණන්වලටයි. තත්ත්වය ඕක නම් ගොවියන්ට ඇති සහනය මොකක්ද? [බාධා කිරීමක්] වැලිමඩ ගරු මන්ත්‍රීතුමා (පර්සි සමරවීර මයා.) අහනවා, දැන් මිළ කොහොමද කියා. දැනට පවතින ඉඩෝරය නිසා, වතුර හිඟකම නිසා ගොවිතැන් පාළු වී ගොස් තිබෙනවා. වැලිමඩ ඡන්ද දායක කොට්ඨාශයේ තත්ත්වය කොහොමදැයි කියන්න මා දන්නේ නැහැ. එහෙත් ඇඩි නියඟය නිසා තම එළවළු වගාව හරිහැටි කර ගන්නට බැරි වී තිබීමේ හේතුවෙන් අපේ ප්‍රදේශයේ නම් ගොවීන් බොහෝ දෙනෙක් දැන් ගොවිතැන අත්හැර දමා රුපියල් 3.50 දවස් පඩියට කුලී වැඩට යනවා. ඒ ඇඩි නියඟින් එළවළු වගාව පාළු වී ගිහින් තිබෙන නිසා, එළවළු හිඟයක් ඇති වී තිබෙන නිසා මේ දවස්වල නම් එළවළු වලට තරමක මිළක් ලැබෙන බව ඇත්තයි. එහෙත් සරුසාර ලෙස එළවළු වැවෙන දවස්වල නම් තමන්ගේ එළවළු සඳහා සාධාරණ මිළක් ලබා ගන්නට ඒ දුප්පත් ගොවියන්ට කොහෙත්ම පුළුවන්කමක් නැහැ. තත්ත්වය එහෙම නම්, එළවළු වගා කරන ගොවියන්ගේ ජීවන තත්ත්වය උසස් යයි කියන්නේ කොහොමද?

ඉස්සර හාල් ටික පවා ගන්නට පෝළිම් ගියා යයි ඇමතිතුමා කීවා. දැන් ලැබෙන්නේ එක සේරුවක් නිසා ඉතිරි සේරුව ලබා ගැනීම සඳහා අපේ ප්‍රදේශවල දුප්පත් ජනතාව උදේන්ම කඩපිල්වල පෝළිම් ගැසී සිටින හැටි තමුන්නාන්සේලා නොදන්නවා ඇති. කඩ අරින්නේ උදේ අටටයි. එහෙත් උදේ 7 සිටම මිනිසුන් පෝළිම් ගැසී බලා සිටිනවා, කඩ අරින තුරු.

**කේ. වයි. එම්. විජේරත්න බණ්ඩා මයා.**
(සොරණාතොට)
*(திரு. கே. வை. எம். விஜேரத்ன பண்டா—சொரணத்தோட்டை)*
(Mr. K. Y. M. Wijeratne Banda—Soranatota)

දැන් පෝළිම් නැහැ; තිබෙන්නේ ජාතික පේළි පමණයි.

**අප්පුහාමි මයා.**
*(திரு. அப்புஹாமி)*
(Mr. Appuhamy)

නොමිළයේ දෙන හාල් සේරුවෙන් සතියක් ජීවත් වන්න බැරි නිසා, දුප්පත් මිනිසුන් සමහර සමුපකාර කඩවල කළමනාකරුවන්ට බල කරනවා, ඊළඟ සතියේ සේරුවත් දැන්ම දෙන්නය කියා. එවැනි අමාරු, අසීරු තත්ත්වයකිනුයි, අද ගම්බද දුප්පත් ජනතාව කාලය ගත කරන්නේ. එහෙත් තමුන්නාන්සේලාට නම් ඒවා පෙනෙන්නේ නැහැ. තමුන්නාන්සේලාගේ දේශපාලන දර්ශනය ගැන කල්පනා කරන විට එය පුදුමයට කාරණයකුත් නොවෙයි. එහෙත් නිතර දුප්පත් ගම්බද ජනතාව ඇසුරු කරන, ඔවුන්ගේ හැඟීම් පිළිබඳ අවබෝධයක් ඇති අපට නම් ඔවුන් විඳින කරදර, කම්කටොළු මොනවාදැයි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හොඳට පෙනෙනවා. පෝළිම් යුගයක් බිහි කළා යයි පසුගිය රජයට චෝදනා කළ තමුන්නාන්සේලා, දැන් ඒ පෝළිම් නැති කොට පේළි ඇති කර තිබෙන බව ඇත්තයි.

**ඩී. ඊ. තිලකරත්න මයා.** (රත්ගම)
*(திரு. டி. ஈ. திலகரத்ன—ரத்கம)*
(Mr. D. E. Tillekeratne—Ratgama)

නොමිළයේ හාල් ලැබෙන නිසා නොවැ, ඒ පේළි?

**අප්පුහාමි මයා.**
*(திரு. அப்புஹாமி)*
(Mr. Appuhamy)

නොමිළයේ ලැබෙන හාල් සේරුව ගන්න පමණක් නොවෙයි, පේළි තිබෙන්නේ.

තමුන්නාන්සේලාට නොපෙනුණත් මේ රටේ සාමාන්‍ය දුප්පත් ජනතාව අද ජීවත් වන්නේ ඉතාමත් කණගාටුදායක විධියට යි. රෝහල්වල ඉන්නා ලෙඩුන්ට බත් සප යන්නට බැරි නැතැයි කීවා. තමුන්නාන්සේලා ඒ ලෙඩුන්ට කොයි තරම් පාන් කවා තිබෙනවාද කීවොත්, දැන් ඔවුන්ට පාන් කියන්නත් බැරි තරම්. උදේට හා දවලට පමණක් නොව සමහර විට රෑටත් ඔවුන්ට ලැබෙන්නේ පාන්. හැම දාමත් පාන් කන්න බැහැ. සතියකට සීමිත දින ගණනක්වත් බත් දෙන්න බැරිද? ලෙඩ වුණාම සෞඛ්‍යය හීන වෙනවා. ශරීර ශක්තිය දුර්වල වෙනවා. එම නිසා ලෙඩුන්ට නියම විධියට බත් ටිකක් දෙන්න. සතියේ දින හතේම බැරි නම් අඩු වශයෙන් නියමිත දින කීපයකවත් දෙන්න. ගරු ඇමතිතුමාගේ ප්‍රකාශයේ හැටියට එහෙම දින කීපයක බත් ටිකක් දෙන්නට බැරි කමක් නැහැ. නමුත් බැරිකම නිසා නොවෙයි වුවමනාවක් නැතිකම නිසා එසේ බත් නොදෙන බව අපට පෙනෙනවා. මිනිසුන්ගේ අමාරුකම් ගැන අවබෝධයක් නැතිකම නිසයි එසේ ක්‍රියා කරන්නෙ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අයවැය ලේඛනය පිළිබඳව ඔය ධනපති කොටස් සහ ලොකු ලොකු වෙළඳ සමාගම් හැර රටේ සාමාන්‍ය මහජනතාව තුළ ගම් බද ගොවි කම්කරු ජනතාව තුළ ප්‍රසාදයක් නැහැ. මේ අයවැය ලේඛනයෙන් සාමාන්‍ය පන්තියට කිසිම සහනයක් පහසුකමක් සැලසී නැහැ. රජයේ සේවකයා තුළ වුවත් මේ අයවැය ලේඛනය ගැන ප්‍රසාදයක් නැහැ. සුළු මුදලකින් වැටුප් වැඩි වුණත් ජීවන අංකය ඉහළ ගොස් තිබෙන නිසා, බඩු මිල ඉහළ ගොස් තිබෙන නිසා, රජයේ සේවකයා තුළ වුවත් මේ අයවැය ලේඛනය ගැන පැහැදීමක් නැහැ. මේ රටේ දුප්පත් ගොවි කම්කරු ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා මේ අයවැය ලේඛනයෙන් පියවරක් ගෙන නැහැ. ජීවන අංකය පහත හෙළීම සඳහා පියවර ගෙන නැහැ. රැකිරක්ෂා ප්‍රශ්නය විසඳීම සඳහා පියවරක් ගෙන නැහැ. අද මේ රටේ රැකිරක්ෂා රහිත උදවිය ලක්ෂ හතක් පමණ සිටිනවා. ඒ අයට රැකිරක්ෂා ලබා දීමේ මාර්ගයක් මේ අයවැය ලේඛනයේ දක්නට නැහැ. මේ රටේ මහජනතාවට කිසිම සහනයක් කිසිම යහපතක් මේ අයවැය ලේඛනයෙන් සැලසී නොමැති බව නැවතත් සඳහන් කරමින් මගේ කථාව මෙයින් අවසාන කරනවා.

අ. භා. 5

**ජෝර්ජ් අබයගුණසේකර මයා.** (හඟුරන්කෙත)
*(திரு. ஜோர்ஜ் அபயகுணசேக்கர—ஹங்குரங்கெத்த)*
(Mr. George Abeyagoonasekera—Hanguranketa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලබන ආදායම් වර්ෂයේ අයවැය සම්බන්ධව කරුණු දෙක තුනක් ප්‍රකාශ කරන්නට ප්‍රථමයෙන් 1965 සිට පිට පිට ආදායම් වර්ෂ පහකට අයවැය වාර්තා ඉදිරිපත් කිරීමෙන් නව වාර්තාවක් පිහිටුවා මේ ගරු සභාවේත් රටේත් ගෞරවය දිනාගත් අපේ ගරු මුදල් ඇමතිතුමාට මමත් මගේ ප්‍රශංසාව පිරිනමනවා. ගරු මුදල් ඇමතිතුමා තුළ සහජයෙන්ම පිහිටා තිබෙන අවංකකම සහ සාධාරණකම එතුමාගේ නිර්මාණයන් වන මේ අයවැය ලේඛන වලින්ම විද්‍යාමාන වන බව අපට පෙනෙනවා. එවැනි විශේෂ ලක්ෂණයකින් යුත් "වන්නිනායක ලකුණ දරණ" තවත් අයවැය ලේඛන වැලක් මීළඟ වර්ෂයේ සිටත් මේ ගරු සභාවට ඉදිරිපත් කිරීමේ භාග්‍යය එතුමාට ලැබේවායි මා ප්‍රාර්ථනා කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අබයගුණසේකර මයා.]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය කාලය තුළ අයවැය ලේඛන ඉදිරිපත් කළ සෑම අවස්ථාවකදීම කලබලයකට, කරදරයකට, වැඩ වර්ජනයකට නැත්නම් හර්තාලයකට තුඩු දෙන අන්දමේ යම් දොසක්, ප්‍රමාද දොසක් ඒ අයවැය කථාවලින් කියවේවිය කියා සමහර දේශපාලන පක්ෂවල උදවිය උකුසු ඇස් යොමු කරවමින් පුල පුලා බලා ගෙන සිටියා. ඒ උදවියට ඒ බලාපොරොත්තුව ඉටු කර ගැනීමට නොහැකි වීම ගැන මා කනගාටු වෙනවා. අපි දන්නවා ප්‍රජාතන්ත්‍රවාදී රටවල් මෙන් නොව, ඒකාධිපති රටවල ඒකපාක්ෂික අයවැය ලේඛනයක් සකස් කර ඒ පාලන පක්ෂයට අභිමත පරිදි ක්‍රියා කරගෙන යන බව. ඇත්තෙන්ම ඔවුන්ගේ ඒ ප්‍රගති වාර්තා —සංවර්ධන වැඩවල ප්‍රගති වාර්තා—ගැන සමාලෝචනයක් කිරීමක් සිදු වන්නේ නැහැ. කිසිම වාද විවාදයක් කෙරෙන්නේ නැහැ. නමුත් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් තිබෙන අපේ රට වැනි රටවලට ලැබී තිබෙන වාසනාවක් නැත්නම් වර ප්‍රසාදයක් තමයි, මේ විධියට අයවැය ලේඛන විවාදයකට නැත්නම් දේශනයන්ට සවන් දෙන්න ඉඩ ලැබීම. මේ අන්දමට ප්‍රසිද්ධියේම රටේ සුභසිද්ධියට සෞභාග්‍යයට, අදාළ අයවැය ලේඛනයක් පිළියෙල කර ගෙන ඒ ගැන විවාදයක් පවා පවත්වනවා.

සාමාන්‍යයෙන් අප කවුරුත් අවබෝධ කර ගත යුතුව තිබෙන්නේ, බදු අය කර ගෙන, ඒ වගේම ද්‍රව්‍ය අපනයනයන්ගෙන් ලබා ගන්නා වූ ධනය සාධක සහිතව තක්සේරු කර ඊට පසුව එම ධනයෙන් රජයේ ආරක්ෂාව, රජයේ පරිපාලනය, රජයේ සමාජ සේවාවන් ආදී කටයුතුවලට සැලකිය යුතු මුදලක් වැය කරන බවයි. ඊට පසු රටේ අනාගත අභිවෘද්ධිය සඳහාත් යම්කිසි මුදලක් වෙන් කරන්න ඕනෑ. අපි දන්නවා යටත් විජිත සමයේ ලැබුණ ආදායම එදා සිටි පාලක පක්ෂයට අභිමත පරිදි ඔවුන්ට වුවමනා විධියට හිතුවක්කාර අන්දමට වැය කළ බව. එදා ඒ අය රටේ සංවර්ධන වැඩවලට සැලකියයුතු මුදල් ප්‍රමාණයක් වෙන් කළේ නැහැ. නමුත් මේ ශත වර්ෂයේ මුල් භාගයේදී අපේ ගම් නියම් ගම් විනාශ වී ජනගහනය අඩු වී දියුණුව අඩුවීගෙන යන අවස්ථාවේදී එදා රට පාලනය කළ ඒ ආණ්ඩුකාරයන් විසින් රටේ අභිවෘද්ධියට යම්කිසි මුදල් ප්‍රමාණයක් වැය කරන්න යෙදුනා. ඊට පසු මහජන නියෝජිතයන්ගේ සම්බන්ධකම් ඇතිව රට පාලනය කරන අවස්ථාවේදී සංවර්ධන කටයුතුවලට වැඩි වැඩියෙන් මුදල්ද යෙදෙව්වා. නමුත් මේ මෑත කාලයේදී සම්පූර්ණයෙන් ස්වාධීනත්වය ලබා ගත්තාට පසුව තමයි, පුළුල් වශයෙන් සංවිධානය වී සංවර්ධන වැඩ කටයුතුවලට මුදල් වෙන් කළේ.

වර්ෂයක් වර්ෂයක් පාසා සංවර්ධන කටයුතු වැඩි කරන්න වැඩි කරන්න, රටේ දියුණුව වැඩි වෙන්න වැඩි වෙන්න, ඒ සඳහා විශාල මුදල් ප්‍රමාණයක් වැය කරන්න සිදු වෙනවා. අපේ සෑම අයවැය ලේඛනයකම සඳහන් වී තිබෙනවා, පුනරාවර්තන වියදම්, ප්‍රාග්ධන වියදම් ආදිය සඳහා වැඩි වැඩියෙන් මුදල් වෙන් කළ යුතු බව. අපේ මේ රට දියුණු වීගෙන එන රටක් නම්, ආර්ථික සංවර්ධනය වැඩි දියුණු කරන මාර්ගයක ගමන් කරන රටක් නම්, ඇත්තෙන්ම මේ රටේ තිබෙන සීමිත මුදල් ප්‍රමාණයකින් සීමිත කාලයක් තුළදී සංවර්ධනයක් ඇති කරන්නට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා හැම රජයක්ම, විශේෂයෙන්ම ජාතික රජය 1965 දී බලයට පත් වුණ අවස්ථාවේදී ප්‍රතිඥා දුන්නා, කොයි විධියේ තත්ත්වයක් ඇති වුණත් කාර්මික හා කෘෂිකාර්මික අංශවලින් රටේ සංවර්ධනයට කටයුතු කරගෙන යනවාය කියා. ඒ අනුව අප කවුරුත් දන්න දෙයක් තමයි, කාර්මික මෙන්ම කෘෂිකාර්මික අංශයෙනුත් විශාල වැඩ රාශියක් අද කෙරීගෙන යන බව. මේ ගැන විස්තර මා මේ අවස්ථාවේදී නොකිව්වාට ගරු මුදල් ඇමතිතුමා විසින් "ආර්ථික හා සමාජ ප්‍රගතිය" යන පොතෙන් පැහැදිලි කර දී තිබෙනවා. ඒ පොතෙන් ඒ ගැන පැහැදිලිව දැනගන්න පුළුවන් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මේ වචන ස්වල්පය ප්‍රකාශ කරන්න අදහස් කළේ මෙන්න මේ හේතුව නිසයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ අයවැය ලේඛන විවාදය ආරම්භ කළ අවස්ථාවේ සිටම විරුද්ධ පක්ෂය තර්ක යක් වශයෙන් ඉදිරිපත් කළේ, විදේශ ආධාර, විදේශ ණය හා දේශීය ණය සම්බන්ධයෙනුයි.

හැම අංශයකින්ම, සර්වප්‍රකාරයෙන්ම ස්වයම්පෝෂිත රටක් මේ ලෝකයේ කිසිම තැනක ඇතැයි මා නම් හිතන්නේ නැහැ. කොයි රටකටත් පාගේ එක්තරා සීමා සහිත ප්‍රමාණයකින් යම් යම් අංශ යන් සම්බන්ධයෙන් පමණක් නම් ස්වයම්පෝෂිත භාවය ලබා ගන්නට පුළු වන්කමක් තිබිය හැකි බව මා පිළිගන් නවා. එහෙත් සම්පූර්ණයෙන්ම හැම දෙය කින්ම ස්වයම්පෝෂිතව ස්වාධීනව සිටින රටක් කොහේවත් ඇතැයි මට නම් විශ් වාස කරන්නට පුළුවන්කමක් නැහැ. හැම අතින්ම ස්වාධීනත්වය ලබා ගත් රටවල් තිබෙනවා නම් ඒවායේ වත්මන් සමයේ බල පවත්නා නොසන්සුන් භාවය, අසමගිය සහ යුද්ධ කෝලාහල වැනි දේවල් පවතින්නට පුළුවන්කමක් නැහැ.

කවර රටක් හෝ පළමුවෙන්ම බලා පොරොත්තු වන්නේ අප බලාපොරොත්තු වන්නා සේම ආහාරයෙන් ස්වයම්පෝ ෂිත වන්නටයි. ආහාරයෙන් ස්වයම් පෝෂිත භාවය ලබා ගැනීමෙන් පසු අත්‍ය වශ්‍ය වෙනත් පාරිභෝගික ද්‍රව්‍යවලින් ස්වයම්පෝෂිත භාවය ලබා ගැනීමට උත් සාහ කරනවා. මා කලිනුත් සඳහන් කර ඇති පරිදි මේ රටේ දැන් විශාල ව්‍යාපාර ඒ සඳහා ඇති කර තිබෙන බව තමුන් නාන්සේ දන්නවා. අපේ ආර්ථික තත්ත්වය දියුණු කිරීම පිණිස නොයෙක් ව්‍යාපාර ඇති කරගෙන තිබෙනවා. මහවැලි ගඟ හැරවීමේ යෝජනා ක්‍රමය ඒ අතර ප්‍රමුඛස්ථානයක් ගන්නවා. යෝජිත රන් දෙනි ව්‍යාපාරය වැනි වැඩ පිළිවෙළවල් අපේ රටේ සංවර්ධනය සඳහා කවර ආණ්ඩුවකින් නමුත් කෙරෙන්නටම ඕනෑ. ඒවා කිරීමෙනුයි රටකට අනාගත බලාපොරොත්තු ඇති කර ගන්නට පුළු වන් වන්නේ.

රටක සමෘද්ධිය සඳහා ආරම්භ කරනු ලබන ව්‍යාපාරවල වැඩ කටයුතු එක් අවු රුද්දකින් බැරි නම් අවුරුදු දෙකකින් හෝ ඒත් බැරි නම් විසිපහකින් හෝ පණ හකින් නමුත් කෙරෙන්නටම ඕනෑ. ඒ සඳහා අවශ්‍ය මුදල් තම රටෙන්ම ලබා ගන්නට බැරි නම් තමන්ගේ මිත්‍ර රට වලින් වුවත් ලබා ගන්නට ඕනෑ. මුදලින් පමණක් නොව වෙනත් ක්‍රමවලින් දෙනු ලබන ආධාර වෙතොත් ඒවාත් ලබා ගන් නට උත්සාහ කරන්නට ඕනෑ. විදේශ වලින් මුදලින් හෝ යන්ත්‍රෝපකරණ වලින් හෝ විශේෂඥ උපදෙස්වලින් හෝ ආධාර ලබා ගන්නට පුළුවනි. අපේ රටට අවශ්‍ය විදේශ ආධාර ලබා ගත යුතුය යනු මගේ පිළිගැනීමයි. එහි කිසිම වැරැද්දක් නැහැ. ණය වශයෙන් අප විදේශවලින් ලබා ගන්නා ආධාර අප විසින් ආපසු ගෙවිය යුතුව තිබෙන බව පිළිගත යුතුයි. කොයි තරම් විශාල මුදල් ප්‍රමාණයක් ණයට ගත්තත් ඒ ණය බර කවදාවත් අපේ අනාගත පරම්පරාවේ කර උඩ පට වන්නට සිදු වෙතැයි මා කල්පනා කරන් නේ නැහැ. අප ලබා ගන්නා ණයවල බර අපේ අනාගත පරම්පරාවට උසුලන්නට සිදු වන්නට හේතුවක් මට පෙනෙන්නේ නැහැ. අපේ සංවර්ධන ව්‍යාපාරවලින් ඉතා හොඳ ප්‍රතිඵල ලැබෙන බවට කිසිම සැකයක් නැහැ. අප මුදල් යොදවා පටන් ගන්න සංවර්ධනවලින් ලැබෙන ප්‍රතිඵල වලින් ඉතා කෙටි කාලයකදී ඒ ණය ගෙවන්නට අපට පුළුවන් වනු ඇතැයි මා විශ්වාස කරනවා. ඒ වාගේම ඒ කාර්යය කිසිම කරදරයක්ද නැතිව කරන්නට අපට පුළුවන් වනු ඇතැයි මා හැම විටම විශ්වාස කරනවා. එපමණක් නොව, විදේශවලට පවා අපේ හාල් නිර්යාත කරන ලදැයි ඉතිහාසයේ සඳහන් වන ඒ වාසනාවන්ත පරාක්‍රම යුගය පවා අපේ රටට නැවතත් උදා කරවා ගැනීමට අපට පුළුවන් වේතැයි මා තුළ දැඩි විශ්වාසයක් පවතිනවා.

අවුරුදු දෙදහස් පන්සියයකටත් අධික ඉතිහාසයක් ඇති සිංහලයන්ට—ලාංකික යන්ට—ගනු දෙනු තේරෙනවා. ණයක් ගැනීමේ වගකීම කුමක්දැයි අපේ ජාතියට තේරෙනවා. ඒ නිසා කවදාවත් මේ ණය නොගෙවා අත් හරින්නේ නැහැ. ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අබයගුණසේකර මයා.]
ගැනත් මා තුළ ලොකු විශ්වාසයක් තිබෙනවා. කිසිම ආණ්ඩුවක් ඒ ණය නොගෙවා හරින්නට කල්පනා කරනැයි මා හිතන්නේ නැහැ. කුඩා දරුවකුට වුවත් එකවරටම නැගිටින්නට බැහැ. එවැනි හැකියාවක් කිසිම දරුවකුට ලැබෙන්නේ නැහැ. බඩ ගාන කාලය පසු කර දණ ගාන කාලයට එනවා; ඊළඟට කෙනකු හෝ යමක් හෝ අල්ලාගෙන ටිකින් ටික නැගිටින්ට උත්සාහ කරනවා. කාගේ හෝ ආධාරයෙනුයි අන්තිමේදී ළමයා නැගිටින්නටත් ඇවිදින්නටත් හුරු වන්නේ. සාමාන්‍යයෙන් දරුවකු කෙරෙහි බලපාන ඒ න්‍යායධර්මයම ජාතියකටත් බල පානවා. ඒ නිසා අපටත් සෙසු රටවල ආධාර වුවමනා කරනවා. එවැනි ආධාර ලබා ගත්තාට කිසිම වැරද්දක් ඇත්තේත් නැහැ. ලෝක සම්මත සම්ප්‍රදායයන් අනුව, දැනට සංවර්ධනය වේගන යන රටවලට ආධාර දෙන්නට දැනටමත් යම් යම් සංවිධාන තිබෙන නිසා ඒ සංවිධානවලින් අවශ්‍ය ආධාර ලබා ගන්නට කිසිම කරදරයක් නැහැ. ඒ නිසා අපට ඒ ආධාර ලබාගන්නට පුළුවනි.

සංවර්ධන ව්‍යාපාර සම්බන්ධයෙන් මතක් කළ යුතුව තිබන්නේ ඇත්තෙන්ම විශාල ශ්‍රමයක් සහ මුදලක් යොදා ඇති කරගෙන යනු ලබන මේ කටයුතු ඉතාමත් හොඳින් හැකි තරම් සුපරීක්ෂාකාරීව කළ යුතු බවයි. ඒ බව අප විසින් රජයට මතක් කළ යුතුව තිබෙනවා. මේ සංවර්ධන කටයුතු යම්කිසි සංවිධානාත්මක සැලැස්මක් අනුව කෙරෙන්නට ඕනෑ. ඒ සඳහා වෙන් කරනු ලබන මුදල් සාධාරණ ලෙස නියමිත වැඩ වෙනුවෙන් වැය කෙරෙනවාදැයි සොයා බලන්නටත් ආණ්ඩුවට යුතුකමක් තිබෙනවා. මේ වගකීම ඇත්ත වශයෙන්ම භාර වී ඇත්තේ පාලක පක්ෂයටයි.

විශෙෂයෙන් මේ රටේ ඉතා වැදගත් බුද්ධිමත් පිරිසක් තමයි පාලන කටයුතු ක්‍රියාත්මක කිරීමෙහි යෙදී සිටින්නේ. ඒවාගේම මේ රටේ රජයේ සේවකයන්ට වෙන රටවල රජයේ සේවකයන්ට වඩා හොඳ දැනුමක් තිබෙන බව කවුරුත් පාහේ අවිවාදයෙන් පිළිගන්නවා. ගරු මුදල් ඇමතිතුමාගේ කථාවේදී මෙන්ම ගරු මුදල් ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමාගේ කථාවේදීත් අපේ රටේ රාජ්‍ය සේවකයන්ට ප්‍රශංසා කළා. ඒවාගේම රාජ්‍ය සේවකයන්ට ප්‍රශංසා කරන්නට මාත් මෙම අවස්ථාව උපයෝගි කර ගන්නවා. විදේශ ආධාර මුදල් යනාදිය ලබාගෙන රට දියුණු කරන්නට අප වෑයම් කරන අවස්ථාවේදී එම වැඩ පිළිවෙළ සාර්ථක කර ගැනීම පිණිස රජයේ සේවකයන්ගේ ආධාර උපකාර අපට වැඩි වැඩියෙන් වුවමනා කරනවා. මීට කලින් පැවති කිසිම රජයක් විසින් නොකළ අන්දමේ යහපතක් අපේ ගරු අගමැතිතුමා විසින් රජයේ සේවකයන්ට කර තිබෙන බව මෙම අවස්ථාවේදී සඳහන් කළ යුතුයි. ළඟදී පත් කළ වැටුප් කොමිසමේ අතුරු වාර්තාවේ නිර්දේශවලට අනුව ඒකාබද්ධ වැඩි වැටුපක් රජයේ සේවකයන්ට දෙන්නට තීරණය කර තිබෙනවා. එසේම රජයේ සේවකයන්ගේ යහපත පිණිස මුදල් අතින් සහ වෙනත් ක්‍රමවලින් ඔවුන්ට මීට පෙර නොයෙකුත් වතාවලදී මෙමෙ රජය ආධාර උපකාර කර තිබෙනවා. එහෙත් පසුගිය රජය ඔවුන්ට ආධාර උපකාර කරනවා වෙනුවට ජාතික සංවර්ධන අරමුදලය කියා සියයට ගණනක් රජයේ සේවකයන්ගේ මාසික වේතනයෙන් කපා ගත්තා. තත්ත්වය මෙසේ හෙයින් යම් යම් අවස්ථාවාදීන්ගේ වචනවලින් මංමුළා නොවී තමතමන්ගේ සේවය රට ජාතිය වෙනුවෙන් නිසි පරිදි කැප කර කටයුතු කරන්නට රජයේ සේවකයන් කල්පනා කළ යුතුයි.

මෙම අවස්ථාවේදී මට මතක් වෙනවා එක්තරා සිද්ධියක්. එදා රාජාසන කතා විවාදයේදී කථා කළ ගරු ඇමතිතුමා වලිගය නැති නරිනයිදේගේ සිද්ධාන්තයට අපගේ අවධානය යොමු කළා. සමහර අවස්ථාවලදී යම් යම් වැඩ කටයුතු කඩාකප්පල් කිරීමේ ව්‍යාපාරවල යෙදී සිටින ස්වල්ප දෙනෙක් රජයේ දෙපාර්තමේන්තු තුළින් අපට පෙනෙනවා. එම ස්වල්පදෙනාත් යම් යම් උදවියගේ අදහස් උදහස්වලට අනුව වගකීමෙන් තොරව ක්‍රියා කරන නිසායි එවැනි තත්ත්වයක් උද්ගත වී තිබෙන්නේ අද මේ රටට බලපාන සංවර්ධන ප්‍රශ්න නිරාකර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ණය කරන්නට වුවමනා කරන මුදල් උපයා ගැනීමේ කටයුත්තට අභ්‍යන්තර ප්‍රහේලිකාවක් වශයෙන් පැනනැඟී තිබෙන්නේ බදු මුදල් යනාදිය නිසියාකාර අය කර ගන්නට නොහැකිවීමයි. ආදායම් බදු ගෙවිය යුත්තන් වශයෙන් සැළකිය හැකි ධනවත් ව්‍යාපාරිකයන් වැනි උදවිය නිවැරදි ආදායම් විස්තර ඉදිරිපත් නොකරන නිසාත් ගෙවන්නට තිබෙන බදු මුදල් කලට වේලාවට නොගෙවන නිසාත් ඒ පිළිබඳව එක්තරා කරදරකාරී තත්ත්වයකට මුහුණ දෙන්නට සිදු වී තිබෙනවා. එසේ හෙයින් රට වැසියන් වශයෙන් සිටින එවැනි පුද්ගලයනුත් ඒවාගේම රජයේ සේවකයනුත් එම කාරණය පිළිබඳව ටිකක් සෝදිසියෙන් සහ විමසිලිමත් ආකාරයෙන් කට යුතු කළොත් මෙම ප්‍රශ්නය ඉතා ඉක්මණින්ම නිරාකරණය කරගන්නට අපට පුළුවනි.

අපට සෑම අවස්ථාවකදීම දෝෂාරෝපණය කරන ප්‍රශ්නයක් තමයි රැකී රක්ෂා විරහිතකම. මේ සම්බන්ධව වචන ස්වල්පයක් කථා කළ ගරු මුදල් උප ඇමතිතුමා කිව්වා, මෙය රජයක් රජයක් පාසාම පසු පසු ආ නින්දනීය පරවෙණියක් කියා. ඒ වාගේම මේ ප්‍රශ්නය ලෝක ප්‍රශ්නයක් බව අප පිළිගන්න ඕනැ. රක්ෂා විරහිත ප්‍රශ්නය මේ රටට පමණක් සීමා වූ ප්‍රශ්නයක් නොවෙයි. එහෙත් අපේ රට පමණක් ගැන කල්පනා කර බලනවා නම් මෙයට ප්‍රධාන වශයෙන් මූල්ව ඇති හේතු කීපයක් තිබෙනවා. මෙම ගරු සභාවෙ ඕනැම ගරු මන්ත්‍රීතුමෙක් පිළිගන්නවා ඇති, එයින් ප්‍රධාන හේතුවක් වන්නේ අපේ අධ්‍යාපනයේ වරද බව. කිසිම පිළිවෙළක් නැති, සංවිධානයක් නැති, අධ්‍යාපනයක් තිබුණ නිසා එහි ප්‍රතිඵලයක් වශයෙන් රැකී රක්ෂා විරහිත භාවයේ ප්‍රශ්නය මේ ඩිග්‍රියට උග්‍ර වී තිබෙන බව තමුන්නාන්සේලා කවුරුත් පිළිගන්නා කාරණයක්; පිළිගතයුතු කාරණයක්.

මා හිතනවා, 1940 දි පමණ මේ රටේ නිදහස් අධ්‍යාපන ක්‍රමයක් ඇති කෙළේ ඊට කලින් නිදහස් අධ්‍යාපන ක්‍රමයක් තිබුණේ නැති නිසා නොවන බව. ඒ රටේ ස්වභාෂාව ඉගැන්වීම පිණිස රජය මගින් පාඨශාලා ඇති කර ඉගැන්නූ අතර ඒ සඳහා කිසිම ගාස්තුවක් අය කෙළේ නැහැ. යම් මුදලක් අය කළා නම් අය කෙළේ ඉංගිරිසි අධ්‍යාපනය ලබා දීම පිණිසයි. පසුව නිදහස් අධ්‍යාපනයක් ඇති කෙළේ ඇත්තෙන්ම ගම්බද දරුවන්ටද ඉංගිරිසි අධ්‍යාපනයක් නොමිලේ ලබා දීම පිණිසයි. ඒ සංවිධානය අනුව තමයි, විශාල ගොඩනැගිලි තනා, මධ්‍ය මහා විද්‍යාල ඇති කර, උගත් උපාධිධාරීන් පත් කරගෙන අධ්‍යාපනය පිළිබඳ වෙනසක් කෙළේ. එහෙත් 1956 දී ඒ තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස් වුණා. ඉංගිරිසි භාෂාව ඉගැන්වීම නැති වුණා. එහි ප්‍රතිඵලයක් වශයෙන් විශ්ව විද්‍යාලවලින් පිට වී ඇති විශාල සංඛ්‍යාවක් අද රැකියා විරහිතව සිටිනවා. එම සංඛ්‍යාව 15,000 ක් පමණය කියා ආණ්ඩුව ගණන් බලා තිබෙනවා. ඒ නිසා දැන් අධ්‍යාපන ප්‍රතිසංවිධානයක් කරගෙන යන්නේ දැන්ම ඒ සඳහා ප්‍රතිකර්මයක් නොකළොත් ප්‍රශ්නය උග්‍ර වන්නට ඉඩ තිබෙන නිසයි. ඒ සම්බන්ධයෙන් මා වැඩියෙන් කථා කරන්නට යන්නෙ නැහැ.

අධ්‍යාපන දෙපාර්තමේන්තුවට සිය වසක් ගත වී තිබෙනවා. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ වයස අවුරුදු සියයක් වනවාත් සමගම මා හිතනවා, අධ්‍යාපන ඇමතිතුමාටත් සියයකුත් එකක් ප්‍රශ්න විසඳන්නට අද සිදු වී තිබෙනවා කියා. මෑතදී අධ්‍යාපන ඇමතිතුමාට සාගරයෙන් එතෙරව ගොස් තමාගේ ආදරණීය දූ වූ සාගරිකා ආපසු ගෙන එන්නට සිද්ධ වුණා. එවැනි විශාල ප්‍රශ්න වලට එතුමාට මුහුණපාන්නට සිදු වී තිබෙන නිසා මේ අවස්ථාවෙ හැටියට මා ඒ ප්‍රශ්න ගැන වැඩි දුර කියන්න යන්නෙ නැහැ. එහෙත් මා සෑම අවස්ථාවකදී අපේ තරුණ පරපුරට දෙන අවවාදය නම්, කලක් රජයෙන් හා පෞද්ගලික අංශයෙන් රැකී රක්ෂා බලාපොරොත්තු වුණත්, ඒ වාගේම බොහෝ දෙනකුට එලෙස රැකී රක්ෂා ලබාගන්නට පුළුවන් වුණත්, දැන් සම්පූර්ණයෙන්ම ඒ තත්තවය වෙනස් වී තිබෙන නිසා පසු ගිය කාලයේදී මෙන් ලොකු සෝෂාවක් ඇති කර නැවතත් කෙතට හේනට ගොස් ගොවි ... කරමුය කියන අදහස ඇති කරගෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අබයගුණසේකර මයා.]

කටයුතු කළ යුතු බවයි. මගේ හැඟීමේ හැටියට ඇමති මණ්ඩලයත් ඒ සඳහා උනන්දු වෙනවා. දැන් ස්වේච්ඡා සේවක ක්‍රම ඇති කර නොයෙකුත් කටයුතු කර තිබෙන නිසා මා හිතනවා, පුළුවන් තරම් ඉක්මනින් ඒ ක්‍රම සාර්ථක කරගැනීමට පුළුවන් වේවි කියා.

රැකී රක්ෂා ප්‍රශ්නය ගැන කථා කරන විට, මගේ ලොකු අවිශ්වාසයක් තිබෙනවා, රැකී රක්ෂා සඳහා ලියාපදිංචි කිරීමේ පිළිවෙළ පිරිසිදුද කියා. අද කම්කරු දෙපාර්තමේන්තුවේ රැකී රක්ෂා කාර්යාංශ මගින් රැකී රක්ෂා නැතියවුන් ලියාපදිංචි කිරීමේ කටයුතු පිළිබඳව සංශෝධනයක් කළ යුතුය යනු මගේ විශ්වාසයයි. මා හිතන හැටියට බොහෝ ස්ථානවල මේ ලියාපදිංචි කිරීම් පිරිසිදුව කෙරෙන්නේ නැහැ. එමෙන්ම කාර්යාංශ කිහිපයකින් රැකී රක්ෂා නැති උදවිය ලියාපදිංචි කරන නිසාත් මේ සංඛ්‍යා නිවැරදි සංඛ්‍යා වශයෙන් අපට පිළිගන්නට අමාරුයි. එම නිසා මේ ක්‍රමය වෙනස් කර, රැකී රක්ෂා නැතියවුන් ලියාපදිංචි කිරීමේ මධ්‍යස්ථාන නගරවලට පමණක් සීමා නොකර ගම්බද ප්‍රදේශවලටත් විමධ්‍යගත කළොත් — විශේෂයෙන් රැකී රක්ෂා නැති අයගෙන් ලිඛිත ප්‍රකාශයක් ලබාගෙන ආදා යම් නිලධාරී කාර්යාංශ මගින් මේ ලියාපදිංචි කිරීම් සිදු කිරීමට විධිවිධාන යෙදුවොත්—දැනට වඩා හොඳින් ඒ කටයුත්ත කළහැකි යයි මා විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගරු සභාවේ දෙපාර්ශ්වයේම ගරු මන්ත්‍රීවරුන් හැම විවාදයේදීම වගේ කරන දේශනවලින්—මටත් දැන් අවුරුදු 5ක් තිස්සේ මේ දේශනවලට ඇහුම්කන් දෙන්නට වාසනාවක්, වරප්‍රසාදයක් තිබුණා—බොහෝවිට කියන්නේ එකම දෙයක් බව අප සුපරීක්ෂාකාරීව කල්පනා කර බැලුවොත් අපට අවබෝධ වෙනවා. අසුවල් වඩේ කෙරෙන්නෙ නැහැ අසුවල් වැඩේ කෙරෙන හැටි හොඳ නැහැ, කියා එකිනෙකා දෝෂාරෝපණය කර ගන්නවා.

අද නොයෙක් විධියෙන් කල්පනා කර බැලුවාම මේ ජීවන වියදම වැඩි වීමේ ප්‍රශ්නය ලංකාවට පමණක් සීමා වූ ප්‍රශ්නයක් නොවන බව පෙනී යනවා. පිටරටවල, මේ ළඟ තිබෙන ඉන්දියාවේ, බඩුවල මිළ අපේ රටේ මෙන් දෙතුන් ගුණයකින් වැඩි වී තිබෙනවා. දේශාටනයේ යෙදී මෙහි පැමිණි භවතුන්ගේ ප්‍රකාශවලිනුත්, පත්‍ර මාර්ගයෙන් හා නොයෙක් නිවේදන මාර්ගයෙන් ලෝක වෙළඳපොළේ භාණ්ඩවල මිළ පරීක්ෂා කිරීමෙනුත් අපට අවබෝධ වෙනවා ජීවන වියදම අතින් අපි ඉතා වාසනාවන්ත තත්ත්වයක සිටින පිරිසක් බව.

ආහාර වගා ව්‍යාපාරය ගැන කථා කරද්දී ඇතැම් ගරු මන්ත්‍රීවරුන් ප්‍රශ්න කළා, ආහාර නිෂ්පාදනය එතරම් දියුණු නම් ආරෝග්‍යශාලාවල සිටින නේවාසික රෝගීන්ට ආහාර වේලක් දෙන්ට බැරි ඇයි කියා. යම් විධියකින් ඒ ලෙඩුන් භාර වෛද්‍යවරුන් ඒ රෝගීන්ට බත් වේලක් දිය යුතුය කියා නිර්දේශ කරනවා නම් ඒ ඉල්ලීම ඉටු කරන්න රජයට කිසිසේත්ම බැරිකමක් නැහැ. ගරු සෞඛ්‍ය ඇමතිතුමාගේ පෞද්ගලික වුවමනාව උඩ ඇති කර තිබෙන සංවිධානයක් අනුව බොහෝ ආරෝග්‍යශාලාවල නේවාසික රෝගීන්ට දහවල් ආහාරය දෙන්නට නොයෙකුත් සමිති සමාගම් මගින් උදව් කරනවා. අද ඕනෑම ගමක ඕනෑම කඩයකින් හාල් මිළ දී ගැනීමට පුළුවන්කම තිබෙනවා. මම හිතන හැටියට අද ලංකාවේ හාල් සේරුවක් සාමාන්‍යයෙන් කිසි කරදරයක් නැතිව රුපියලකට මිළදී ගන්ට පුළුවන්කම තිබෙනවා. රජයේ ඉල්ලීම පිට හැකි තරම් රජයට සහයෝගය දී කටයුතු කරන ගොවියාගේ තත්ත්වය උසස් කරන්නට යයි අපි ඉල්ලා සිටින්නේ ඒ නිසයි. රටේ ආහාර ද්‍රව්‍ය සුලභ කිරීමේ මේ ව්‍යාපාරයට අප දෙපාර්ශ්වයේම අනුබලය ලැබෙනවා නම් ඉතා සුළු කාලයකින් ආහාරයෙන් අපේ රට ස්වයංපෝෂිත කර ගන්ට පුළුවනි.

කල්ලි ගැසී කටයුතු කිරීමෙන් මේ සුළු රට බේරා ගන්නට පුළුවන් කියා මා හිතන්නෙ නැහැ. පාසල් යන කුඩා ළමයකුට පවා ඔහුගේ දැනුම අනුව කල්පනා කරන විට මේ රටේ බොහොම දෙනෙකු නොයෙක් විධියේ පිල්වලට බෙදී මේ රට දියුණු කරන්නට අදහස් කරන බව පෙනී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යනවා. ඉන්දියාවේ ඩී. එම්. කේ. සංවිධාන යට පක්ෂපාතව, මොස්කව්වලට පක්ෂ පාතව, පීකිංවලට පක්ෂපාතව මේ රටේ සුභසිද්ධියක් ඇති කරන්නට පුළුවන් ය කියා සමහරුන් හිතනවා. මේ රටේ සියලු දෙනාම ලාංකිකයන් වශයෙන් එකතු වී කටයුතු කළොත් පමණයි මේ රටේ සුභ සිද්ධිය අපට ඇති කර ගන්නට පුළුවන් වෙන්නෙ. ඒකට මා නිදර්ශනයක් ඉදිරි පත් කරන්ට කැමතියි. මේ මනුෂ්‍ය ඉතිහාසයේ කවදාවත් නොසිදුවුණු දෙයක් තමයි, ඇමෙරිකන් සහෝදරයන් හඳට යාම. හඳට යෑම ලෝකයේ ජනගහ ණයෙන් පහෙන් පංගුවකට ටෙලිවිෂන් මඟින් දැක ගන්නට පුළුවන්කම ලැබුණු නමුත් අපේ දුප්පත්කම නිසා අපට ඒක අපේ ඇස් දෙකෙන් දැක ගන්නට පුළුවන් වුණේ නැහැ. අප ජාතියක් වශයෙන් එකම පෙරමුණකට අවුත් කටයුතු කළ හොත් ඒ වරප්‍රසාදය, ඒ වාසනාවන්ත ජීවිතය අපටත් ලබා ගන්නට අමාරු වන්නේ නැහැ. මේ ඉල්ලීම මෙම ගරු සභාව ඉදිරිපිට තබමින්, මගේ වචන ස්වල්පය සාවධානව අසාගෙන සිටි ගරු නියෝජ්‍ය කථානායකතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

අ. භා. 5.26

**එස්. කතිරවේලුපිල්ලෙ මයා.** (කෝපායි)
*(திரு. எஸ். கதிரவேலுப்பிள்ளை—கோப்பாய்)*
(Mr. S. Kathiravelupillai—Kopai)

*கௌரவ உப சபாநாயகர் அவர்களே, இந்த நேரத்தில் எனக்குப் பேச அவகாசம் தந்ததற்கு நான் முதலில் எனது மனமுவந்த நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன் இந்த வரவுசெலவுத் திட்ட விவாதத்திலே முக்கியமான பல அம்சங்கள் பற்றிப் பேசப்பட்டன. அத்துடன், முக்கிய மில்லாததும் தொடர்பு இல்லாததுமான பல அம்சங்கள் பற்றியும் பேசப்பட்டன. கௌரவ நிதி அமைச்சருடைய பேச்சிலேயும் அரசாங்க தரப்பிலே பேசுகின்றவர்களுடைய பேச்சிலே யும் ஒரு விஷயம் ஏற்றுக்கொள்ளப்பட்டதாக இருந்தது. அதாவது, விலைவாசிகளைக் குறைக்க முடியாதென்று அவர்கள் ஏற்றுக் கொண்டார்கள். நாட்டு மக்கள் வாங்கும் பொருட்களில் அத்தியாவசியமான பொருட் கள் பல இருக்கின்றன. அவற்றின் விலைவாசி களைக்கூடக் குறைக்க முடியாவென்றும் அபி விருத்தியடைந்து வரும் நாடுகளிலே விலை வாசிகள் ஏறிக்கொண்டுதான் போகும் என் றும் அபிவிருத்தியடைந்த நாடுகளிலே கூட பொருட்களின் விலை உச்சத்திலே இருக்கின் றன என்றும் எடுத்துச் சொல்லி, வாழ்க்கைச் செலவைக் கட்டுப்படுத்த முடியாது, பொருட் களின் விலையைக் குறைக்க முடியாது என்ற திட்டவட்டமான ஒரு கருத்தை அவர்கள் ஏற்றுக் கொண்டார்கள்.*

*ஒரு பக்கம் சில விஷயங்களைப் பொறுத்த வரையிலே இது உண்மையாக இருந்தாலும் வாழ்க்கையின் பல துறைகளிலே அத்தியாவ சியமாகத் தேவைப்படும் பொருட்களை நாம் விலைக் கண்கொண்டு கவனிக்கும்பொழுது, இலங்கையிலே உற்பத்தி செய்யப்படும் பொருள்கள் என்றாலும் வெளி நாடுகளிலே இருந்து வரும் பொருள்கள் என்றாலும் காரணமில்லாமல் உயர்ந்த விலைக்கு விற்கப் படுவதைக் காண்கிறோம். அதனைக் கட்டுப் படுத்தலாம். ஆனால், அந்த முயற்சியை அர சாங்கம் எடுக்கவில்லை. பொருட்களை அநியாய மான விலைக்கு விற்பனையாளர் விற்பதையும் அநியாயமான விலைக்கு உற்பத்தியாளர் விற் பதையும் அரசாங்கம் கட்டுப்படுத்தவில்லை. ஆகவே, விலைவாசிகள் ஏற்றத்தைத் தடுத்து நிறுத்த அரசாங்கம் நடவடிக்கை எடுக்காமல் இருப்பது வருந்தத் தக்கது.*

*அடுத்ததாக, 'இந்தப் பிரச்சினையை விலை வாசிக்கட்டுப்பாடு, விலை குறைப்பு முதலிய வற்றால் தீர்க்க முடியாது; எந்த விலையென்று லும் அதைக் கொடுத்து வாங்கும் வல்லமையை மக்களுக்குக் கொடுத்திருக்கிறோம்' என்ற ஒரு கருத்துப்பட கௌரவ விஞ்ஞான ஆய்வு, வீடமைப்பு அமைச்சர் சொன்னார். அப்படிச் சொல்லும் பொழுது, பொலன்னறு வையிலே 500 மெஷின்கள் ஒரு நாளைக்கு விற் பனையாகின்றன என்று சொன்னார். அப்படிப் பல காரணங்களை எடுத்துச் சொல்லி, விலை வாசிகள் உயர்ந்து கொண்டே போகின்றதென் றாலும் அதற்கேற்ற விலைகளைக் கொடுத்து வாங்கக்கூடிய சக்தியை மக்களுக்குக் கொடுத் திருக்கிறோம் என்ற கருத்துப்படப் பலர் பேசி னார்கள். ஆனால், இந்த நாட்டிலே இருக்கின்ற வேலையில்லாத் திண்டாட்டத்தைப் பற்றியும் இந்த 'வாங்கும் பலத்தை' யாருக்குக்*


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[කතිරවේලුපිල්ලෙ මයා.]
கொடுத்திருக்கிருர்கள் என்பதையும் ஆலோசித்தால் அந்தக் கூற்று ஒரு பிழையான கூற்ருகத் தோன்றுகின்றது.

வாழ்க்கை நடத்துவதற்கு வேலை வாய்ப்பு வேண்டும். வேலை வாய்ப்பு உடைய மக்களுக்கு மட்டும்தான், ஒரு சிலருக்கு மட்டும்தான், ஒரு பகுதியிலுள்ள மக்களுக்கு மட்டும்தான் சம்பள உயர்வு முதலியவற்ருல் உயர்ந்துகொண்டு போகும் வாழ்க்கைச் செலவைச் சமாளிக்க வசதி செய்யப்படுகின்றதேயொழிய, வேலையில்லாத திண்டாட்டத்தினுல் கஷ்டப்படும் மக்களுக்கு, வேலையில்லாமல் அதிகரித்துக் கொண்டேவரும் மக்களுக்கு வாழ்க்கைக்கு அத்தியாவசியமான பொருட்களை வாங்கும் தன்மையை, சக்தியை அரசாங்கம் கொடுக்கவில்லை. ஆகவே, வேலையில்லாத திண்டாட்டம் பெருகிக்கொண்டு போகும் நிலையிலே மக்களுக்கு வாங்கும் சத்தியைக் கொடுத்திருக்கிருேம் என்று சொல்வது பொருந்தாது. அதற்குப் பரிகாரம் காணவேண்டுமென்ருல் இந்த வேலையில்லாத திண்டாட்டத்தைத் தீர்த்திருக்க வேண்டும். முற்றும் தீர்க்கமுடியாதுவிட்டாலும் ஓர் எல்லைக்குட்பட்ட அளவுக்காவது தீர்த்திருக்க வேண்டும். இவர்களுடைய கூற்றுப்படி விலைவாசிகள் ஏற்றத்தைத் தடுக்க முடியாது, வேலை இல்லாத் திண்டாட்டத்தைத் தீர்க்க முடியாது. இந்த இரண்டையும் ஒரே தடவையில் சொல்லும் நிலையில்தான் இவர்கள் இருக்கிருர்கள். அரசாங்கத்தின் கொள்கைகள் பல முக்கியமாக விவசாய உற்பத்தித் துறையிலும் கைத்தொழில் துறையிலும் பலருக்கு வேலை கொடுக்கக்கூடியதாக அமைந்திருக்கின்றதாகக் கூறப்படுகின்றது. நடைமுறையில் எண்ணிக்கைகளையும் புள்ளி விபரங்களையும் பார்த்தால் இன்று வேலையில்லாத திண்டாட்டம் பெருகியிருக்கின்றது.

அரசாங்கம் செய்ததை எடுத்துச் சொன்ஞல் மட்டும் போதாது. அரசாங்கம் செய்யாததையும், செய்யக்கூடியதாக இருந்தவைகளில் செய்யாமல் விட்டவற்றையும் பற்றியும் நாம் ஆராய வேண்டும். விவசாயத் துறையில் இளைஞர்கள் இன்றும் நல்ல நிலங்களுக்கு விண்ணப்பம் செய்து கொண்டிருக்கிருர்கள். அவர்கள் விவசாயத்துறையில் ஈடுபட்டு இந்த நாட்டு வளத்தைப் பெருக்க ஆவல் உள்ளவர்களாக இருக்கிருர்கள். அவர்களுக்கு அரசாங்கம் இன்னும் அவர்கள் கேட்ட அளவுக்கு நிலங்களை வழங்கவில்லை. நிலங்கள் இருந்தும் இளைஞர்களுக்கு நிலங்கள் வழங்கப்படவில்லை. இத்தகைய ஒரு சூழ்நிலை நாட்டில் இருப்பது பெரியதொரு குறையாகும். கடந்த நாலரை ஐந்து வருடங்களுக்குள் விவசாயத் துறையில் முக்கியமாக உபஉணவு உற்பத்தித் துறையில் இன்னும்பல சாதனைகளைச் செய்திருக்கலாம். முயற்சியும் சிந்தனையும் இல்லாததால் இவ்வித சாதனைகள் செய்யப்படாமல் எங்கள் நாட்டுப் பொருளாதார நிலையும் உணவு உற்பத்தி நிலையும், வேலைகளைப் பெறும் வாய்ப்புக்களும் மக்களைப் பாதிக்கும் அளவுக்கு வந்து விட்டன.

உருளைக்கிழங்குச் செய்கை எவ்வளவுக்கு வளர்ந்திருக்கிறதோ, உருளைக்கிழங்கு இறக்குமதியை நிறுத்தி அந்த உற்பத்திக்கு அரசாங்கம் எவ்வளவு ஊக்கம் கொடுத்திருக்கிறதோ அதைப்போல மற்ற உபஉணவு உற்பத்திக்கும் அரசாங்கம் ஊக்கம் கொடுக்கவில்லை என்று சொல்ல வேண்டும். முக்கியமாக எனது தொகுதியைப் பொறுத்த மட்டிலே இந்த நாட்டிலே ஏறக்குறைய மூன்றிலொரு பகுதிக்கு மேல், அரைவாசிக்குட்பட ஈரவெண்காய உற்பத்தி சிறப்பாக நடக்கிறது. அதுவும் என்னுடைய தொகுதியிலே மிக அதிகமாக ஈரவெண்காய உற்பத்தி நடக்கிறது. நாணய மதிப்புக்குறைவின் பின் நெல் உற்பத்திக்கு ஊக்கமளிக்க நெல்லின் உத்தரவாத விலையை ஏற்றியதுபோல் வெண்காயத்தின் உத்தரவாத விலையையும் ஏற்றவேண்டுமென்று நாங்கள் பல முறை கேட்டோம். ஆனல் அரசாங்கம் அதற்குச் செவி சாய்க்கவில்லை. பல முறை அதைப்பற்றி எழுதியும் அமைச்சர் அவர்களிடமிருந்து பதிலே கிடைக்கவில்லை. அதுபற்றி பிரதமருடனும் நாங்கள் ஆலோசித்தோம். ஒரு பரிகாரமும் கிடைக்கவில்லை. வெண்காயத்தைப் பொறுத்தவரையிலே உத்தரவாத விலை முன்னிருந்த நிலையிலேதானிருக்கிறது ஆனல் வெண்காயத்தை வெளிநாட்டிருந்து இறக்குமதி செய்கிருர்கள். பருவமல்லாத காலத்தில், வெண்காயம் குறைந்துவிட்டது என்று ஏதோ ஒரு சாட்டைச் சொல்லி வெண்காயத்தை இறக்குமதி செய்கிருர்கள். சில வேளைகளில், அவ்வாறு இறக்குமதி செய்கின்ற காலம் எங்கள் நாட்டிலே வெண்காயம் அதிகமாக உற்பத்தி செய்யப்படுகின்ற காலமாகும். அந்த நேரத்தில் இந்த வெண்காய உற்பத்தியாளர்களுடைய நிலைமை படுமோச

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

மாக மாறுகிறது. இதைப்பற்றிப் பிரஸ்தாபித்தாலும் பதில் கிடைப்பதில்லே. இப்பொழுது, உற்சாகமில்லாத காரணத்தாலும் உத்தரவாத விலேயை ஏற்றிக் கொடுக்க மறுத்ததாலும் எனது தொகுதியைப் பொறுத்த மட்டிலே வெண்காய உற்பத்தி குறைந்துவிட்டது.

வெண்காய உற்பத்தியிலே உத்தரவாத விலே காணுது; கொடுக்க வேண்டிய கூலி முதலியவை ஏறிக்கொண்டு வந்துவிட்டது; வெண்காய உற்பத்தி செய்வது கஷ்டம் என்று மக்கள் அதை மறந்துவிட்டு உருளேக்கிழங்கு உற்பத்தியிலே இப்பொழுது கவனம் செலுத்துகிருர்கள். இதனுல் நாட்டுக்கே நட்டம். உருளேக்கிழங்கைப் போலல்லாது வெண்காயம் ஒரு நல்ல உணவு. சத்து நிறைந்த உணவு. நாட்டிலே வெண்காய உற்பத்தி குறைந்தால் வெளிநாட்டிலேயிருந்து வெண்காயத்தை இறக்குமதி செய்ய வேண்டிய நிர்ப்பந்தம் ஏற்பட்டு வெளிநாட்டுச் செலாவணி அதிக அளவில் ஒழிக்கப்படுகிறது. இந்த அரசாங்கம் வெளிநாட்டு வெண்காயத்தைப் பணம் கொடுத்து வாங்கத் தயாராக இருக்கிறது. உள்நாட்டு வெண்காய உற்பத்தியாளர்களுக்கு பணம் கொடுத்து வெண்காய உற்பத்தியை ஏற்ற முறையில் வளர்க்க ஊக்கம் கொடுக்காமல், அக்கறையில்லாமலிருக்கிறது. இதுபோல சிந்தித்தால் பல துறைகளிலே உணவு உற்பத்தியைத் தூண்டுவதற்கு அரசாங்கம் எடுக்க வேண்டிய நடவடிக்கைகளே எடுக்காமல் விட்டுவிட்டது.

மிளகாய் இறக்குமதி செய்யப்படுகிறது. பல கோடி ரூபாய் மிளகாய் இறக்குமதியிலே செலவிடப்படுகிறது. ஆனல் இந்த நாட்டிலே, எங்கள் நாட்டுக்குத் தேவையான அளவு மிளகாய் உற்பத்தி செய்யப்படுகிறது. மிளகாய், வெண்காயத்தைப் போல நல்ல சத்துள்ள உணவல்ல. ஆனல் மக்கள் தங்களுடைய நாளாந்த உணவிலே அதைச் சேர்க்கப் பழக்கப்படுத்திக் கொண்டு வந்துவிட்டார்கள். உணவுடன் மிளகாய்ச் சேர்க்கின்ற பழக்கம் தீர்க்க முடியாத ஒரு பழக்கமாக மாறிவிட்டது. அப்படியிருந்தும் அரசாங்கம் மிளகாய் இறக்குமதியை முற்ருகத் தடை செய்யாமல் மிளகாய்—உற்பத்திக்கு இந்த நாட்டிலே ஊக்கம் கொடுக்காமல்—ஐந்து வருடத்தையும் வீணுகக் கழித்து விட்டது. மிளகாய் இறக்குமதியைத் தடை செய்திருந்தால் நாடு முழுவதிலுமுள்ள இளேஞர்கள் இந்த விவசாயத்தில் இறங்கி நாட்டுக்குத் தேவையான மிளகாயை உற்பத்தி செய்ய முனேந்திருப்பார்கள். அதனுல் வேலேயில்லாத் திண்டாத்தின் ஒரு பகுதியையாவது தீர்த்து வைத்திருக்கலாம். இவ்வித உணவு உற்பத்தியைத் தூண்டாமல் வேறு சில செயல்களில் அரசாங்கம் இறங்கியிருக்கிறது.

இறக்குமதியைப் பற்றிச் சொல்லும் பொழுது அரசாங்க தரப்பில் கௌரவ யாழ்ப்பாண பிரதிநிதி (திரு. ஜீ. ஜீ. பொன்னம்பலம்) சில கருத்துக்களேச் சொன்னுர். இறக்குமதி செய்யவிட்ட பொழுது பல தரப்பட்ட பொருட்களே இறக்குமதி செய்து வீதியோரங்களிலே வைத்து விற்ருர்கள். நாட்டுக்குத் தேவையில்லா பொருட்களெல்லாம் இறக்குமதி செய்யப்பட்டன. இது தவிர்க்க முடியாதது என்று நினேத்தார்கள். ஏன் தவிர்க்க முடியாது? அரசாங்கம் அக்கறையோடு இருந்தால் அன்னிய செலாவணியில் ஒவ்வொரு சதமும் எந்தப் பொருளுக்குப் போகிறது என்று தீர்த்துக் கட்டுப்பாடு செய்யலாம். இந்த இறக்குமதிக் கொள்கையை நடத்தும் பொழுது அது இந்த நாட்டின் பொருளாதாரத்தை எந்த வகையில் பாதிக்கிறது என்பதை அவதானித்து அவசியமற்ற பொருட்களின் இறக்குமதியைத் தடை செய்யலாம். தேவையில்லாத பொருட்களேத் தடை செய்வது முக்கியமான கொள்கையாகும். அபிவிருத்தியடையாத நாடுகளிலே இது மிகவும் முக்கியமான விடயமாகும். தெரு ஓரங்களிலே தேவையில்லாத பல பொருட்கள் விற்கப்படுகின்றன. அத்தகைய பொருட்களின் இறக்குமதிக்குப் பதிலாக கைத்தொழில்களே ஊக்குவிக்கக் கூடிய பொருட்களே இறக்குமதி செய்வது நாட்டுக்குப் பலனளிக்கக்கூடியதாகும். ஒரு electric driller கூட நாட்டுக்கும் பயன்படக் கூடியது. ஆதலால், அரசாங்கம் இந்த இறக்குமதிக் கொள்கையைக் கவனிக்கும் பொழுது எந்தச் சூழ்நிலேயில் எந்தப் பொருட்களே இறக்குமதி செய்வது நாட்டுக்கு நன்மையளிக்கக் கூடியது என நினேத்து அவற்றை இறக்குமதி செய்ய அனுமதி கொடுக்க வேண்டும். அளவைப் பார்த்துக் கட்டுப்பாடு செய்யாமல் பொருளேப் பார்த்துக் கட்டுப்பாடு செய்யவேண்டும். எந்தப் பொருட்கள் நாட்டுக்குத் தேவையோ அந்தப் பொருட்களே இறக்குமதி செய்ய அனுமதிக்க வேண்டும். இந்தப் பொருளில் இவ்வளவு கொண்டு வரலாம்; இவ்வளவு கொண்டுவரக் கூடாது என்று சொல்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

லாமல் இந்தப் பொருள் வேண்டும், இந்தப் பொருள் வேண்டாம் என்று திட்டமாகத் தீர்த்து கட்டுப்பாடு செய்வதுதான் இந்தத் திட்டத்துக்கு உகந்த கொள்கை; பொருளாதாரத்தையும் விவசாயத்தையும் ஊக்கக்கூடிய கொள்கை.

கௌரவ உப சபாநாயகரவர்களே, கௌரவ விஞ்ஞான ஆய்வு, வீடமைப்பு அமைச்சர் (கௌரவ எம். டீ. எச். ஜயவர்தன) இந்த வரவு செலவுத் திட்ட விவாதத்தில் பேசும் பொழுது சில கருத்துக்களைச் சொன்னார். அதில் ஒன்று விஞ்ஞான நிபுணர்களை இந்த நாட்டில் உற்பத்தியாக்கி இந்த நாட்டின் பொருளாதாரத்தைப் பல துறைகளிலும் வளர்க்க முயற்சி செய்வதாகும் என்பது. இதில் விசித்திரம் என்னவென்றால், அவர் கஷ்டப்பட்டு எத்தனை விஞ்ஞான நிபுணர்களை உற்பத்தி செய்தார் என்பது தெரியாதிருப்பது தான். ஆனால், அவ்விதம் உற்பத்தி செய்யப் பட்டவர்களை அரசாங்கம் பயன்படுத்தவில்லை. இவர் எத்தனை பேரை உருவாக்கினாலும் அரசாங்கம்—முக்கியமாக கல்வி அமைச்சர்—அவர்களை உபயோகிப்பதில்லை. இந்த நாட்டிலுள்ள பள்ளிக்கூடங்களுக்கு, மற்றைய நிலையங்களுக்கு விஞ்ஞான நிபுணர்கள், பட்டதாரிகள் தேவைப்பட்டாலும், நாட்டிலே உருவாக்கப்படும் அத்தகையோர்களுக்கு வாய்ப்புக் கொடுக்கப்படுவது இல்லை. எங்கள் பள்ளிக்கூடங்களில் விஞ்ஞானம் அல்லாத மற்றப் பாடங்களை—கலைப்பாடங்களை—எல்லாம் கற்பித்து எங்களுக்கும் நாட்டுக்கும் நன்மை தரக் கூடாத கல்வித் திட்டத்தில்தான் நாம் இயங்கிக் கொண்டு போகிறோம். அவர் செய்யும் நன்மை ஒரு பலனையும் அளிக்காதவாறு கௌரவ கல்வி அமைச்சர் செயல்புரிகிறார். எத்தனையோ ஆயிரம் பட்டதாரிகள் நன்றாக விஞ்ஞானத்தைக் கற்றிருக்கின்றார்கள். அவர்கள் இந்த நாட்டின் கல்வித்துறையிலும் மற்றும் துறைகளிலும் சேவைசெய்யக்கூடியவர்களாக இருக்கின்றார்கள். இந்த அரசாங்கம் இந்த நாட்டின் பட்டதாரிகளையும் நிபுணர்களையும் கல்வித் துறையிலும் மற்றும் துறைகளிலும் உபயோகிக்காமல் இருப்பது நாட்டின் முன்னேற்றத்துக்கு ஓர் இடைஞ்சலாக இருக்கின்றது. ஏன் பல துறைகளில் விஞ்ஞானப் பட்டதாரிகளை உபயோகிக்க முடியாது, ஏன் இந்த அரசாங்கம் அவர்களை நாட்டின் வளர்ச்சிக்கு உபயோகிக்கக்கூடிய திட்டங்களை வகுக்கவில்லையென்று கேட்க விரும்புகிறேன்.

ஒரு பக்கத்திலே விஞ்ஞான ஆசிரியர்களையும் பட்டதாரிகளையும் நிபுணர்களையும் உற்பத்தி செய்து, மறுபக்கத்திலே அவர்களை நாட்டின் அபிவிருத்திக்கு உபயோகிக்கக்கூடிய திட்டங்களை வகுக்காமல் இருப்பது மிகவும் வருந்தத்தக்க விஷயமாகும். கல்வி அமைச்சருடைய குறையை மேலும் எடுத்துச் சொல்லப் போனால், இந்த நாட்டின் வளர்ச்சிக்கு அவர் தடையாக இருக்கிறார், நாட்டின் பொருளாதார, கைத்தொழில் வளர்ச்சிக்கு அவருடைய நடவடிக்கைகள் தடையாக இருக்கின்றன என்று சொல்லவேண்டும். இன்னும் இந்த நாட்டிலே இருக்கின்ற ஓர் அந்நியோன்யத் தன்மையைச் சீர்குலைக்கக்கூடியதான நடவடிக்கையிலே அவர் அண்மையிலே இறங்கியிருக்கிறார் என்று சொல்லவேண்டும்.

யாழ்ப்பாணத்திலே இந்துக்களுக்கும் பௌத்தர்களுக்குமிடையில் பிளவை உண்டு பண்ணக்கூடியதாக, கலவரத்தை உண்டு பண்ணக்கூடியதாக, பலாத்காரத்தை உண்டு பண்ணக்கூடியதாக தமிழ் சைவ பாடசாலைகளைச் சிங்கள பௌத்த பாடசாலைகளாக ஏற்படுத்திக் கொடுக்க முயற்சி செய்கிறார். தமிழ்ப் பிள்ளைகளுக்குச் சிங்கள போதனா மொழியில் பாடம் கற்பிக்கத் திட்டமிடுகிறார். சைவர்களைப் பௌத்தர்களாக மாற்றத் திட்டமிடுகிறார். இவற்றையெல்லாம் அரசாங்கப் பள்ளிக்கூடங்களின் மூலம் செய்ய முற்படுகிறார். அதுமட்டுமல்ல. சாதி காரணமாகப் பின்தங்கிய மக்களை அந்தந்தச் சாதியிலே வைத்து, அவர்களுக்கு வேறு பள்ளிக்கூடங்கள் கொடுத்து சாதி வேற்றுமையை நிரந்தரம் செய்ய முயற்சி செய்கிறார். நாம் இந்தச் சபையிலே, சாதி வேற்றுமைகள் இருக்கக் கூடாது, மக்களிடையே சாதி ஏற்றத்தாழ்வுகள் இருக்கக் கூடாதென்ற சட்டத்தை இயற்றச் செய்து, அந்தச் சட்டம் இயங்கிக் கொண்டுவரும் நேரத்திலே, இந்த உயர்ந்த கொள்கைக்கும் சட்டத்துக்கும் மாறாக பள்ளிக்கூடங்களைச் சாதி ரீதியிலே பிரித்து, சாதிக் கலவரங்களை உருவாக்கக் கல்வி அமைச்சர் முயற்சிக்கிறார்.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

கௌரவ உப சபாநாயகர் அவர்களே, நான் நீண்டநேரம் பேச விரும்பவில்லை. இந்தச் சில கருத்துக்களை இங்கு எடுத்துக்கூற எனக்குச் சந்தர்ப்பம் தந்ததற்கு உங்களுக்கு நன்றி. கடைசியாக இந்த வரவுசெலவுத் திட்டத்துக்குப் புறம்பாக இன்னும் ஒருசில கருத்துக்களைச் சொல்லி என்னுடைய பேச்சை முடித்துக்கொள்ள விரும்புகிறேன்.

**නියෝජ්‍ය කථානායකතුමා**
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)
இன்னும் பத்து நிமிடங்கள் பேசலாம்.

**කතිරවේලුපිල්ලෙ මයා.**
(திரு. கதிரவேலுப்பிள்ளை)
(Mr. Kathiravelupillai)
கௌரவ நிவித்திகலைப் பிரதிநிதி (திரு. டீ. எப். ஹெற்றியாரச்சி) இந்தச் சபையிலே பேசும்பொழுது ஓர் எச்சரிக்கை போலச் சொன்னார், தமிழரசுக் கட்சி இந்த நாட்டிலே பிரசாரம் மூலம் எடுத்துச் சொல்லும் கருத்துக்கள் அபாயகரமானவை என்று. சிங்கள மக்கள் அதனை நீண்ட காலம் பொறுத்திருக்க மாட்டார்கள் என்று சொன்னார். இப்படிச் சொல்வதை நாம் பல தடவை கேட்டிருக்கிறோம். இப்படிச் சொல்வதாலே நாம் பயப்படப்போவதில்லை. பயந்ததுமில்லை. குண்டு வீச்சுக்கும் இராணுவத் தாக்குதலுக்கும் பயப்படாத நாம் இவருடைய கருத்துக்குப் பயப்படப்போவதில்லை. சிறிது காலத்திலே சிங்கள மக்கள் யார் தம்மை ஏமாற்றுகிறார்கள் என்பதை உணரத்தான் போகின்றார்கள்.

இந்த நாட்டிலே ஒற்றுமையைக் குலைக்க நாம் விரும்பவில்லை. நிவித்திகலைப் பிரதிநிதி அவர்களுக்கு இணைப்பு ஆட்சிக்கும் ஒற்றுமைக்கும் வித்தியாசம் இருக்கலாம். உலகத்திலே இணைப்பு ஆட்சியின் கீழ், சமஷ்டி ஆட்சியின் கீழ் நாடுகள் ஒற்றுமையாக இயங்குகின்றன என்பது அவருக்குத் தெரியாமல் இருக்கின்றது போலும்! ஆனால் அவர்கள் தங்களுடைய அறியாமையை மக்கள்மேற் சுமத்தி அவர்களைப் பிழையான வழியில் பல காலம் தூண்ட முடியாது. மக்கள் ஒரு நாளைக்கு இவர்களுடைய பிழையான பிரசாரங்களைப்பற்றி உணர்ந்து கொள்வார்கள். பிழையான கருத்துக்களைச் சொல்லித் தங்களை எப்படி இவர்கள் பிழையான வழியில் நடத்திச் சென்றார்கள் என்பதை மக்கள் உணரும் நாள் ஒரு நாளைக்கு வரும். சமஷ்டி அரசியற் கொள்கை நாட்டை பிரிவினை செய்யும் ஒரு கொள்கை என்று இன்று சிலர் பிரசாரம் செய்து வருவது வருந்தக் தக்கது. உண்மையில் இந்தக் கொள்கை தமிழரசுக் கட்சியால்தான் கண்டுபிடிக்கப்பட்டதல்ல. டொனமூர்க் கமிஷன் காலத்திலேயே கண்டிச் சிங்கள மக்கள் இந்த நாட்டிற்குச் சமஷ்டி அரசியல் அமைப்பு உகந்தது என்று எடுத்துச் சொல்லி இருக்கிறார்கள். காலஞ்சென்ற பிரதமர் திரு. எஸ். டபிள்யூ. ஆர். டி. பண்டாரநாயக்க அவர்கள்கூட சுமார் இருபத்தைந்து ஆண்டுகளுக்கு முன்பே இந்த நாட்டிற்குச் சமஷ்டி அரசியல் அமைப்பே உகந்தது என்ற கருத்தைக் கொண்டிருந்தார். சோல்பரிக் கொமிஷன் இந்த நாட்டிற்கு வந்தபோதுகூட கண்டியச் சிங்கள மக்கள் இந்தக் கருத்தை ஆதரித்து அக்கமிஷனுக்கு மனுக்கொடுத்திருக்கிறார்கள். எனவே சமஷ்டி ஆட்சிக் கொள்கை எங்கள் கட்சியால்தால் முதன் முதலாகக் கண்டுபிடிக்கப்பட்டதல்ல. ஆதலால் நாங்கள் நாட்டைப் பிரிக்கிறோம் என்று கூறி சிங்கள மக்களைப் பிழையான ஒரு இயக்கத்தில் ஈடுபடுத்த வேண்டாம் என்று நான் நிவித்திகலைப் பிரதிநிதிபோன்றவர்களைக் கேட்டுக் கொள்ளுகிறேன். முறைமாறி சிறிது நேரம் தாமதித்தாலும்கூட எனக்கு இங்கு பேச அனுமதி தந்ததற்கு உங்களுக்கு நன்றி தெரிவித்து எனது உரையை முடித்துக் கொள்ளுகிறேன்.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 5.51

**කේ. වයි. එම්. විජේරත්න බණ්ඩා මයා.**
*(திரு. கே. வை. எம். விஜேரத்ன பண்டா)*
(Mr. K. Y. M. Wijeratne Banda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම ආණ්ඩුවේ පස් වන අයවැය ලේඛන විවාදය පවතින මේ අවස්ථාවේදී සංක්ෂේපයෙන් කරුණු ස්වල්පයක් ඉදිරිපත් කරන්නට මාත් බලාපොරොත්තු වෙනවා. කෘෂිකර්මයේ මාර්ගයෙන් මේ රට සංවර්ධනය කරන්නට මේ ආණ්ඩුව දැඩි උනන්දුවක් ගන්නා බව කියනවා. යම්කිසි ප්‍රමාණයකට හෝ කෘෂිකර්මය දියුණු කරන්නට හැකි වෙනවා නම් අප කවුරුනුත් සතුටු වෙනවා. ගොවිතැන දියුණු කිරීමට ක්‍රියා කරන ගොවි ජනතාවට කොතරම් දුරට මේ ආණ්ඩුව අත දී තිබේදැයි මේ අවස්ථාවේදී සලකා බලන්නට ඕනෑ.

ඌව ප්‍රදේශයේ ගොවිතැන දියුණු කිරීම සඳහා එහි ගොවි ජනතාවට තේ වතුවලින් විඳින්නට සිදු වී තිබෙන අවහිරයෙන් ඔවුන් මුදවා දෙන ලෙස ගරු ඉඩම් ඇමතිතුමාගෙන් අප ඉල්ලීමක් කළා. ගරු ඉඩම් ඇමතිතුමාත්, එතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමාත් 1969 ජනවාරි මස 29 වැනිදා බදුල්ල කච්චේරියට ගිය අවස්ථාවේදී ප්‍රදේශයේ මන්ත්‍රීවරුන් වන අප පෙන්වා දුන්නේ ගොවිතැන් කරන ජනතාවට තේ වතුවලින් සිදු වී තිබෙන අවහිරයයි. තේ වතුකාරයන් සශ්‍රීක ජල උල්පත් සම්පූර්ණයෙන්ම වසා දමා තිබෙන නිසා ගොවිතැන් කටයුතුවල යෙදෙන්නන්ට විශාල කරදරයක් වී තිබෙන හෙයින් ඒ සම්බන්ධයෙන් පියවරක් ගන්නා ලෙස අප ගරු ඉඩම් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටියා. ඌව ප්‍රදේශයේ තේ වතුවලින් ගලා බස්නා ජලය ඒ වතුකාරයන් විසින් නොමනා අන්දමට පාවිච්චි කරනු ලබන නිසා, ඒ ජල උල්පත් ඒ වතුකාරයන්ගේ තේ වගාව සඳහා යොදා ගෙන තිබෙන නිසා, ගොවියන්ට සිදු වී තිබෙන හානිය නැති කරලීම පිණිස වහාම පනත් කෙටුම්පතක් මෙම ගරු සභාවට ඉදිරිපත් කොට සම්මත කර ගන්නා බවක් එදා ගරු ඉඩම් ඇමතිතුමා ප්‍රකාශ කළා.

මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමා හෝ පාර්ලිමේන්තු ලේකම්තුමා මෙම ගරු සභාවේ නොසිටීම ගැන මා කනගාටු වෙනවා. ගරු ඇමතිතුමා එදා ඒ පොරොන්දුව දී ආවා. මාස ගණනක් ගත වුණා. ඒ සම්බන්ධයෙන් කිසිවක් සිදු වන බවක් නොපෙණුණු නිසා මෙම ගරු සභාවේදී ප්‍රශ්නයක් ඇසුවා. අසුවල් දවසේ දුන් පොරොන්දුව අනුව පනතක් සකස් කර තිබෙනවාද, පනතක් සකස් කර නැත් නම් ඊට හේතු මොනවාදැයි ඇසූ ප්‍රශ්නයට පිළිතුර වූයේ ළඟදීම ඒ පනත ගෙන එන්නට සූදානම් කරගෙන යන බවයි. මේ පොරොන්දුවත් මේ ආණ්ඩුව 1965 දී දෙන ලද පොරොන්දුවල තත්ත්වයට වැටේ දැයි දන්නේ නැහැ. ඌව ප්‍රදේශයේ වතු අධිකාරීන්ගේ කීම්වලට යට වීම නිසා අහිංසක ගොවියන් පාවිච්චි කරන වතුර ටික ඔවුන්ට නිරවුල්ව ලබා දීමට මෙතෙක් කල් ක්‍රියා කර නැහැ. ඌව ප්‍රදේශයේ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායක වශයෙන් පත් කර සිටින්නේ දෙමෝදර වතු සමාගමේ සුපිරින්ටෙන්ඩන්ට් මහත්මයා බව මට ආරංචියි. එදා එතුමාත් ඒ සාකච්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ණාවට අවුත් සිටියා. ඒ වතුර ටික ගත්තොත් ද්‍රවිඩ කම්කරුවන්ට වතුර මදි වෙතැයිද, වතු අධිකාරීන්ගේ එළවළු ගොවිතැනට හානියක් වෙතැයිද, ඒ නිසා ගොවියන්ට පාඩුවක් සිදු වුණත් ඒ පනත ඉදිරිපත් කරන්නට එපා යයිද ඒ මහත්මයා කියන්නට ඇති. ඒ පොරොන්දුව මෙතෙක් ඉටු නොකර ඇත්තේ ඒ නිසා වන්නට පුළුවනි. විශේෂයෙන් කන්ද උඩරට අපේ ප්‍රදේශයේ කන්න දෙකක් වී ගොවිතැන් කරන්නට පුළුවනි. එහෙත් වතුර හිඟකම නිසා ගොවියන් බලවත් අමාරුවකට වැටී සිටිනවා. ජලය ලබාගැනීමට ඇති අමාරුකම නිසා ඌව ප්‍රදේශයේ ගොවීන්, ගොවිතැන් කිරීමට මැලි වෙනවා. මේ දවස්වල ඌව ප්‍රදේශයට ගියොත් ඒ ගොවීන් ජීවත්වන්නේ ඉතාමත්ම අමාරු තත්ත්වයෙන් බව පෙනී යනවා ඇති. ඒ අයට දවස් අටකට එක් වරයි වතුර මුරයක් බැඳ ගන්නට පුළුවන් වන්නේ. මාස ගණනකින් වර්ෂාවක් ලැබෙන්නේ නැහැ. පසුගිය දොළොස්වෙනිදා සැහෙන වැස්සක් තිබුණා. මේ අන්දමට වතුර අහේනිය ඇති වන්නට මූලික හේතුව වතු ආශ්‍රිතව ගලා එන ජලය, දිගටම ගලා ගෙන යාමට ඉඩ දෙන්නේ නැතුව ඒවායේ වැව්ලි දමා තිබීමයි. එපමණක් නොවෙයි, ස්වභාවික උල්පත් ගොඩ කර දමා නොයෙකුත් අන්දමේ වැව්ලි වර්ග දමා තිබීම නිසාත් අහිංසක ගොවියන්ට අවශ්‍ය ජලය නොලැබී ගොස් තිබෙනවා.

මෙයට අවුරුදු සිය ගණනකට පෙර ඒ ප්‍රදේශයේ ජීවත්වුණු ගම්වාසීන් කුඹුරු අස්වැද්දීම කළේ නිරායාසයෙන් ගලා ආ මේ ජලය ලබාගෙනයි. එදා හොඳට වී අටුකොටු පුරවා ගෙන සන්තෝෂයෙන් ඒ උදවිය ජීවත්වුණා. අද ඒ තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස් වී ගොස් තිබෙනවා, වතු අධිකාරීන් ගෙන යන වැඩ පිළිවෙළ නිසා. ඒ උදවිය කොයිතරම් කනගාටුදායක තත්ත්වයකට පත් වී තිබෙනවාද කියනවා නම්, බීමට පවා වතුර ටිකක් ලබාගැනීමට ඇතැම් වතු අධිකාරීන් ඉඩ දෙන්නේ නැහැ. මම එක් නිදර්ශනයක් පෙන්වා දෙන්නම්. 1957 සිට අද දක්වාත් බැරි වුණා සානියා වත්තේ සිට කන්දෙගෙදර කියන නගරයට වතුර ටිකක් ලබාගන්න. වතු අධිකාරීන්ගෙන් ඒ ගැන ප්‍රශ්න කළාම කියන්නෙ මේ වතු අපේ, වතුරත් අපේ; ඒ නිසා අපි වතුර දෙන්නෙ නැහැයි කියායි. මා මෙපමණ කලක් සිතාගෙන සිටියේ අපේ ඉඩම්වල බලය තිබෙන්නේ ඉඩම් ඇමතිතුමාටය කියායි. නමුත් වතු අධිකාරීන් අතරට ගියාම, වතු සමාගම් අතරට ගියාම ඔවුන් තමයි මේ රටේ ඇති ඉඩම්වල බලධාරීන් හැටියට ක්‍රියා කරන්නෙ. වතු අධිකාරීන් අතරට ගියාම ඉඩම් ඇමතිතුමාටත් කිසිම බලයක් නැහැ. ඒ වාගේ තත්ත්වයකුයි අද පවතින්නේ. ගොවිතැන් දියුණු කිරීමට වෙහෙස ගන්නා මේ වකවානුවේදී, උද්ඝෝෂණයක් පවතින මේ අවදියේදී ගොවිතැන් කිරීමට පුල පුලා සිටින, ගොවිතැනින් ජීවිකාව කර ගෙන යන මේ අයට සලකන්නේ මේ විධියටද කියා ප්‍රශ්න කරන්න කැමතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගොවියාගේ ජීවන තත්ත්වය පහත වැටී නැත, දැන් අගහිඟකමක් නැත, වී බුසලකට රුපියල් දෙකක් වැඩිපුර ලැබෙනවාය කියා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් සෑම අවස්ථාවකදීම ප්‍රකාශ කරනවා. අප මේ කාරණය ගැන ටිකක් විමසිලිමත්ව බලන්න ඕනෑ. දැන් කුලියට ගොවිතැන් කරන කෙනෙකුගේ පඩිය කොපමණ වැඩි වී තිබෙනවාද, පෝර මිල කොපමණ වැඩි වී තිබෙනවාද, ආහාර ද්‍රව්‍ය මිල කොපමණ වැඩි වී තිබෙනවාද කියා ඒ අතරම සොයා බලන්න ඕනෑ. ගොවිතැන් කරන උදවිය හුලං බිබී නොවෙයි වැඩ කරන්නෙ. ඒ අයට හොඳට බඩකට පුරා කන්න ඕනෑ. ආහාර වේලක් සපයා ගන්න කොයි තරම් වියදමක් යනවාද කියා තක්සේරු කර බලන්න ඕනෑ. කොළඹ ප්‍රදේශයේ පොල් මිල ගණන් ගැන මා දන්නෙ නැහැ, නමුත් අපේ ප්‍රදේශයේ ශත හතළිහකට අඩුවෙන් පොල් ගෙඩියක් ලබාගන්න බැහැ. පොල් තෙල් බෝතලයක් එකයි පණහකට අඩුවෙන් ගන්න බැහැ. හපා කෙල ගසන බුලත් කොළයක් ගන්නට ශත එකක් හෝ එකහමාරක් නැතුව පුළුවන්කමක් නැහැ. අන්න ඒ තරමට ජීවන වියදම ඉහළ නැග තිබෙනවා. වී බුසලකට රුපියල් දෙකක් වැඩි පුර ලැබුණාය කියා මෙයින් දිව්‍ය ලෝකයට ගියාය කියා සිතන්නට පුළුවන් තත්ත්වයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජේරත්න බණ්ඩා මයා.]

නැහැ. ගොවියා විඳින දුක දන්නේ ගොවියා පිළිබඳව සැහෙන අවබෝධයක් ඇති උදවිය පමණයි. ගොවිතැන් කරන උදවියට උදයට, දවාලට මෙන්ම හැන්දෑ වටද සංග්‍රහ කරන්න ඕනෑ. ඒ අන්දමට සංග්‍රහ කරමිනුයි ගොවිතැනට යොදවා ගන්නෙ. වතුවල තේ කඩන අයට කුඩෙ දී පිටත් කර යවන්නා වාගේ, මාසය අන්තිමට පඩිය දෙනවා වාගේ නොවෙයි ගොවිතැන් වැඩ කිරීම. එම නිසා ගොවි ජනතාවට අද පෙරට වඩා විශාල අමාරු තත්ත්වයකට මුහුණ දෙන්න සිදු වී තිබෙනවා. වැඩි වී තිබෙන මෙම ජීවන අංකය පහත හෙළීමට රජය ක්‍රියා නොකළොත් අනාගතයේදී අපේ ගොවීන්ට මෙයට වඩා අමාරු අන්දමින් ජීවත්වන්නට සිදුවන බව මතක් කර දෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයේ සේවකයනට පඩි වැඩි කිරීම සම්බන්ධයෙන් දීර්ඝ ලෙස මේ ගරු සභාවේදී සාකච්ඡා වුණා. ඇත්තවශයෙන්ම අප ඉතාමත්ම සන්තෝෂ වෙනවා රජයේ සේවකයන්ගේ වැටුප් වැඩි කිරීම ගැන. පෞද්ගලික අංශයේ වැඩ කරන සාමාන්‍ය ජනතාවගේ තත්ත්වය ගැනත් ඒ සමගම අප කල්පනා කර බලන්නට ඕනෑ. ඒ උදවියට මේ අය වැය ලේඛනයෙන් ශතයකින්වත් සහනයක් ලැබෙනවද? රජයේ සේවකයා සම්බන්ධයෙන් බැලුවත් මේ පැත්තෙන් ඔහුගේ සාක්කුවට ගණනක් දමන අතරම අනික් පැත්තෙන් සිගරට් මිල වැඩි කිරීමෙන් ඔහුගෙන් ඒ මුදල උදුරා ගන්නවා. ඒ අනුව බලන විට මේ අය වැය ලේඛනයෙන් සාමාන්‍ය මනුෂ්‍යයාට කිසිම සහනයක් ලැබී තිබෙන බවක් මට නම් පෙනෙන්නෙ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෝපායිහි ගරු මන්ත්‍රීතුමාගේ (එස්. කදිරවේලු පිල්ලෙයි මයා.) කථාව මා අසා ගෙන සිටියා. රතු ලූනු වවන අයට ඒ රතු ලූනු සඳහා ලැබෙන මිල ඉතා අඩු නිසා දැන් ඔවුන් රතු ලූනු වවන්නේ නැත, ඒ නිසා වැඩි කාලයක් යන්නට පෙර නැවත පිටරටින් රතු ලූනු ගෙන්වන්නට සිදු වෙනවාය කියා ඒ මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. වී ගොවිතැනත් ඔය තත්ත්වයට වැටෙන්නට වැඩි කාලයක් යන්නෙ නැති බව මා ප්‍රකාශ කරන්ට සතුටුයි. අක්කරයකට වී බුසල් 250, 300, 400 ලැබෙනවාය කියා මේ රජය කිව්වත්, ගොවියාට ඔටුණු පැළඳුවත්, අපේ ප්‍රදේශයේ අක්කරයකට වී බුසල් 60 කට වඩා ලබා ගන්නට බැහැ. මා දන්න හැටියට අක්කර දෙකක් වැඩ කරන සාමාන්‍ය ගොවියෙක් නැහැ. [බාධා කිරීමක්] බොරුවක් නොවෙයි, මා කියන්නෙ ඇත්තක්. මා දළ වශයෙන් ගණන් හදා බැලුවා. එසේ ගණන් හදා බැලුවම මට පෙනුණා, වී බුසල රුපියල් 14 බැගින් වික්කොත් සාමාන්‍ය ගොවියකුට මාසයකට ලැබෙන ආදායම රුපියල් 40ක් පමණ වන බව. මාසයකට රුපියල් 40ක ආදායමක් ලැබෙන කෙනෙක් පවුලක් නඩත්තු කරන්නේ මොන අංකරයෙන්ද? තත්ත්වය මේ අන්දමට තිබේද්දී රට ස්වයංපෝෂිත වෙලා තිබෙනවාය, ගොවියාට ලැබෙන සල්ලිවලට කරන්නට දෙයක් නැත කියා තමුන්නාන්සේලා කියනවා නම් ඊට වඩා ලොකු විහිළුවක් තවත් නැහැ.

ගරු මුදල් ඇමතිතුමාගේ අය වැය කථාවේදී එතුමා සඳහන් කළා, අය වැය හිඟය පියවා ගැනීම සඳහා සංස්ථාවලින් ලැබෙන ලාභයෙන් රුපියල් ලක්ෂ 300ක් ලබා ගන්නට බලාපොරොත්තු වන බව. මේක පුදුම කථාවක්. විශාල ආදායමක් ලබා ගන්නට පුළුවන්, දිනපතා මහජනයා විශාල වශයෙන් ගමන් කරන ලංගමය ගැන අපි ටිකක් කල්පනා කර බලමු. ලංගමයට ලබා ගත් තෙල් සඳහා ගෙවිය යුතු මුදල ගෙවා ගන්නට බැරිව ලංගමය පසුතැවිලි වන බව ඊයේ පෙරේද පත්‍රවල දකින්නට ලැබුණා. බැංකුවෙන් ණයට ලබා ගත් ලක්ෂ 189ත් ඉවර වෙලා සේවකයන්ට පඩි ගෙවා ගන්නට බැරි වී තිබෙනවලු. රජයේ අයවැය පරතරය පියවා ගැනීම සඳහා මෙවැනි සංස්ථාවකින් අප ලාභයක් බලාපොරොත්තු වන්නේ කෙසේද කියා මා අහන්නට කැමතියි. ඇත්ත වශයෙන්ම ලංගමයේ තත්ත්වය ගැන අප කණගාටු වෙනවා. 1964 වන විට ලංගමයෙන් සැහෙන ලාභයක් ලැබුණු බව අප ආඩම්බරයෙන් කියන්නට ඕනෑ. එහෙත් අද ලංගමය විනාශ භාවයට පත් වී තිබෙනවා. අද ලංගමයේ බස්වල ගමන් කරන මගිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කුට වෙලාවට ගමනක් යන්නට පුළුවන් කමක් නැහැ. ඒ නිසා රැකීරක්ෂාවලට යන උදවියට විශාල හිරිහැරවලට මුහුණ පාන්නට සිදු වන බව කණගාටුවෙන් කියන්නට ඕනෑ. පසුගිය දිනවල ගරු ඇමතිතුමාත් ගොස් ඩිපෝ කීපයක සිටි බව අපට ආරංචි වුණා. එවැනි තත්ත්වයක පවතින සංස්ථාවලින් ලක්ෂ 300ක ලාභයක් බලාපොරොත්තු වන්නේ කෙසේද? වානේ කර්මාන්ත සංස්ථාවේ උදළු 2,47,000ක් විකිණෙන්නේ නැතිව තිබෙන බව ඊයේ පෙරේදා අපට අසන්නට ලැබුණා. ඉදිරියට සේවකයින්ගේ පඩිනඩි වත් ගෙවා ගන්නට වානේ සංසථාවට බැරි වේය කියා පත්තරයේ විස්තරයක් පළ කර තිබෙනවා මා දැක්කා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උදලු ගැන කියන විට මට කරුණක් මතක් වුණා. ඒ ගැන අපි ටිකක් කල්පනා කර බලන්නට ඕනෑ. උදැල්ල වටිනා ආයුධයක්. එහෙනම් ඒවා විකුණා ගන්නට නොහැකි වී ඇත්තේ ඇයි කියා බලන්නට ඕනෑ. ලංකාවේ උදැල්ලෙන් වැඩ කරන සෑම කෙනෙක්ම කිඹුලා උදැල්ල කීවාම එයට විශේෂ ඇල්මක් ප්‍රිය බවක් දක්වනවා. අපේ සංස්ථාවට බැරි වුණා මේ රටේ ගොවියාටත් කම්කරුවාටත් අවශ්‍ය කරන ආයුධය ඒ විධියට හදන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
තමුන්නාන්සේලාගේ කාලෙනෙ හැදුවෙ.

**විජේරත්න බණ්ඩා මයා.**
*(திரு. விஜேரத்ன பண்டா)*
(Mr. Wijeratne Banda)
කොයි කාලයේ හැදුවත් මගේ තර්කය ඒක නොවෙයි. මා කියන්නේ ඒ සංස්ථාවට උපදෙස් දෙන අයගේ දුර්වලකමයි. මේ රටේ උදලු පාවිච්චි කර ගොවිතැන් කරන කෙනෙකුගෙන් ඇසුවා නම් කියාවි කොහොම උදැල්ලක්ද මේ රටට ඕනෑ කරන්නේ කියා. කිඹුලා උදැල්ලේ පන්නයේට උදැල්ලක් හැදුවා නම් මේ රටට යෝග්‍යයි. එහෙත් අපේ මේ සංස්ථාව හැදූ උදැල්ලට ගොවියාවත් කම්කරුවාවත් කැමති නැහැ. උදලු නොවිකිණෙන්නට හේතුව ඕකයි. උදලු ඕනෑ කිය කියා ගොවීන් කෑගහනවා. හැබැයි ලෝහ භාණ්ඩ සංස්ථාවේ උදැල්ල නම් පාවිච්චි කරන්නේ නැහැ. වැඩ කරන්නට බැරි ආයුධ අරගෙන මොකටද? එවැනි සංස්ථාවලින් ද ගරු මුදල් ඇමතිතුමා ලක්ෂ ගණනක ලාභයක් ලබාගෙන අයවැය ලේඛනයේ හිඟය පිය වන්නට යන්නේ? එවැනි බලාපොරොත්තුවක් තිබෙනවා නම් ඒ ගැන පුදුම වෙනවා මිසක් කියන්නට දෙයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපනය ගැනත් මට මතක් වුණා. මේ රටේ අධ්‍යාපන ක්‍රමයේ වරද නිසා රැකීරක්ෂා ප්‍රශ්නයකට මුහුණ දෙන්නට සිදු වුණාය කියා හඟුරන්කෙත ගරු මන්ත්‍රීතුමා (ජෝර්ජ් අබේගුණසේකර මයා.) ප්‍රකාශ කළා. අද අධ්‍යාපන තත්ත්වය ගැන බලන විට 1948 ට කලින් තිබුණු අධිරාජ්‍යවාදී යුගය ගැන මට මතක් වුණා. මට මතකයි එතුමා තම කථාවේදී කිව්වා අධිරාජ්‍යවාදීන්ගේ කාලයේදීත් ස්වභාෂා අධ්‍යාපනය නොමිලේ ලැබුණාය, මුදල් ගෙවන්නට සිදු වුණේ ඉංග්‍රීසි ඉගෙන ගැනීමටය කියා. දැන් නැවතත් එදා පැවැති ඒ තත්ත්වයටම අපේ අධ්‍යාපනය පත් වී තිබෙනවා. අද අපේ ගම්බද ළමයින්ට ඉංග්‍රීසි අධ්‍යාපනයක් ලබා ගන්නට—මුදල් නොදුන්නත්—ඉඩක් නැහැ. සියවස සියවස කිය කියා කෑ ගහනවා. මීට කලින් මෙච්චර ලක්ෂණට අධ්‍යාපනය කළෙත් නැහැ, කරන්නෙත් නැහැ, කියා කෑ ගහනවා. එහෙත් දැන් ගම්බද ළමයෙකුට ඉංග්‍රීසි අධ්‍යාපනයක් ලබා ගන්නට අවස්ථාවක් නැති බව මා මේ අවස්ථාවේදී කියනවා. මහා විද්‍යාල කියා වර්ගයක් තිබෙනවා. මගේ ආසනයේ තිබෙන්නේ මහා විද්‍යාල 4 යි. අනික් පාසැල් නම් පනස් ගණනක් තිබෙනවා. ඒ මහා විද්‍යාලයකට යන්නත් හැතැප්ම දහයක් පහළොහක් පයින් යන්නට ඕනෑ. සමහර පාසැල්වල ඉංග්‍රීසි උගන්වන්න ගුරුවරු නැහැ. ඉංග්‍රීසි අනිවාර්යය කියා තමුන්නාන්සේලාගේ නීතිරීතිවල තිබුණාට පාසැල්වල ඉංග්‍රීසි උගන්වන්න ගුරුවරුන් නැත්නම් ගම්බද ශිෂ්‍යයින් ඉංග්‍රීසි ඉගෙන ගන්නේ කොහොමද? හැබැයි නගරබද ශිෂ්‍යයින්ට නම් මහා විද්‍යාලවලට ගොස් ඉංග්‍රීසි අධ්‍යාපනයක් ලබා ගන්නට පුළුවන්. එහෙත් මහා විද්‍යාලවල සිටින ගම්බද ළමයින්ට ඉංග්‍රීසි අධ්‍යාපනයක් ලබා ගන්නට ක්‍රමයක් නැහැ. හඟුරන්කෙත ගරු මන්ත්‍රී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජේරත්න බණ්ඩා මයා.]

තුමා කිවාක් මෙන් අද අධ්‍යාපනය 1948ට කලින් තිබුණු තත්ත්වයටම වැටී තිබෙනවා. පන්ති භේදයත් ඇති වී තිබෙනවා. අධ්‍යාපනය ගැන කියන්නට තිබෙන්නේ එයයි.

නිවිතිගල ගරු මන්ත්‍රීතුමාගේ (ඩී. එෆ්. හෙට්ටිආරච්චි මයා.) කථාවට පිළිතුරු වශයෙන් කෝපායිහි ගරු මන්ත්‍රීතුමා (එස්. කදිරවේලුපිල්ලේ මයා.) කිව්වා ඔය විධියට ජාතික සමගිය ඇති කර ගන්නට බැරිය කියා. එතුමන්ලා දැන් ජාතික සමගියෙන් අයින් වී සිටිනවාද කියා මට පුදුම හිතුණා. පසුගිය දවස්වල කනක් ඇහෙන්න නැහැ 65 පටන් ගත් ජාතික සමගිය ජාතික සමගිය කිය කියා රට දෙවනත් කළා. දැන් ඒ ජාතික සමගියෙන් අයින් වී කියනවා දෙගොල්ලම එකතු නොවී ජාතික සමගියක් ඇති කරන්නට බැරිය කියා. අර පැත්තේ මාස දෙකක් ඉඳගෙන එකක් කියනවා; මේ පැත්තට ඇවිත් මාසයකින් තව එකක් කියනවා. ඔය විධියේ දේවලින් අපේ ප්‍රශ්න නිරාකරණය කර ගන්නට පුළුවන් වේවිය කියා අපට සැකයි.

මේ රජය ප්‍රජාතන්ත්‍රවාදය ගැන බොහොම ඉහළින් කථා කරනවා. කොයි තරම් හොඳට ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කරනවාද කීවොත්, 1965 මහා මැතිවරණ කාලයේදී දේශපාලන කටයුතුවල නිරත වුණාය කියා ගුරුවරුන් හා රජයේ සේවකයන් බොහෝ දෙනෙක් දුෂ්කර ප්‍රදේශවලට මාරු කළ අතර නව සමහරුන් සේවයෙන් නෙරපා හැරියා. හැබැයි, ඒ උදවියට උදව් උපකාර කළ, ඔවුන්ගේ මැතිවරණ කටයුතුවල නිරත වුණු රජයේ සේවකයන්ට නම් ඒ දඬුවම් බල පැවේ නැහැ. ඒ සම්බන්ධයෙන් එක උදාහරණයක් පමණක් දක්වන්නම්. මා දන්නා තරමින් ඉදිරි මහා මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයෙන් සොරණාතොට ආසනය තරඟ කරන්නේ බදුල්ල නාගරික කොට්ඨාශයේ ග්‍රාම සේවක ආර්. එම්. අබේකෝන් නමැත්තායි. රාජකාරිය කිරීමට තරම් සෞඛ්‍ය තත්ත්වය හොඳ නැති බවට වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිට පසුගිය 1 වැනි දා සිට ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම ගෙන තිබෙනවා. අග මැතිතුමා ඌව ප්‍රදේශයේ සංචාරය කරන විට ඒ පිළිබඳ සංවිධාන කටයුතු කරන්නේ ඒ මහත්මයායි. එක්සත් ජාතික පක්ෂයට උදව් උපකාර කරන අයට වෙනම ප්‍රතිපත්තියක්. එහෙත් කිසියම් රජයේ සේවකයෙක් විරුද්ධ පාර්ශ්වයේ මැතිවරණ කටයුතුවලට හවුල් වුණොත් මේ රජයේ ඊනියා ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිපත්තිය අනුව ඔහු සේවයෙන් නෙරපා දමනවා; එහෙම නැත්නම් දුෂ්කර ප්‍රදේශයකට මාරු කරනවා. මෙවැනි දෙබිඩි ප්‍රතිපත්තියක් යටතේ මේ රටේ සංවර්ධනයක් ඇති කරන්න, සමගියක් ගොඩ නඟන්න පුළුවන්කමක් තිබෙනවාද ?

කොයි පැත්තෙන් බැලුවත් මේ රජයෙන් කෙරෙන්නේ අකටයුතුකම්. අපේ දරුවන්ගේ අධ්‍යාපනයට පවා අද ලබා තිබෙන කලදසාව අප දන්නවා. ඒ හැම කරුණු නිසාත්, විශේෂයෙන් ජීවන වියදම පහත හෙළීමට කිසිම පියවරක් නොගැනීම නිසාත්, මේ රජයට මගේ අප්‍රසාදය පළ කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

අ. භා. 6.14

**එම්. ඊ. එච්. මොහමඩ් අලි මයා.** (මුතූර් පළමුවන මන්ත්‍රී)

*(ஜனாப் எம். ஈ. எச். முகம்மது அலி—மூதூர் முதல் அங்கத்தவர்)*

(Mr. M. E. H. Mohamed Ali—First Mutur)

*கௌரவ உப சபாநாயகரவர்களே, தேசிய அரசாங்கத்தின் ஐந்தாவது வரவுசெலவுத் திட்ட விவாதம் ஆரம்பமாகி மூன்று தினங்களாக நடந்துகொண்டிருக்கிறது. இந்த வரவுசெலவுத்திட்ட விவாதத்திலே பல கௌரவ அங்கத்தவர்கள் விவாதத்துக்கு அப்பாற்பட்ட பல பிரச்சினைகளைப்பற்றிக் பேசிக்கொண்டு வருவதை நாம் காண்கிறோம். இந்த வரவுசெலவுத் திட்டத்தை, தொடர்ந்து ஐந்து வருட காலங்களாக, நிதி அமைச்சராகப் பதவிவகிக்கின்ற ஒரு திறமையான அமைச்சரவர்கள் இங்கே சமர்ப்பித்திருக்கிறார்கள். இந்த வருட வரவுசெலவுத்திட்டத்தை அவர் சமர்ப்பிக்க முன்பு இந்த நாட்டிலே நாங்கள் ஒருவிதமான பரபரப்பையும் காணவில்லை. ஏனென்றால், இந்த நாட்டிலேயுள்ள மக்கள் இவ்வருட வரவுசெலவுத்திட்டத்தை திருப்தியான முறையிலே எதிர்பார்த்துக் கொண்டிருந்ததினாலேயே அவர்கள் பரபரப்பின்றி, மகிழ்ச்சியுடன் அதை வரவேற்றார்கள் என்பதை நாம் அறிவோம்.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

வரவுசெலவுத்திட்டம் சமர்ப்பிக்கப்படப் போகிறதென்றால், சாதாரணமாக நாட்டிலே பரபரப்பு ஏற்பட்டு வந்திருப்பதை நாம் இதற்கு முன்னர் கண்டுள்ளோம். இந்தமுறை நாம் அவ்விதமான ஒரு காட்சியைக் காண வில்லை. இதன் மூலம் இந்த நாட்டிலே உள்ள மக்கள் தேசிய அரசாங்கத்திலே நம்பிக்கை வைத்திருக்கிறார்களென்பதையும் இந்த அர சாங்கத்துக்கு, அதன் ஐந்துவருட ஆயுட் காலச் சேவையையும் பூர்த்திசெய்ய அவகா சம் கொடுத்திருக்கிறார்களென்பதையும் அவர் கள் நிரூபித்துக்காட்டி விட்டார்கள். என் னைப்பொறுத்த அளவிலே இந்த வரவு செல வுத்திட்டம் மிகவும் நல்ல ஒரு வரவுசெலவுத் திட்டம் என்றுதான் கூறுவேன். நாட்டின் அபிவிருத்தியை மனதில் வைத்து, நாட்டின் வளர்ச்சியை மனதிற் கொண்டு மிகவும் திறமையான வரவுசெலவுத்திட்டத்தைத் தயாரித்தளித்த கௌரவ நிதி அமைச்சரவர் களைப் பாராட்டாமல் இருக்க முடியாது.

சாதாரண மக்களுக்கு இன்று மிக அத்தி யாவசியமாகத் தேவையாகவிருப்பன என்ன வென்றால் உண்பதற்கு உணவு, உடுப்பதற்கு உடை, இருப்பதற்கு வீடு, சீவனம்நடாத் தற்கு ஒரு தொழில் ஆகியனவாகும். இந்த நான்கு அத்தியாவசியமான தேவைகளையும், தேசிய அரசாங்கம் அதன் திறமைமிக்க பிரதமரின் தலைமையிலே மக்களுக்குக் கொடுத்துதவ முயற்சியெடுத்துக்கொண்டு வருகிறது. கௌரவ பிரதம அமைச்சரவர்க ளின் முக்கிய நோக்கமென்னவென்றால், இந்த நாட்டிலே உள்ள மக்கள் அனைவரும் தங்க ளுக்குத் தேவையான பொருட்கள் அனைத்தை யும் தாங்களே உற்பத்தி செய்துகொள்ள வேண்டும்; நாம் அவற்றைப் பிறநாடுகளிலே யிருந்து பெற்றுக்கொள்ள வேண்டிய அவசிய மில்லை என்பதுதான். இந்த அடிப்படையிலே தான் கௌரவ பிரதமர் அவர்கள் நமது நாட்டை எல்லாத்துறைகளிலும் சுபிட்ச மடைய, தன்னிறைவு பெறச் செய்யவேண்டு மென்ற ஒரேயொரு நோக்குடன் பணிசெய்து கொண்டு வருகிறார்கள். அவருடைய அத்திட் டங்கள் அமுலுக்கு வந்துகொண்டிருப்பதை நாம் காண்கிறோம். இன்னும் சில ஆண்டுக ளுக்கிடையில், அவருடைய திட்டங்களனைத் தையும் நாங்கள் நடைமுறையிலே கண்டு களித்து, அவருடைய நல்ல சேவைகளை மறக்க முடியாத அளவுக்கு இந்நாட்டு மக் கள் திருப்தியுறுவார்கள் என்று நான் கருது கிறேன்.

There are these powerful combines who bid at the auctions. I should like to ask hon. Members to visit this wonderful auction room. Let us all go there in a perahera and see what is happening at the auctions. One man says, " Rs. 1.80 ", the other man says, " Rs. 1.90 " and another says, " Rs. 1.95 ". Then these combines think that the price should not be allowed to go up further, and so the last man says " Thank you ". The person who made the highest bid, say Rs. 1.95, gets the lot, and these three rogues share it. This is what happens, Mr. Deputy Speaker, in broad daylight, in an air-conditioned room, under lights and with the whole country awake. We are being robbed.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අන්නාමලෙයි මයා.]

And what are we now thinking of? We have got to borrow. If we cannot put our house in order surely we have to beg, borrow or steal. That is common knowledge and there is nothing wrong in borrowing. If a man robs, he is taken to courts, gets convicted and is sentenced to jail. He cannot help it. Necessity makes him a thief and that is why it is the duty of our Government now to take a bold step.

We are still hesitating to take certain necessary steps. The Hon. Minister of Commerce at least is trying to do an honest job. He is trying to introduce packeted tea for sale. He must be congratulated for that, but at the rate we are going it will take us 100 years before we can get out of our difficulties.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

Go in a *perahera*.

අන්නාමලෙයි මයා.
(திரு. அண்ணாமலே)
(Mr. Annamalay)

If you will join us, all of us can go in a perahera and find a solution to our difficulties.

So, this is your problem and ours. Let us consider this matter in that way. There is no use seeking only to criticize. Let us not criticize for the sake of criticism. If any problem has to be solved and the solution of it will be in the interest of the country, then we must all get together. I told that to the Hon. Minister of Commerce. I told him that we would stand by him in any bold step he wants to take; that the Ceylon Workers' Congress would stand by him; that he should go ahead. I told him that because we cannot bear to see unfair practices being adopted in our own country's auction rooms.

So now we have got to go and beg for foreign aid. To go and beg for foreign aid is not a crime. If it is a crime, the lucky thing is that they cannot take us before a court to be punished. Foreign aid for our country is not a new thing. It is something which any or most developing countries have to have recourse to. It is no crime to get foreign aid.

Foreign aid is obtained in a very regular way. We borrow, we repay. We will repay when we can. We cannot repay when we have no money. We repay only when we get the money. Why get excited about obtaining foreign aid? Those liberal countries are there to help us build our nation. Therefore, why do we not make use of that help?

The chief foreign exchange earner for our country is tea. It is a veritable foreign exchange spinner. It brings us as much as 65 per cent. of the total foreign exchange we earn yearly. The revenue earned by the tea industry is about Rs. 215 million yearly on an average.

And what is happening to this very industry? They are trying to have a post-mortem before death. They are talking about diversification. As a result of this talk, the tea estates are all getting neglected. There is no work whatever done on most of the estates. On the ground that prices have gone down no re-planting of estates is done. They only pluck the green leaf and do a little pruning, and that is all. What does even the weeding contractor do? Nothing very much.

They talk of human capital investment. Those are the high-sounding terms the I. L. O. and others use—human capital investment! And what are we doing? We are simply ruining these human beings. We are spoiling them. Today there are many able-bodied men and women in the plantation districts who are not being made use of, whose services are not utilized.

Today we are encouraged to produce as much of our subsidiary foodstuffs as possible. There is plenty of land available but you are fighting shy of giving that land to the Tamil population in the plantations.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

There is the hon. Member for Welimada (Mr. Samaraweera) who says, "Do not give land to Tamils. I will not allow that." "All the Dravidians must get out". You had better say, "Dravidians, Dravidians" and go begging every day. It is not a shame for you to go and ask for loans from America, the U. K. and other places. But here, of course, you do not want the land to be developed. What I am saying, my dear, is— I am using the word "dear" because you are so close—develop the land, get the services of the masses on the plantations, and having developed the land do anything you like with it. I am all for it. We will take pride in having done some service to Mother Lanka ; we will take pride in shedding our blood for the sake of Mother Lanka. Do not keep us in this position. Do not discriminate against us.

When it comes to land, you say, "I will not give you land." What is the use of your citizenship ? You say "equal opportunities to all citizens". Where is the equal opportunity ? When it comes to education there is no equal opportunity.

I am speaking on behalf of ten lakhs of people, and it is rarely that I get an opportunity to air our grievances. Although I shout so much I know nothing will come of it, but still I must shout for the sake of shouting. Why ? Because our good Friends are still thinking in terms of the 18th and 19th centuries. We are in the 20th century and we are a civilized nation. We must fit into the pattern of events that are taking place in the universe now. Today we have conquered another world, and there are other worlds to be conquered. So we must gain our rightful place and recognition. When the moon wants us we must be able to send our representatives there in time. Therefore we should not keep on quarrelling.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

We will send the Federal Party.

**අන්නාමලෙයි මයා.**
*(திரு. அண்ணாமலே)*
(Mr. Annamalay)

Now that the Federal Party is being mentioned, I think they will give up all those ideas. We must forget differences and work as a nation. We may have differences, but they are like family quarrels. Let us get together and solve them. After all, this is a small country. I think there is goodwill in abundance if only we can sit round a table and discuss matters in a friendly way. Unfortunately, because of the franchise, because of vote-catching methods, we utter things which we normally would not mention.

Consider the sorry plight in which the plantation workers are. Now they have been deprived of their normal employment. They are given only two days' work in the week. Here is the community that produces 65 per cent of the foreign exchange earned annually, and in addition they are responsible for putting Rs. 200 to 250 million into the State coffers annually. In spite of all that, there is nobody to see to their welfare, and the only means by which they could get some redress is by going on strike. We are not for strikes. We do not want strikes. We are not out for strikes. But strikes are forced on us by unscrupulous employers.

Then there is the promise that was given. When the rupee was devalued and we asked for a wage increase, the Hon. Prime Minister came to a settlement with us and he allowed 30 cents per worker per day. When that was done we pointed out to the Hon. Prime Minister that the employers would try to offset it by other unscrupulous methods, one of which, we pointed out, was to reduce the number of working days per worker per week. He said that they could not do it, and he instructed the Minister of Labour to take immediate action if

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අන්නාමලෙයි මයා.]

they did it. But, today what is the position? They are given only two or three days' work in the week, with the result that their earnings are reduced. The weeding contract rate of Rs. 12 to Rs. 15 has been arbitrarily reduced to Rs. 5, and if the worker is not prepared to do the weeding at that rate he is asked to give up the weeding immediately. Today there are all kinds of weedicides being introduced into the estates, and the result is that there is under-employment and unemployment on the estates. We are ready to spend valuable foreign exchange to import these various weedicides for use on the estates, and in the process deprive the very people who help to earn 65 per cent of that foreign exchange of their employment.

What is the position on the estates today? While the number of days the workers are provided with work has been reduced to two or three days a week, the plucking average, which was 23 pounds per worker, has been increased to 35 pounds. There was a time when the pluckers were able to average 45 pounds and earn Rs. 20 to Rs. 30 over and above their normal wages. Of course, whenever they went before a wages board, the employer's argument was that apart from their normal wages they earn something extra in that way. Today they cannot get even 25 pounds under the new plucking scheme.

Under the guise that there is no demand for tea everything on the plantations has been brought to a stand-still. It is my duty to bring to the notice of this House that there is terrible frustration among the plantation workers on the tea estates all over the Island. If this continues there will be a serious situation created in the plantation industry, and if that happens nobody could be blamed—not the workers, not the trade unions—except the employers. The entire responsibility will have to be laid at their door, because they are systematically trying to crush these poor workers by various means such as imposing heavier tasks, reducing their earning capacity, and so on. I say, this cannot go on for ever.

Having dealt with the problems of labour on the tea estates, I shall now pass on to the schemes which the National Government has been good enough to introduce in order to afford relief to the tea industry. First there is the loans system for tea planting. Then, there is the tea subsidy scheme under which the Government gives Rs. 3,750 an acre if the estate is planted with vegetatatively propagated tea.

Under the loans system for planting, the maximum amount allowed per acre is Rs. 2,000, to be paid back in instalments after the lapse of a couple of years. Then there is a scheme of assistance for installing new machinery and building factories. The Government gives one-third the cost of the machinery, and this is not taken back. Then, the Government pays 50 per cent of the interest on the balance, and the repayment of the balance is also spread over 15 years. All this is very good on paper, but in practice what happens ? When a person wants to obtain these loans he finds himself in a sorry plight. The State Mortage Bank gives these loans only on a primary mortgage. How many Ceylonese tea estate owners are there whose estates are not under mortgage already ? Very few or none. I know that recently certain Ceylonese were able to buy up some estates, but there too they had to mortgage the estates to raise the money. The position is the same when you try to obtain a loan for installing new machinery. They want a primary mortgage. This is a sorry state of affairs.

In the booklet "Economic and Social Progress, 1965-69" presented to Parliament by the Minister of Finance, it is stated that under the factory development subsidy scheme, although a sum of Rs. 19 million was set apart for loans, the actual amount utilized by factory owners was Rs. 6 million. So there is still an amount of Rs. 13 million available,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

which however, according to the present conditions laid down in regard to the mortgage of the property no estate owner will be able to get. So, unless some other scheme is devised whereby hire purchase is allowed or the conditions of hypothecation are relaxed or the loan is given on easy terms without much bother, I do not think any of these loans that are available will be made use of by any potential planter who wishes to replant or to improve the quality of tea with new machinery for processing tea. These matters I shall elaborate on at the Committee stage of the Budget.

I do not wish to take up the time of the House. I thank you, Mr. Deputy Speaker, and also the House for the patient hearing given to me and for the extra time.

අ. භා. 7.31

**පර්සි සමරවීර මයා.** (වැලිමඩ)
*(திரு. பேர்சி சமரவீர—வெலிமடை)*
(Mr. Percy Samaraweera—Welimada)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාව ආරම්භ කරන්නට ප්‍රථම මීට කලින් කථා කළ පත් කළ ගරු මන්ත්‍රීතුමාගේ කථාව පිළිබඳව වචනයක් දෙකක් ප්‍රකාශ කළ යුතුයි. එතුමා ද්‍රවිඩ ජනතාව සහ ඉඩම් ගැන කියන විට මා ගැනත් මොනමොනවා දෝ සඳහන් කළා. එතුමා දැන් මෙතැනින් පිට වී යාමට ප්‍රථම මා කියන්නට කැමතියි, එතුමන්ලා ගේ කණ්ඩායම් මගින් දැන් උඩරට ප්‍රදේශයේ අරන් තිබෙන ඉඩකඩම් ප්‍රමාණය හොඳටම ඇති බව. අවුරුදු විස්සක් තිස්සේ බොහොම දුෂ්කර ලෙය ජීවත් වුණ යයි එතුමා සඳහන් කළා. මේ තරම් ඉඩම් අක්කර ප්‍රමාණයක් උඩරට ප්‍රදේශයෙන් එතුමන්ලාගේ කණ්ඩායම් මගින් ලබා ගන්නට ඇත්තේ ඔය අවුරුදු විස්ස ඇතුළතදී වන්නට පුළුවනි. මා සිවිය දීම එම කාරණය මතක් කළ නිසා මින් ඉදිරියට එක අක්කරයක්වත් ඔය උදවියට ලබා ගන්නට ඉඩ තබන්නේ නැත යන්න මෙමඅවස්ථාවේදී මා මතක් කරනවා. මා එය එසේ කීවේ එතුමන්ලාගේ කණ්ඩායම් සමග ඇති අමනාපයකින් නොවෙයි. එහෙත් උඩරට ප්‍රදේශ ගැන ටිකක් ඇස් යොමු කළ විට අපට පේනවා උඩරට ජීවත් වන සිංහල ජනතාවට ඉඩකඩම් නොමැති බව. එතුමා ජාතියක් පිළිබඳව කථා කළා වන්නට පුළුවනි. එහෙත් දැන් උඩරට ජීවත්වන සිංහල ජනතාවට පාරම්පරිකව අත්පත් වී තිබුණු ඉඩකඩම් වලින් පවා බොහොමයක් නැති වී ගොස් තිබෙනවා. දැන් ඒ අය තමන්ගේ අත පය දිග හැර ජීවත් වන්නට බැරි තරමට කරදරයට පත්ව සිටින බව මතක් කරන්නට ඕනෑ. එම නිසා දැන් උඩරට ප්‍රදේශයේ ඉතිරිව තිබෙන රජයට අයත් ඉඩම් ටික ඉතා කල්පනාකාරී ලෙසත් සුපරීක්ෂාකාරී ලෙසත් මහජනතාවට බෙදා දෙන බව මෙම අවස්ථාවේදී ප්‍රකාශ කළ යුතුයි. ඒකයි ඒ අයට ඉඩම් ලැබෙන්නේ නැතැයි මා කියන්නට කල්පනා කළේ. එසේ හෙයින් ඉඩම් ඉල්ලීමෙන් ප්‍රයෝජනයක් වෙන්නේ නැහැ. ඉඩම් කච්චේරි තබා ඒ මාර්ගයෙන් ඉඩම් බෙදා දෙන විට ඉතා පරීක්ෂාකාරී ලෙස දිසාපතිතුමන්ලා එම කටයුතු කරන බව මෙම අවස්ථාවේ දී සඳහන් කරන්නට ඕනෑ. එපමණයි එතුමාගේ කථාව ගැන කියන්නට තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා අද කතා කරන්නට සූදානම් වී නොසිටි නමුත් මෙසේ කතා කරන්නට ඉදිරිපත් වුණේ ඌව පළාතේ මන්ත්‍රීවරුන් දෙපොළක්, එනම්, බණ්ඩාරවෙල ගරු මන්ත්‍රීතුමා (ආර්. එම්. අප්පුහාමි මයා.) සහ සොරනාතොට ගරු මන්ත්‍රීතුමා (විජයරත්න බණ්ඩා මයා.) යන දෙපොළ මීට ටිකකට කලින් මෙම ගරු සභාව ඉදිරියෙහි කථා කළ නිසායි. එසේ හෙයින් මට හිතුණා ඌවේ මන්ත්‍රීවරයකු හැටියට මාත් අදම යමක් කතා කර අයවැය විවාදයට සහභාගි වන්නට සහ මහා දේශපාලන විශාරද ලීලාවෙන් කථා කළ එම දෙපොළගේ කථා වලට පිළිතුරු විශයෙන් යමක් කියන්නට. උඩරට ඌව ප්‍රදේශයේ ගොවිතැන් කටයුතු දියුණු වී නැතැයි එම දෙපොළ විසින් ප්‍රකාශ කළා නම් එය මෙම ගරු සභාව ඉදිරියෙහි කළ ඉතාමත්ම අසත්‍ය ප්‍රකාශයක් වන බව මතක් කළ යුතුයි. අද ඌව ප්‍රදේශයේ වගා කර තිබෙන ඉඩම් ප්‍රමාණය දෙස බැලුව හොත්—වැලිමඩ ආසනයේ පමණක් නොවෙයි, ඌව පළාතේ අනිකුත් සෑම ආසනයකම පවතින තත්ත්වය ගැනයි මා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි සමරවීර මයා.]

සඳහන් කරන්නෙ.—පසුගිය කාලවලට වඩා අක්කර දහස් ගණනක් එම ගොවි ජනතාව විසින් අස්වද්දා තිබෙන බව අපට පෙනී යනවා. ඔය කියන දියුණුව ඇති වුණායයි කීමට මා අදහස් කළේ සාමාන්‍ය යෙන් ගොවි ජනතාව ගොවිතැනින් ලබාගන්නා ආදායම උඩ පමණක් නො වෙයි. මෙතෙක් උඩරට ඌව ප්‍රදේශයේ පුරන් වෙච්ච ගොස් තිබුණු ඉඩකඩම් සියල් ලක්ම වාගේ අද එම ජනතාව වගා කරන වාය යන්න අපට නිර්භයව මෙම සභාව ඉදිරියෙහි ප්‍රකාශ කරන්නට පුළුවනි.

ගරු මුදල් ඇමතිතුමා ඉදිරිපත් කළ, ජාතික ආණ්ඩුවේ පස්වැනි අයවැය ලේඛනය ගැනයි මේ අවස්ථාවේ මේ ගරු සභාවේදී කථා කළ යුත්තේ. එහෙත් මා අසාගෙන සිටි කථාවල් සියල්ලම වාගේ දේශපාලන වේදිකාවකින් කෙරෙන කථාවලට හුරු ස්වරූපයක් ගත් බව මට පෙනී ගියා. ඒ නිසා ඒ කථාවලට තරමක් දුරට නමුත් පිළිතුරු දීම උචිතයයි මා කල්පනා කරනවා. මේ අයවැය ලේඛනය ගැන යමක් ප්‍රකාශ කරන්නට පෙර ඒ කාර්යය ඉටු කිරීමේ බලාපොරොත්තුවෙනුයි මා මේ ආකාරයට මගේ කථාව පටන් ගත්තේ.

සෑම කථාවකින්ම වාගේ කියවුණේ විශේෂයෙන්ම ගොවි ජනතාව ගැනයි. වී වගාවේ නිරත වන ගොවියාට ලැබී තිබෙන සහනය ගැන බොහෝ දෙනා ප්‍රකාශ කළා. වී ගොවිතැන් කරන ගොවියාට වී බුසලකට ගෙවන සහතික මිල රුපියල් දෙකකින් වැඩි කිරීම පමණක් සහනයක් හැටියට ලැබී තිබෙන බව විශේෂයෙන්ම අපට අහන්නට ලැබුණා. සොරණාතොට ගරු මන්ත්‍රීතුමාත්, බණ්ඩාරවෙල ගරු මන්ත්‍රීතුමාත් යන දෙදෙනාම ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ අදහස්වලට මා එකඟ වන්නේ නැහැ. සොරණාතොට ගරු මන්ත්‍රීතුමා කොයි හැටියට කිව්වත් ඇත් තෙන්ම එතුමාත් ගොවියකු හැටියට වැඩ කරනවා නම් එතුමා නියම තත්ත්වය දැනගන්නට ඕනෑ. ඌව ප්‍රදේශයේ වී වගා කරන ගොවීන්ට දැන් ඉස්සර වාගේ රජයේ වී ගබඩා සොයාගෙන යන්නට වුවමනාවක් නැති බව ඒ ගරු මන්ත්‍රීතුමා දැනගන්නට ඕනෑ. වී මිලයට ගන්නවුන්

සොයා යෑමට අද ඌවේ ජනතාවට අවශ්‍ය තාවක් නැහැ. ඇයි මා එසේ කියන්නේ ? වැලිමඩ පමණක් නොව ඌවේ හැම මැතිවරණ කොට්ඨාශයකම අද පවතින තත්ත්වය අනුවයි මා එසේ කියන්නේ. යල් කන්නයට හෝ මාස් කන්නයට හෝ ගොයම කපා පාගා අස්වැන්න බේරා ගැනීමෙන් පසු වැලිමඩ පමණක් නොව ඌවේ හැම ප්‍රදේශයකම ගොවීන්ට තමන් ගේ වී බුසලක් රුපියල් දහසයක් බැගින්. සියේට දහයක් බොල් වීත් එක්කම, කම තේදීම විකුණා ගන්නට පුළුවන්කම සැලසී තිබෙන බව මේ අවස්ථාවේදී සන්තෝෂ යෙන් මතක් කළ යුතුව තිබෙනවා.

සමුපකාර සමිති මගින් දෙනු ලබන ණය මුදල් ලබා ගත් උදවිය තමන්ගේ වී සමුපකාර සමිතිවලට විකුණනවා. ඒ සඳහා ඒ උදවියට රජයේ සහතික මිල ක්‍රමය අනුව මුදල් ලැබෙනවා. හැම දෙනාම රජයෙන් මුදලක් ණයට ලබා ගන්නේ නැහැ. රජයෙන් වී ගොවිතැන සඳහා මුදල් ණයට ලබා නොගන්නා උද විය තමන්ගේ වී ටික මා මුලින් සඳහන් කළ ආකාරයට විකුණන සිරිතක් තිබෙනවා. ඒ අනුව ඒ උදවියට වී බුසල කට රුපියල් දහසය දක්වා මුදලක් ලබා ගන්නට පුළුවන්කම තිබෙනවා. වී බුසලක් විකුණා රු. 16 ක් ලබා ගන්නට පුළුවන් නම් සෑහෙන ආදායමක් ගොවීන්ට ලබා ගන්නට පුළුවන් බව අප කවුරුත් පිළිගන්නට ඕනෑ. ආණ්ඩුවේ වැඩ පිළිවෙල නිසා ගොවියාට තවත් ලොකු සහනයක් ලැබී තිබෙන බව ඒ අනුව මේ අවස්ථාවේ මතක් කරන්නට කැමතියි.

පෝර වෙනුවෙන් වැය කළ යුතු මුදල වැඩි කිරීම සම්බන්ධයෙනුත්, කෘමිනාශක බෙහෙත්වල මිල වැඩි වීම සම්බන්ධ යෙනුත් ප්‍රකාශ කරන්නට යෙදුණා. ඒ සියල්ලම සත්‍ය බව පිළිගන්නා අතර, තමන් නිපදවන වී ටික සෑහෙන මිලකට විකුණා ගන්නට පුළුවන්කම තිබෙන බවත්, පසුගිය කාලයේදී තිබුණාට වඩා ලොකු උනන්දුවකින් දැන් ගොවීන් වැඩ කරන බවත් මතක් කරන්නට ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඊළඟට කවුරුත් පාහේ කථා කළ විෂය යක් වන අල වගා ව්‍යාපාරය ගැනත් වචන යක් දෙකක් කථා කරන්නට ඕනෑ. අය වැය විවාදයට කෙලින්ම මෙය සම්බන්ධ දෙයක් නොවෙතත්, අයවැය විවාදයට ගැලපෙන දෙයක් නොවෙතත්, මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද තර්ක හෙට පත්තරවල පළ වුණාම ඒවා කිය වන පාඨකයනුත්, දැන් මේ කථා අහගෙන ඉන්න ජනතාවත් හිතන්නට පුළුවනි මේ ගැන කී දේවල් සත්‍ය කරුණුය කියලා. ඒ නිසා යමක් නොකියා බැහැ. අර්තාපල් වගාව ගැන කී කරුණු සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයක් දෙන්නට ඕනෑ. හාත්පසින්ම විරුද්ධ කරුණු තමයි ඒ ගැන ඉදිරිපත් කර තිබෙන්නේ.

යල් කන්නයට මේ රටේ සිටුවන ලද අර්තාපල් බීජ අල ගෙන්වා තිබෙන්නේ ඕස්ට්‍රේලියාවෙන් පමණක් බව දෙපාර්ත මේන්තුවේ නිලධාරීන් අපට ප්‍රකාශ කළා. "ජෙනෙරා" නමැති බීජ අල ඕස්ට්‍රේලියා වෙන් ගෙන්නුවා. ඒ බීජ අල ටොන් 3,000 ක් පමණ ගොවි ජනතාව අතර බෙදා දී තිබෙනවා. එහෙත් ඒ බීජ අල පැළ වන්නේ නැතැයි ගොවින්ගෙන් දෙපාර්තමේන්තුවට පැමිණිලි ලැබුණා. ඒ අනුව දෙපාර්තමේන්තුව පරීක්ෂණ පැවැත් වූවා. ඊට පසුව දෙපාර්තමේන්තුව පිළි ගත්තා, ඕස්ට්‍රේලියාවෙන් ගෙන්වූ ඒ බීජ අල වර්ගය වගා කිරීමට තරම් සතුටුදායක තත්ත්වයක නැත කියා.

පසුගිය දවස්වල අගමැතිතුමා උඩුකිඳ ප්‍රදේශයට පැමිණි අවස්ථාවේදී මා එතුමාට තත්ත්වය පැහැදිලි කර පෙන්නා දුන්නා. ඒ අනුව, ඕස්ට්‍රේලියාවෙන් ගෙන්වූ බීජ අල බෙදා දුන් ගොවීන්ට ඒ වෙනුවට මේ රටේම නිපදවූ බීජ අල බෙදා දීමටත්, අර බීජ අල ලබා ගත් සියල්ලන්ටම බෙදා දීමට තරම් මෙරට නිපදවූ බීජ අල ප්‍රමාණය මදි වුණොත් ඉතිරි අයට ඒ වෙනුවෙන් වන්දි මුදලක් ගෙවීමටත් අගමැතිතුමාගේ අනුමැතිය ඇතිව කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමා තීරණය කර තිබෙනවා. එම නිසා මා හිතන්නේ නැහැ, ඒ සිද්ධියෙන් ගොවි ජනතාවට පාඩුවක් වන්නට දෙපාර්තමේන්තුව ඉඩ තැබුවාය කියා. එහෙත් ඒ තත්ත්වය ඇති වන්නට හේතු මොනවාදැයි සොයා බලන්නට ඕනෑ. යල් කන්නයේ අර්තාපල් වගා කරන ගොවීන් පිළිබඳ නියම තත්ත්වය එයයි. එසේ නැතිව කලින් කථා කළ ගරු මන්ත්‍රීවරුන් සඳහන් කළාක් මෙන් ගොවීන් අමාරුවේ වැටුනේ නැති බව මේ අවස්ථාවේදී මතක් කරන්නට කැමතියි. නියම තත්ත්වය මොකක්දැයි ගරු මන්ත්‍රීවරුන්ට දැන් අව බෝධ වන්නට ඇතැයි මා කල්පනා කර නවා. දැනටමත් උඩුකිඳ ප්‍රදේශයේත් ඔය කථා කළ ගරු මන්ත්‍රීවරුන්ගේ ප්‍රදේශ වලත් මෙරට බීජ අල බෙදා හරින බව මා මතක් කරන්නට සතුටුයි. ඒ සම්බන්ධව මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නේ එපමණයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ සාමාන්‍ය ආර්ථික තත්ත්වය ගැන නැත්නම් අද මේ රටට මුහුණ පාන්නට සිද්ධ වී තිබෙන අසතුටුදායක ආර්ථික තත්ත්වය ගැන කල්පනා කර බලන විට අපට එක් කාරණයක් පැහැදිලි වෙනවා. සාමාන්‍යයෙන් අප එදිනෙදා ඉදිරිපත් කරන හේතූන් නිසා නොව ඊට වඩා විශාල, බරපතළ හේතූන් නිසා අද අපට මෙවැනි ආර්ථික තත්ත්වයකට මුහුණ පාන්නට සිද්ධ වී තිබෙන බව මා පෙන්වා දෙන්නට සතුටුයි. මේක අද ඊයේ ඇති වූ නැත්නම් පසුගිය අවුරුදු දෙකක තුනක කාලය ඇතුළත ඇති වූ තත්ත්වයක් නොවෙයි. පසුගිය අවුරුදු පහළොවක විස්සක කාලය අතුළත මීට වඩා සරුසාර, මහජන අවශ්‍යතාවන් සහ ඕනෑ එපාකම් සපුරා ලන කාල සීමාවක් අපට දකින්නට ලැබුණේ නැහැ. ඇත්ත වශයෙන්ම අවුරුදු පහළොවක විස්සක නොවෙයි විසි පහක පමණ කාලයක සිටම මේ රට ඉතාම කණගාටුදායක තත්ත්වයක තිබුණු බව මා මේ අවස්ථාවේදී මතක් කරනවා. එවැනි තත්ත්වයක් මධ්‍යයේ 1956 වර්ෂයේදී මේ රටේ ආණ්ඩු විපර්යාස යක් ඇතිවුණා. දිවංගත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමාගේ නාය කත්වයෙන් මහජන එක්සත් පෙරමුණේ ආණ්ඩුවක් පිහිටුවා ගෙන යම් සැලැස්මක් පදනම් කරගෙන වැඩ කටයුතු කරගෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි සමරවීර මයා.]

යන අවසථාවේදී මේ රට ආර්ථික පරිහානි ය කරා තව තවත් ඉදිරියටම ඇදී යාමට තුඩු දුන් හේතු මොනවාද යන්න ගැනත් අප මේ අවසථාවේදී සොයා බැලිය යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපට වර්ජන ව්‍යාපාර ගැන අසන්නට ලැබෙන්නේ නැහැ. අසුවල් සථානයේ වැඩ වර්ජනයක් තිබෙනවාය කියා පුවතක් අසන්නට ලැබෙන්නේ ඉතාම කලාතුර කින්. එවැනි පුවතක් අසන්නට ලැබුණත් ඒක සුළු දෙයක්. ඉඳ හිට ඔය සුළු වර්ජන යක් ඇති වන්නට පුළුවනි. නමුත් මහ ජන එක්සත් පෙරමුණේ ආණ්ඩුව තිබුණු කාලයේදී මේ රටේ කොයි තරම් වැඩ වර්ජන ඇතිවූවාද යන්න අපට මත කයි. ඒ කාලයේ නිතර නිතර රටේ ඉතාම වැදගත් සථානවල සහ ආයතනවල වැඩ වර්ජන පැනනැංගා. වරාය සංයුක්ත මණ්ඩලයේ වැඩ වර්ජන ගැන අප නිතර නිතර ප්‍රවෘත්ති පත්‍රවලින් කියෙව්වා. වරායේ සේවකයින් වැඩ වර්ජනවල යෙදුණු අවස්ථාවලදී මොන තරම් මේ රටේ ධනය අපතේ ගියාද ? ඒ වැඩ වර්ජන සම ථයකට පත් කිරීම සඳහා රජයට කොපමණ විශාල මුදලක් වියදම් කරන්නට සිදුවුණා ද ? වැඩ වර්ජන පැවති කාලයේ වරායේ නවතා ගෙන සිටි නැව්වලට ඩෙමරේජ් ගාස්තු වශයෙන් මොන තරම් මුදල් සම් භාරයක් ගෙවන්නට සිදුවුණාද ? මේ රටේ යම් යම් දේශපාලන පක්ෂ සහ ඒවායේ නායකයින් පසුගිය කාලය තුළ ඒ ආකාර යේ අදූරදර්ශී වැඩ පිළිවෙළවල් අනුගම නය කළ නිසා, අකටයුතු වැඩ පිළිවෙළවල් අනුගමනය කළ නිසා, අපට මේ තත්ත්ව යට මුහුණ දෙන්නට සිදු වී තිබෙන බව අමතක නොකළ යුතුයි. ඒ අ කාරයට පටන් ගත් මේ පිරිහීම අවුරුදු ගණනා වක් තිස්සේම පැවතුණා. ඊට පසු ඇති වූ ආණ්ඩුවල අවුරුදු හතරහමාරක තිල කාලය තුළ මුදල් අමාත්‍ය ධුරය වරින් වර හතර පස් දෙනෙකුට පැවරුණු බවත් අපට මතකයි. නමුත් අපේ ජාතික රජය 1965 දී මේ රටේ පාලන බලය ලබා ගෙන දැන් පිට පිටම පස් අවුරුද්දක් සඳහා අය වැය ලේඛන ඉදිරිපත් කර තිබෙනවා. මේ මුළු කාලය තුළම මුදල් අමාත්‍ය ධුරය ඉසිලූ අපේ ගරු මුදල් ඇමතිතුමා මේ රටේ ආර්ථික තත්ත්වය දියුණු කරන්නට මා ක්‍රියා කරන්නේ මෙන්න මේ ආකාරයටය කියා පස් වන අවුරුද්දටත් අය වැය ලේඛ නයක් ඉදිරිපත් කර තිබෙනවා.

ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායක තුමනි, යම් කෙනෙක් කියනවා නම් මේ රටේ මේ තත්ත්වය ඇති වීමට තුඩු දුන් හේතු ඇති වූයේ ජාතික ආණ්ඩුව පාලන බලය අල්ලා ගන්නට පසුවයි කියා, එය සත්‍යයෙන් තොර ප්‍රකාශයක්, අපේ පරමාර්ථය විය යුත්තේ මේ ගරු සභාවේදී යම් ප්‍රකාශයක් කරනවා නම්, යම් කාරණා ස්වල්පයක් ඉදිරිපත් කරනවා නම්— කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමාගේ (ඉලංගරත්න මයා.) හිතේ තිබෙන අදහස් අනුව කළ ප්‍රකාශන නොවෙයි—රටේ අභි වෘද්ධිය සඳහා ඒවා ක්‍රියාත්මක කිරීමයි. කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා කතා කරද්දී කීප විටක්ම කියා තිබෙනවා, මේ අයවැය ලේඛනයෙන් ගෙනැවිත් තිබෙන යෝජනා අපට භාර දී යන්න සූදානම් වෙන බුදලයද කියා. ඒ මන්ත්‍රීතුමා හිතනවා ඇති ලබන මැතිවරණයෙන් පසු එහා පැත්තට වී මේවාට මුහුණ දෙන්නේ කොහොමද කියා. "පාන තබන්නත් පෙර දෙයියෝ පැනලා" කියා පරණ කථාවක් තිබෙනවා නේ. මේ විධියට සිහින දැක දැක මේ ඉදිරි පත් වී තිබෙන යෝජනා ගැන දෝෂා රෝපණය කළොත්, දෝෂාරෝපණය කරන්න පටන් ගතහොත්, මොකක්ද සිදු වන්නෙ ? මා සිතනවා යම් කාලයකදී ඒ උදවිය හිතාගෙන සිටිය අදහස් අනුව බැරිවෙලාවත් ඒ අයට ආණ්ඩුවක් පිහිටු වන්න පුළුවන් වුණොත් ඒ පත් වෙන මුදල් ඇමතිවරයාටත් ඒ ආණ්ඩුවටත් මේ තත්ත්වයට මුහුණ දෙන්න සිදු වන බව ඒ උදවිය පිළිගෙන නැතිවා විය හැකියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මැරී ඉපදුන පිරිසක් වශයෙන් නොවෙයි, මේ ගරු සභාවේ කතා කරන්නෙ. අවුරුදු ගණනක් තිස්සේ මේ රට පාලනය කළ උදවිය ගැන, මේ රට පාලනය කළ තත්ත්වය ගැන, මේ රට පාලනය කළ මාගී ගැන අපි සෙවිල්ලෙනුයි සිටියේ. අපි දන් නවා නොයෙකුත් සංසථාවල් ගැන ගරු මන්ත්‍රීවරුන් කතා කළා. සොරණාතොට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු මන්ත්‍රීතුමා (විජයරත්න බණ්ඩා මයා.) උදලු ප්‍රශ්නය ගැන කිව්වා. ජාතික ආණ්ඩුව උදලු නිපදවා තිබෙනවාලු, ගොවි ජනතාව ඒවා ගන්න කැමති නැතිලු. ඒ ගරු මන්ත්‍රීවරයා හරි හැටි දන්නේ නැතිවයි ඒ ප්‍රකාශය කර තිබෙන්නෙ. උදලු තල ලක්ෂ 4 ක් පමණ ඔහතේ සංස්ථාවේ නැන්පත් කර තිබෙනවා. වානේ සංස්ථාව වැඩ භාර ගත් පළමු වැනි අවුරුද්දේ නිපදවූ ඒ උදලු තල විකුණා ගන්න බැරිව අදත් ගබඩා කර තිබෙනවා. ඒවා මහජනයාට ප්‍රයෝජනයට ගත නොහැකි බව සත්‍යයක්. ඒ ගරු මන්ත්‍රීවරයා ප්‍රකාශ කළ කරුණ සත්‍යයක්. නමුත් පළමුවැනි අවුරුද්ද, මේවා සෑදපු අවුරුද්ද, ඒ ආණ්ඩුවට අයත් අවුරුද්දක් බව සොරණතොට ගරු මන්ත්‍රීවරයා පිළිගෙන නැතුවා විය හැකියි. අපි කියන්නේ නැහැ, ඊට වඩා හොඳ උදලු තල නිපදවා තිබෙනවාය කියා. නමුත් එදා ඒ කළ වරදින් සෑහෙන පාඩුවකුත් ඒ වගේම සෑහෙන මුදල් නාස්තියකුත් ඇති වුණ බව පිළිගන්න ඕනෑ.

ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කියන්න වුවමනා කළේ මෙයයි. මේ ගරු සභාවේ දෙපැත්තේ ඉඳගෙන අපි දෙගොල්ල මඩ ගසා ගැනීම නොවෙයි කළ යුත්තෙ. මෙතනට පැමිණෙන දේශපාලනඥයෙක්, මෙතනට පැමිණෙන මහජන සේවකයෙක්, මෙතනට පැමිණෙන ගරු මන්ත්‍රීවරයෙක් හෘද සාක්ෂියට එකඟව සිතනවා නම්, මගේ රට මගේ ජාතිය දියුණු කරන්න ඕනෑය කියා මොකක්ද අප කළ යුතු වන්නෙ ? මෙහිදී මා ඉතා ආඩම්බරයෙන් අනුමත කරනවා ගරු රාජ්‍ය ඇමතිතුමා මේ ගරු සභාවේදී ප්‍රකාශ කළ අදහස. අපේ ජාතියට බලපාන ප්‍රශ්න යම්තාක් තිබෙනවාද, රටට බලපාන වැදගත් ප්‍රශ්න යම්තාක් තිබෙනවාද, ආණ්ඩු පක්ෂය පමණක් නොව, විරුද්ධ පාර්ශ්වයේත් සහාය ඇතිව ඒවා නිරාකරණය කර ගත යුතුය යන්න මේ ගරු සභාවේදී මාත් ප්‍රකාශ කරන්න කැමතියි. අපට දැන් මේ ක්‍රමය ගැන හොඳට පුරුදුයි. මේ ක්‍රමය අනුව වැඩ කර සෑහෙන පළ පුරුද්දක් ඇති දේශපාලනඥයන් මේ රටේ සිටිනවා. ඒ වගේ ම මුළු ආසියාවෙන්ම දක්ෂ ලෙස දේශපාලනය සම්බන්ධව කටයුතු කිරීමට, එහෙම නැත්නම් රටක් වෙනුවෙන් කටයුතු කිරීමට දක්ෂ අය මේ ගරු සභාවේත් ඉන්නවා. මේ රටේත් ඉන්නවා. ආණ්ඩු පක්ෂයේ මෙන් ම විරුද්ධ පාර්ශ්වයේත් ඉන්නවා. මා හිතනවා මේ දෙගොල්ලගේම විශාලතම යුතුකම කල්පනාකාරීව ක්‍රියා කිරීම බව. දේශපාලන පක්ෂ තර කිරීමෙන් කිසි කලෙක මේ රට වැටී තිබෙන ප්‍රපාතයෙන් ගොඩ ගන්නට බැරි බව මා මතක් කරන්න ඕනෑ. ඒ නිසා රටට ඇති ආදරයත් ඇල්මත්, ජාතිය වෙනුවෙන් ඇති කැක්කුමත් විදහාපාන්නට ඕනෑ නම්, වැදගත් ප්‍රශ්න මතු වුණ අවස්ථාවල දීවත් පක්ෂ භේදවලින් තොරව එක්කාසු වී ක්‍රියා කිරීම කාලෝචිත බව මා විසින් සඳහන් කළ යුතුව තිබෙනවා.

මගේ කථාව අවසන් කරන්නට කලින් තවත් වැදගත් කරුණක් කෙරෙහි මේ ගරු සභාවේ අවධානය යොමු කරවන්නට මා බලාපොරොත්තු වෙනවා. පසු ගිය දා කෝට්ටෙ ගරු මන්ත්‍රීවරයා (ස්ටැන්ලි තිලකරත්න මයා.) විසින් කරන ලද ප්‍රකාශයක් මට කියවන්නට ලැබුණා. මා එය මතක් කරන්නේ, ජාතික රජයේ ගරු අගමැතිතුමාට අපහාස වන අන්දමේ නොහොත් නින්දා ගෙන දෙන අන්දමේ යම් කිසි ප්‍රකාශයක් මේ ගරු සභාවේ දී කෝට්ටේ ගරු මන්ත්‍රීවරයා විසින් කරන්නට යෙදී ඇති නිසයි. ගරු අග්‍රාමාත්‍යතුමා විසින් වැලිමඩ මගේ ඡන්දදායක කොට්ඨාශයේ මගේ දේශපාලන වේදිකාවක කළ ප්‍රකාශයක් ගැනයි ඒ මන්ත්‍රීවරයා සඳහන් කර තිබෙන්නෙ.

නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගරු සභාවේ දැනගැනීම පිණිසත්, අන් සියලු දෙනාගේම දැනගැනීම පිණිසත්, එදා ගරු අග්‍රාමාත්‍යතුමා සමග ඒ වේදිකාවේ සිටි මන්ත්‍රීවරයා හැටියට මේ ගැන මා විසින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි සමරවීර මයා.]

කරුණු පැහැදිලි කළ යුතුයි. පසු ගිය රාජ්‍යාසන කථා විවාදය අවසානයේදී ගරු අග්‍රාමාත්‍යතුමා කළ කථාවට මේ ගරු සභාවේ සිටි මන්ත්‍රීවරුන් සවන් දීගෙන සිටින්න ඇති. තමුන්නාන්සේ ඒ අවස්ථාවේදී මෙහි සිටියාද නැද්ද කියා මට නිච්චියක් නැහැ. එදා ගරු අගමැතිතුමා විරුද්ධ පක්ෂයේ නායිකාව ගැන යම් ප්‍රකාශයක් කළා. ඒ ප්‍රකාශය මොකක්ද? ඩී. එම්. කෝ සංවිධානය තහනම් කරන්නෙ කොහොමද කියා මම පෙන්වා දෙන්නම් යයි ගරු විරුද්ධ පක්ෂයේ නායිකාව යම් කිසි රැස්වීමකදී කළ කථාවක් පුවත්පත්වල පළ වී තිබුණා. අන්න ඒ ගැනයි ගරු අග්‍රාමාත්‍යතුමා එදා මේ ගරු සභාවේදී සඳහන් කෙළේ. වැලිමඩ වේදිකාවේ ගරු අග්‍රාමාත්‍යතුමා කළ කථාවේදීත් ඔය ඩිංගමයි සඳහන් කෙළේ. ඉන් පිටස්තර වචනයක් වත් ප්‍රකාශ කෙළේ නැහැ. මේ ගරු සභාවේ කෝට්ටේ ගරු මන්ත්‍රීතුමා ඔය කාරණය ඉදිරිපත් කළ අතර, මට ආරංචියි වැලිමඩදී මේ විධියේ නින්දිත ප්‍රකාශයක් කර තිබෙනවාය, මෙහෙමද රටේ අගමැති කෙනෙක් ක්‍රියා කරන්නේ, කියා මහා ලොකු සිරස්තල ඇතුව ලියා පළ කිරීමට "ඇත්ත" පත්‍ර ආදී පුවත්පත් සූදානම් වී සිටිනවාය කියා.

මේ කීම සම්පූර්ණ මුසාවක් බව මා කියන්න කැමතියි. එවැනි නින්දිත එකම වචනයක්වත් ගරු අග්‍රාමාත්‍යතුමා ප්‍රකාශ කෙළේ නැහැ. මේ ගරු සභාවේදී එදා කී දේමයි එතුමා එදා වැලිමඩ වේදිකාවෙදිත් සඳහන් කෙළේ. අනික් කාරණය, මා කෝට්ටෙ ගරු මන්ත්‍රීවරයාට මතක් කරන්න කැමතියි, "ඇත්ත" පත්‍රය දඩමීමා කරගෙන මේ විධියේ මඩගැසීම් කරන්නට සූදානම් වෙනවා නම්, "ඇත්ත" පත්‍රය ඔය ගරු මන්ත්‍රීතුමා ගැනත් යම් යම් සටහන් ලියු කාලවල නිකුත් වූ පත්‍ර අප ළඟත් තිබෙන බව. අපටත් ඕනෑ නම් පුළුවන් ඒවා ඉදිරිපත් කරන්න. එහෙත් මෙහිදී මට පැහැදිලි කරන්නට වුවමනා කරන්නේ, මගේ ඡන්දදායක කොට්ඨාශයේ මගේ රැස්වීමක ගරු අගමැතිතුමා එවැනි ප්‍රකාශයක් කෙළේ නැති බවයි.

අවසාන වශයෙන් මා කියන්න කැමතියි, සෑහෙන ප්‍රමාණයක සහනාධාර දීම සඳහාත් කාලයක් තිස්සේ මේ රටේ වැඩ කරන ජනතාව විසින් කරන ලද ඉල්ලීම් වලට සවන් දීම සඳහාත්, ගරු මන්ත්‍රීවරුන් සඳහන් කළා වාගේ අනෙක් මහ ජනතාවගේ ඕනෑ එපාකම් අනුව ක්‍රියා කිරීමට පිටරටවලින්ද ආධාර ලබාගෙන ඒ වැඩ කටයුතු සම්පූර්ණ කිරීම සඳහාත්, ඉදිරිපත් කරන ලද අයවැය යෝජනා අනුව මේ රටේ මහජනතාවට නොඅනුමානවම නිසැකයෙන්ම සහනයක් ලැබෙනවාට කිසිම අඩමානයක් නැති බව. එසේම මේ අවුරුද්ද ඇතුළත, මේ මාස කීපය ඇතුළත මෙයින් යම් කිසි පල ප්‍රයෝජනයක් ලැබෙන්නට තිබෙනවා නම් එය ලබාගෙන තවත් හැකි තරම් දුරට රටේ ජනතාව සුඛිත මුදිත වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා.

**එකල්හි වේලාව අ. භා. 8 වූයෙන් කටයුතු අත් සිටුවා විවාදය කල් තබන ලදී.**

**එතැන් සිට විවාදය 1969 අගෝස්තු 15 වන සිකුරාදා පවත්වනු ලැබේ.**

*அப்போது பி. ப. 8 மணியாகிவிடவே சபையின் நடவடிக்கைகள் இடை நிறுத்தப்பட்டு, விவாதம் ஒத்தி வைக்கப்பெற்றது.*

1969 ஓகஸ்ட் 15, வெள்ளிக்கிழமை விவாதம் மீள ஆரம்பமாகும்.

*It being 8 P.M., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Friday, 15th August, 1969.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## කල් තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**යෝජනාව ඉදිරිපත් කරන ලදින් ප්‍රශ්නය සභා භිමුඛ කරන ලදී:**

"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය".—[ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන]

"சபை இப்பொழுது ஒத்திவைக்கப்பெறுமாக" [கௌரவ டீ. பீ. ஆர். குணவர்த்தன]. எனும் பிரேரணை பிரேரிக்கப்பட்டு, வினா எடுத்தியம்பப்பெற்றது.

*Motion made, and Question proposed,*

"That the House do now adjourn".—[*The Hon. D. P. R. Gunawardena*].

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

The Hon. Minister of Education not being here, would the hon. Member for Yatiyantota like to raise the matter, of which he has given notice, tomorrow ?

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

No, Sir, it wil be too late tomorrow. I have to raise it today. That is why I left word with the Minister. At least his Parliamentary Secretary should have been here.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

I have got a message from the Hon. Minister. The hon. Member may ask the question.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

The position is this. Although it was announced that the results of the G. C. E. Examination have been posted, some of the results are not yet out. I do not know the reason. I am not concerned about that. But I am concerned about the plight of the poor students. They have to apply tomorrow to sit again. If they do not apply tomorrow they will not get another chance. They do not know whether they have passed or failed. All this means that you are asking the poor parents to pay an additional fee of Rs. 25 or Rs. 30 for no fault of theirs.

The Minister is busy with the Siyawasa Exhibition. The education officers are busy with the Siyawasa Exhibition. Everybody is busy with the Siyawasa Exhibition. The poor students are the people who are suffering, and in the process some of them are also being made use of.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

They are also busy.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

Of course. The net result is there is no learning, and there is only this Siyawasa. The only thing is, you may have to drink the *wasa* in the end.

Can the Government at least postpone the date of closing of applications ? There is no sacrosanctity about it. Can they not put off the date for a fortnight, that is, until such time as they publish the results, so that the children can apply ? If they can do that at least by Gazette notification that would be a solution. It is most unfair to ask the parents to pocket out Rs. 25 or Rs. 30 more, which is what they have to do, under very difficult circumstances.

They have been waiting and waiting but the results have not been published. They are being given in driblets—arithmetic today, something else tomorrow, and so on. I ask the Hon. Minister of Education to take steps to publish a Gazette notification and to put off the date for another fortnight to enable the students to apply again for those subjects in which they have failed. Please do that. We can discuss all the other things in the Committee stage afterwards.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

The Hon. Minister has sent me a message. He has informed me that he has received the message left by the hon. Member for Yatiyantota, and he wishes me to inform him that he will be taking suitable action.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

So long as that is done I am satisfied.

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

*வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 8.1 ට, 1969 අගෝස්තු 2 වන දින සභා සම්මතිය අනුව, 1969 අගෝස්තු 15 වන සිකුරාදා පූ. භා. 10 වන තෙක් කල් ගියේය.**

*அதன்படி பி. ப. 8.1 க்கு சபை அதனது 1969 ஓகஸ்ட் 2 ஆம் தேதிய தீர்மானத்திற்கிணங்க, 1969 ஓகஸ்ட் 15, வெள்ளிக்கிழமை மு. ப. 10 மணிவரை ஒத்திவைக்கப்பெற்றது.*

*Adjourned accordingly at 8.1 P.M. until 10 A.M. on Friday, 15th August 1969, pursuant to the Resolution of the House of 2nd August 1969.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපැලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදෙර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம். தனிப்பிரதி சதம் 30, தபால் மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்கக் கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions: 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org